# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2019.09.10

වර්ෂ 2019 ක් වූ සැප්තැම්බර් මස 10 වන අඟහරුවාදා දින පෙ.ව. 10.00 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ අඩාලව කල් තැබූ අගෝස්තු මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
05. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
11. ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
12. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
14. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
15. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
16. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
17. ගරු මන්ත්‍රිනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
18. ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
19. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
20. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
21. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**නොපැමිණි.**

01. ගරු මන්ත්‍රිනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය

මීට අමතරව ප්‍රාදේශීය සභා ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

(ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා, ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා, සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අගෝස්තු මාසයේ සභාව අඩාලව කල් තැබුවා. ඒ සභාව, අඩාලව කල් තබන ලද සභාව තමයි අද ආරම්භ වන්නේ. සභාව අඩාලව කල් තැබුවේ ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමාගේ යෝජනා වලින්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මට අවස්ථාවක් ලබා දෙන්න. ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. අද ගරු සභාවට පැමිණි සියලුම දෙනාගෙන්ම අවසර පතනවා. ඒ වගේම තොටගොඩ, කුරුන්ද කන්ද ප්‍රදේශයේ මේ වෙන කොට ඉතා දුක්ඛිත විදියට, ඉතාම අවාසනාවන්ත විදියට කසිප්පු ජාවාරම පැතිර තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, උප සභාපතිතුමා අද න්‍යාය පත්‍රය පමණයි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මහජන නියෝජිතයෙක් විදියට මන්ත්‍රීවරු කිසි කෙනෙක් මේකට විරුද්ධ වෙන එකක් නෑ. මොකද සභාපතිද, මහජන නියෝජිතයා කවුද, පක්ෂය මොකක්ද කියන එක අදාළ නෑ. මහජන නියෝජිතවරයෙකුට පළාතේ අපරාධකරුවෝ, කසිප්පුකාරයෝ, ගංජාකාරයෝ, කුඩුකාරයෝ මරණ තර්ජනය කරන කොට ඒකට පක්ෂයක්, පාටක් මොකක්වත් නැතුව අපි සභාවක් හැටියට එක තැනක ඉඳගෙන තීන්දු ගන්න ඕන. ඒ හින්දා මට වෙච්ච අසාධාරණය, ඒ නින්දිත ක්‍රියාව ගැන කසිප්පුකාරයොන්ගෙන්, මේ සභාවේ ආරම්භයේදී අදහසක් දක්වන්න ඕන. න්‍යාය පත්‍රයට ප්‍රමුඛතාවය දිය යුතුයි. ඒක මම පිළිගන්නවා. ඇයි ගරු සභාපතිතුමනි ඔබතුමා ඒක හැල්ලුවට පත් කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් හැල්ලුවට ලක් කලා නෙමෙයි. පොඩ්ඩක් ඉන්න කියන්න. උප සභාපතිතුමා ඔබතුමා මේක අහන්නකෝ. මේක දිගින් දිගට කඩාකප්පල් කරේ, මේක අඩාල වුනේ න්‍යාය පත්‍රයට පිටින් ගියපු හින්දා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එක මන්ත්‍රීවරයෙක් විරුද්ධද, මගේ අදහස් දැක්වීමට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි ඔච්චරයි. ඔය කාරණාව විතරයි. න්‍යාය පත්‍රයට පිටින් ඔය කාරණාව විතරයි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි වෙන කාරණයක් නෙමෙයි. මහජන නියෝජිතවරයෙකුට වෙච්ච අසාධාරණයක් මේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්නම්. පොලීසියට ලියුමක් දාන්න සභාව විදියට වහාම මේ පිළිබඳ පරීක්ෂණයක් කරන්න කියලා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමනි, ඒක නෙමෙයි විය යුත්තේ. මහජන නියෝජිතවරයෙක් වෙනුවෙන් සභාපතිවරයා හැටියට වහාම ක්‍රියාත්මක වෙන්න ඕන. ඇයි මන්ත්‍රීවරයාට මේ දේ වුණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද මම කරන්න ඕන.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා මේ අදාළ ප්‍රදේශයේ මුල් පුරවැසියා. මහජන නියෝජිතවරයෙකුට මෙහෙම වෙන්න විදියක් නෑ. පොලීසියට කියලා පැය 24 ක් ඇතුළත අත්අඩංගුවට ගන්න පුළුවන් වෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඔබතුමන්ලාගේ ගෙදරට දෙපාරක් ආවානේ. ඔබතුමා කිව්වා ගැහුවේ නෑ. මුකුත් නෑ ප්‍රශ්නයක් නෑ කියලා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගැහුවේ නෑ කියන එක නෙමෙයි ප්‍රශ්නේ. මම කිව්වේ මට තර්ජනය කරා. මගේ වාහනය වට කරලා කැති පොලු අරගෙන ආවා කියලා. මම ඔබතුමාට කියන්නද පොලීසියට යන්න, වහාම අත්අඩංගුවට ගන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඇවිත් කතා කරේ නැද්ද?. ඔබතුමා කිව්වා ඕන නෑ. මම ඔක්කොම අතඇරලා කියලා. ඔය වෙනුවෙන් පෙනී ඉන්න කවුරුවත් නෑ කියලා. මට කිසි දෙයක් වෙන්න ඕන නෑ කිව්වා. ගෙදරට ගිහිල්ලා මම ඇහුවේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒ සිද්ධිය කියන කොට ඔබතුමා සභාපතිවරයා හැටියට මගේ අදහස් ප්‍රකාශ කරන්න දෙන්නේ නෑ. ඔබතුමා මැදින් පනිනවා. මම හිතාගෙන ආපු අදහස් ඔක්කොම පැත්තකට යනවා. අපිත් ඔලුවේ ඔක්කොම ප්‍රශ්න තියාගෙන කතා

කරන්නේ. එතකොට ඔබතුමා හරස්කැලි දැම්මම අපිට කියන්න බැරි වෙනවා. ඔබතුමා පැහැදිලිව ඉන්න සභාපතිතුමා. ඒකනේ වැදගත්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි මෙහෙමයි උප සභාපතිතුමා. මම අද ආවේ පළාත් පාලන ආයතනයෙන් උපදෙස් අරගෙන. පළාත් පාලන ආයතනයෙන් මට දුන්න උපදෙස් තමයි මට විරුද්ධව හැම තැනම යනවා, ආණ්ඩුකාරතුමා ගාවට යනවා, න්‍යාය පත්‍රයට පිටින් වචනයක් කියන්න දෙන්න එපැයි කිවුවා. න්‍යාය පත්‍රයේ කාගේ හරි යෝජනාවක් තියේ නම් ඒ යෝජනාව පිළිබඳ අදහස් දැක්වීමක් විතරයි කරන්න පුළුවන්. මොකද මේක අඩාලව කල් තියපු සභාවක්. ඔබතුමාට පුළුවන් ඊළඟ සභාවේදී ඕනනම් මේක අපි සභා වාර්තාවට දාලා මන්ත්‍රීවරයෙක්ට වෙච්ච ප්‍රශ්නයක් කියලා කියන්න.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම නිහඬ වෙනවා. හැබැයි ගරු සභාපතිතුමනි, බොහොම කණගාටුදායකයි ඔබතුමා හැසිරෙන විදිය ගැන. මහජන නියෝජිතයෙක්ට මාර්ගයේ යනකොට ගමේ කසිප්පුකාරයෝ, කුඩුකාරයෝ, ගංජාකාරයෝ තර්ජනය කරන කොට ඒ ගැන කතා කරන්න ගරු සභාවේ විනාඩියක් දෙන්නේ නැත්නම් න්‍යාය පත්‍රයට පිටින්, න්‍යාය පත්‍රයට කටයුතු කරන්නේ අපි. අපි ඒක නෑ කියන්නේ නෑ. මේ සිදුවීම අහඹු සිදුවීමක්. ඔබතුමා මේකට අවස්ථාවක් දෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි මෙහෙමයි, අවස්ථාව දෙන්නම්. කියන එක තේරුම් ගන්න උප සභාපතිතුමා. දැන් මේ අවස්ථාව ඔබතුමාට දෙන්නම් අනිත් අයගේ එකඟතාවයෙන්. නමුත් ඉදිරි ටික යන්න ඕන න්‍යායපත්‍රානුකූලව. ඊළඟට තව කෙනෙක් කියයි ඇයි උප සභාපතිතුමාට දුන්නනම් අපිට දෙන්න බැරි කියලා. තේරෙනවාද?.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම පොඩි අදහසක් දක්වන්නම් විපක්ෂය හැටියට අපේ අදහසත් දැක්විය යුතුයි. ගරු උප සභාපතිතුමාට වුණ සිද්ධිය අපි හෙළා දකිනවා. ඒ මන්ත්‍රීවරයාට සිද්ධිය සම්බන්ධයෙන් මම හිතන්නේ ඒ ගොල්ලෝ පහරදීමක් සිදු කරලා තිබුණා. මම ඊයේ සම්බන්ධීකරණ කමිටුවේදී ඒ ගැන ප්‍රකාශ කරා. අපේ උප සභාපතිතුමාට පහරදීම සම්බන්ධයෙන්. ඒ වගේම මත්ද්‍රව්‍ය ගැන ඊයේ සම්බන්ධීකරණ කමිටුවේදී දිගින් දිගට කතා කළා. මට හිතෙන්නේ අපි මහජන නියෝජිතයෝ වශයෙන් අපේ කෙනෙක්, විශේෂයෙන් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ උප සභාපතිතුමා අපහසුතාවයට පත් වුණා ඒ සිද්ධියෙන්. අපි විපක්ෂය වශයෙන් අපේ කණගාටුව මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා මේක කියන්නකෝ. ගිය සම්බන්ධීකරණ කමිටුවේ ඔබතුමත් එක්ක මම නම් වශයෙන් ඒ අය ගැන සඳහන් කරේ නැද්ද?. නම් වශයෙන් ඒ ඉන්න කසිප්පුකාරයෝ ටික සඳහන් කරලා කිවුවේ නැද්ද?. දැන් ඔබතුමාට යන්න පුළුවන් සම්බන්ධීකරණ කමිටුවට. ඔබතුමා තමයි අපේ පක්ෂය වෙනුවෙන් නම් කරලා තියෙන්නේ සම්බන්ධීකරණ කමිටුවට. ඔබතුමාට ඊයේ සම්බන්ධීකරණ කමිටුවට ගිහිල්ලා පොලීසිය ඉන්න වෙලාවේ මේ ප්‍රකාශය කරන්න තිබුණානේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මට පඩිපෙළේ යන්න අමාරුයි. එතන පඩිපෙළවල් කීපයක් තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම සභාපතිවරයා විදියට පක්ෂය වෙනුවෙන් නම් කරලා තියෙන්නේ ඔබතුමාව සම්බන්ධීකරණ කමිටුවට. මම සභාපතිවරයා විදියට මෙතුමාට වෙච්ච සිද්ධිය හැල්ලුවට ලක් කරා නෙමෙයි. වැරදි මතයක් යාවී. මම මේ සිද්ධිය ආරංචි වෙච්ච වෙලාවේදීම රාත්‍රියේ මෙතුමාට දුරකථනයෙන් දැනුම් දුන්නා. මෙතුමා නිදාගෙන හිටියේ. මෙතුමාගේ භාර්යාව තමයි කතා කරේ. ඊට පස්සේ දවසේ මෙතුමාත් එක්ක ගෙදරට ගිහිල්ලා කතා කරා. මෙතුමා බොහොම කලකිරීමෙන් හිටියේ. මම එවෙලේම පොලීසියට යන්න හැදුවා. නෑ යන්න ඕන නෑ කිවුවා. වැඩක් නෑ සභාපතිතුමා අපි මිනිස්සු වෙනුවෙන් පෙනී ඉන්න හැදුවට අපි වෙනුවෙන් එකෙක්වත් නෑ කිවුවා. ඊට පස්සේ වචනයක් කතා කරන්නේ නෑ කිවුවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මෙතන මේ සභාව ආරම්භ කරේ පසුගිය 29 දින අඩාලව කල් තියපු සභාව කරන්න. පළවෙනි කාරණය ගිය මාසේ සභාව ඇත්තටම කණගාටුදායකයි කල් තබපු විදිය පිළිබඳ. දිගින් දිගට මේක අසාර්ථක වෙච්ච දේ පිළිබඳව අපි ඔබතුමාට කරුණු කාරණා පැහැදිලි කරා. මේ වෙලාවේ අපි පටන් ගන්නේ මෙතුමාගේ යෝජනා වලින්. එතනින් තමයි අවසන් කරේ. හැබැයි මේ විශේෂ තත්ත්වය යටතේ මෙතුමා පෞද්ගලිකව මුහුණ දීපු අසාධාරණයක්, ඒක අගෞරවයක්. ඒක සභාවට අගෞරවයක්. සභාවේ මහජන

නියෝජිතවරයෙකුට රටේ ඉන්න අපරාධකාරයෝ, දාමරිකයෝ එහෙම එරෙහිව පහර දෙනවා නම් හිංසා පීඩා කරනවා නම් සාමාන්‍ය ජනතාවගේ තත්ත්වය ගැන අපි ඊට වැඩිය සැලකිල්ලට ලක් කරන්න ඕන. මොකද මේ සභාවේ ඒ කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රීවරයා මේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට සභාවක් විදියට කරන්න ඉඳපු දේ මම කියන්නම්. ඔබතුමාලා ඔක්කොම ගිහිල්ලා මොකක්ද කිවුවේ ආණ්ඩුකාරතුමා ළඟ. සභාව පිළිවෙලක් නෑ. මේක යන්න විදියක් නෑ. මේක සභාවක් නෙමෙයි. මම හැදුවේ ඊළඟ සභාවේ න්‍යාය පත්‍රයට දාලා මම පොලීසියේ ස්ථානාධිපතිතුමාට ඉල්ලීමක් කරන්න මේ පිළිබඳව ක්‍රියාමාර්ග ගන්න කියලා. මේ සභාවට ඒක දාන්න විදියක් නෑ. මේ සභාව කලින් න්‍යාය පත්‍රයට වැඩ කරන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගිය සභාවට දාන්න විදියක් නෑ ඔබතුමාට. එහෙම ඉන්න බෑ හදිසි තත්ත්වයක් යටතේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාලා මොකක්ද මේ කියන්නේ කියලා මට තේරෙන්නේ නෑ. ඇත්තටම න්‍යාය පත්‍රයට තමයි යන්න ඕන. ඒක තේරුම් ගන්න බැරිද?. මේක යන අතරේ වෙනම විශේෂ තැනක් ඉල්ලලා කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක තමයි මෙතුමාගේ යෝජනාවකින් ආවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ස්ථානාධිපතිතුමාට ලිපියක් යවන්නම් මේ පිළිබඳ විධිමත් පරීක්ෂණයක් කරන්න කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අශ්වයා ගියාට පස්සේ ඉස්තාලය වහලා දානවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් ඒකත් එපාද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අද ඒක ක්‍රියාත්මක කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හෙට ජේ.සී.බී එක දෙන්නම්. එන්න හදන්නේ බොර දියේ මාලු බාන්න. එහෙම එපා මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමාට හරි පැහැදිලිව ගිය සභාවේදී අපි කිවුවා මේ සභාවේ ගරුත්වය රැකෙන විදියට ඔබතුමා න්‍යාය පත්‍රයට අනුව කටයුතු කළ යුතුයි කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අන්න හරි. න්‍යාය පත්‍රයට අනුව කටයුතු කරමු. ඒක තමයි හැදුවේ. උප සභාපතිතුමා ඔබතුමා එදා හිටියේ නැනේ. මෙතුමා ආණ්ඩුකාරතුමා ඉදිරියේ කිවුවේ මේ සභාව කිසි ක්‍රමයක් නෑ. න්‍යාය පත්‍රයට යන්නේ නෑ. ඇත්තටම ඔබතුමාලානේ ඒවා කඩ කරන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එතුමා කිවුවේ, එතුමාට ඒ වුණ අතවරය, ඒ ගැටළුව ඒක හදිසි කාරණයක්. එතුමා හිතා මතා සංවිධානාත්මකව කරපු දෙයක් නෙමෙයි. එතුමා බලාපොරොත්තු වුණ දේකුත් නෙමෙයිනේ. මේ අවස්ථාවේ විශේෂ අවස්ථාවක් දෙන්න ඕන. හරිනම් විශේෂ සභාවක් එන්න ඕන. සභාවේ මන්ත්‍රීවරයෙක්, මහජන නියෝජිතයෝ විසි දෙදෙනාගෙන් එක්කෙනෙක් මේ. දේශපාලන වෙනස්කම් අපිට තියෙන්න පුළුවන්. නමුත් මන්ත්‍රීවරයෙක්ගේ ආත්මගෞරවය කියන එක අපි කාටත් පොදුයි. කලිනුත් කිවුවා, මේ සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ගේ ආත්මගරුත්වය, මන්ත්‍රීවරයාගේ ගෞරවය සම්බන්ධයෙන් ඔබතුමා මීට වැඩිය සැලකිලිමත් වෙන්න. මෙහෙට ඇවිල්ලා ඉන්නේ ජනතා නියෝජිතයෝ. ඒ නිසා මේ හැමෝටම යම් වගකීමක් තියෙනවා. ගෞරවයක් තියෙනවා. ඒක රැකෙන විදියට සභාව කරගෙන යන්න. මම කියන්න ගත්තේ මෙතුමා සභාව පටන් ගන්න මොහොතේ විශේෂ අවසරයක් ඉල්ලලා නැගී සිටියා. එතකොට ඔබතුමාගේ හැසිරීම බලන්නකෝ. ඔහොම කඩා පනින එක වැරදියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කවුද කඩා පැන්නේ. කවුද මෙතුමා වෙනුවෙන් ගියේ. ඔය සිද්ධිය කතා කරන්නේ කවුද?. මෙතුමා වෙනුවෙන් පෙනී සිටියේ කවුද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි ගියා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම ගිහිල්ලා තියෙනවා. මම ගිහිල්ලා කතා කරලා තියෙනවා. මොකද මටත් ඔය වගේ දෙයක් මේ කොට්ඨාශය තුළ සිද්ධ වෙලා තියෙන නිසා මම ගිහිල්ලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් කරන්න තිබුණේ ඇවිල්ලා අපිට සාකච්ඡා කරලා කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඔබතුමාට සභාපති බලය තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද මට කරන්න පුළුවන් කියන්නකෝ. පොලීසියට කතා කරේ නැද්ද මම. පොලිස් ස්ථානාධිපතිතුමාට කතා කරේ නැද්ද?. මොනවද කරන්න පුළුවන්. මේ මන්ත්‍රීතුමා, දැන් අවුරුදු විස්සක් තිස්සේ ඔබතුමන්ලාගේ ගිය ආණ්ඩුවේ, සියලු ආණ්ඩුවල කසිප්පු පෙරපුවා. මට කියන්නේ සභාපති විදියට ගිහින් නවත්වන්න කියලද?. මට මේ සභාපති විදියට නවත්වන්නද කියන්නේ. මට මොකක්ද තියෙන බලය. උදුල මන්ත්‍රීතුමා අපි සම්බන්ධීකරණ කමිටු කීයක නම් කරලා කතා කරාද?. ඔය අදාළ පුද්ගලයොන්ගේ නම් කියලා කිවුවේ. ඔතන ඉන්නේ පුද්ගලයෝ තුන් දෙනෙයිනේ ඇත්ත කතාව. ඒ නම් කියලා අපි කතා කරේ නැද්ද?. කොච්චර බලපෑම් කරලා, සුරාබදු එකට නම් වශයෙන් කියලා ක්‍රියාමාර්ග ගන්නේ නැති වුණාම මට පුළුවන්ද පොලීසියේ නීතිය ක්‍රියාත්මක කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමාට පොලිස් බලතල ගන්න කියනවා නෙමෙයි. ඔබතුමාට පුළුවන් ඔබතුමාගේ බලය පාවිච්චි කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද මගේ බලය. මට තියෙන බලය කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමානේ මේ ප්‍රාදේශීය සභාවේ, මේ බලයලත් ආයතනයේ ප්‍රධානියා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද කරන්න පුළුවන් කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පනත අනුව බලය තියෙනවා මහජන පීඩාවක් වෙනවානම් අදාළ ආයතනවලට බල කිරීමක් කරලා ඒ ආයතනය යොදවන්න. මතක් කරන්න පුළුවන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මතක් කිරීම මන්ත්‍රීතුමා මම දිගටම කරනවා. විශේෂයෙන්ම අක්මීමණ පොලීසියට මේ සම්බන්ධ කාරණා නිතරම මතක් කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පොලීසියේ කාර්යය කරන්නේ නැත්නම් එස්.පී මහත්තයාට, ඩී.අයි.ජී මහත්තයාට කියන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං සම්බන්ධීකරණ කමිටුවේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකතුමා තමයි සභාපති. එතුමා නම් කරලා කිවුවා පොලිස් ස්ථානාධිපතිතුමාට මේ වැඩේ කරන්න කියලා. එතුමා වර්තමාන ආණ්ඩුවේ නායකයෙක්. සම්බන්ධීකරණ කමිටුවේ සභාපති. එතුමාට බැරිනම් කොහොමද කරන්නේ. එහෙමනම් උද්ඝෝෂණයක් කරමු. හරි එන්න උද්ඝෝෂණයක් කරමු අපි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** කිසිම ප්‍රශ්නයක් නෑ. අසාධාරණයක් වෙලා තියෙන නිසා. මෙවැනි දාමරිකයන්ගෙන්, අපරාධකාරයන්ගෙන් පීඩාවක් වෙනවා නම් මන්ත්‍රීවරයෙක් වෙන්න ඕන නෑ. අපිට පුළුවන් වෙන්න ඕන කතා කරන්න. මෙතන ඉන්න සහෝදර මන්ත්‍රීවරයෙකුට, සභිකයෙකුට දෙයක් වුණාම ඊට වැඩිය අපිට දැනෙන්න ඕන. අපිට පාරේ බැහලා යන්න බැරි වෙනවානේ මෙහෙම. මේක දාමරිකයන්ට, මැරයන්ට ඕන විදියට හැසිරෙන්න බෑ. ඔබතුමා හිතන්නකෝ මේ සිද්ධියට මුහුණ දුන්නේ ඔබතුමා නම්, ඔබතුමාට තියෙන තත්ත්වය මොකක්ද?. අපි කාටත් වෙන්න පුළුවන් ඒ දේ.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මෙතුමා ඒක කියලා බලාපොරොත්තු වුණේ මොකක්ද කියලාවත් අපි දන්නේ නෑ. අහගන්න වුණේ නෑ නේ. මොකක් හරි අදහසක් කියන්නනේ ගියේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං හරි. කියන්න මොකක්ද කරන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක තමයි කිවුවේ. පැහැදිලි කරේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඒ පිළිබඳව මගේ හිතේ තියෙන්නේ කණගාටුවක්. ඒ කාරණා කතා කරන්න, න්‍යාය පත්‍රයට අනුව යන්න ඕන තමයි සභාව. ඒක අපි නෑ කියන්නේ නෑ. මේක අහඹු සිදුවීමක්. ගරු මන්ත්‍රීවරු විශාල ප්‍රමාණයක් අපේ ගෙදරට ආවා. ඒ ප්‍රශ්නය ගැන කතා කරා. නමුත් මම සභාපතිවරයා නම් මන්ත්‍රීවරයෙකුට මොකක්ද වුන අසාධාරණය වහාම පැය විසිහතරක් ඇතුළත ඇනලා කුදලාගෙන යන්න කියනවා ඕන අපරාධකාරයෙක්ව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එකින් එකට උත්තර දෙන්නද?. ඔබතුමා කියපු එකට මම උත්තර දෙන්නම්කෝ. මම කතා කරා පොලිස් ස්ථානාධිපතිට. මම මෙතුමාට ඉස්සෙල්ලා කතා කරා. මම කිවුවා පැමිණිල්ලක් දාන්න උප සභාපතිතුමා කියලා. වෙච්ච දේ මම කියන්නේ. පැමිණිල්ලක් දාන්න කිවුවා. මෙතුමා කිවුවා පැමිණිල්ලක් දාන්න බෑ කියලා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඔබතුමා මට කිවුවද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගෙදර ඇවිල්ලා කිවුවේ. කියලා මම නිකං හිටියද?. මම මෙතුමාගේ ගෙදර ගිහින් කිවුවා පැමිණිල්ලක් දාන්න කියලා. මෙතුමා කිවුවේ ඕන නෑ සභාපතිතුමා වැඩක් නෑ කියලා. මම මිනිස්සු වෙනුවෙන් කටයුතු කළේ මාව වටකරපු වෙලාවේ කිසි කෙනෙක් හිටියේ නෑ කියලා. සභාපතිතුමා මම මෙතනින් එහාට මේ සම්බන්ධව වචනයක් කතා කරන්නේ නෑ කිවුවා. මට කසිප්පු පෙරුවත් එකයි, නැතත් එකයි. කටයුතු කරන්නේ නෑ කිවුවා. ඊට පස්සේ මම ගෙදර ඇවිල්ලා පොලිස් ස්ථානාධිපතිතුමාට කෝල් එකක් ගත්තා. කීපපාරක් ගත්තා ෆෝන් එක ඉස්සුවේ නෑ. අන්තිමට ඉස්සුවා. මම කිවුවා පොලිස් ස්ථානාධිපතිතුමාට. දැන් හැන්ඩ් ෆ්‍රී ඔන් කරලා අහන්නම්. මම කතා කරලා කිවුවා පොලිස් ස්ථානාධිපතිතුමාට මේකට ක්‍රියාමාර්ගයක් ගන්න කියලා. එතකොට කිවුවා මෙතුමාට පැමිණිල්ලක් දාන්න කියලා. මේ හැමෝම කියන්නකෝ පැමිණිල්ලක් නැතුව පොලීසිය ක්‍රියාත්මක වෙනවාද?.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඔබතුමා ඒ දේ කිවුවා හරි. මම පැමිණිල්ලක් දැම්මෙත් නෑ. නමුත් සභාවක් විදියට මහජන නියෝජිතවරයෙකුට ඒ වගේ දේවල් සිද්ධ වෙද්දී, හෙට දවසේ තවත් කෙනෙකුට ඒ වගේ දේවල් සිද්ධ වෙන්න පුළුවන්. මම කියන්නේ සභාපතිවරයා හැටියට අදාළ මන්ත්‍රීවරයා කියන්න ඕනත් නෑ. ඒ මන්ත්‍රීවරයාට අවමානයක්, අපහාසයක් සිද්ධ වෙලා තියෙනවානම් මම සභාපතිනම් ආයේ එතන කසිප්පු විකුණන්න දෙන්නෙත් නෑ. දිගටම වැටලීම් කරනවා. සභාවක් හැටියට ගිහිල්ලා දිගටම වැටලීම් කරනවා. දින දෙනවා. මම කසිප්පු තිප්පොල අදාළ දිනය වෙනකොට වහන්න ඕන කියලා. නැත්නම් මම කරන්න ඕන දේ කරනවා. එහෙම වෙන්න ඕන. මොකද මුන්ට නටන්න දෙන්න බෑ. නීතියක් තියෙනවා රටේ. මුන් කුඩු විකුණන්නේ, කසිප්පු විකුණන්නේ, ගංජා විකුණන්නේ ගමේ මිනිස්සු බයට පත් කරගෙන. මම බය නෑ. මම ඔය ආපු කසිප්පුකාරයෝ ආයේ යවන්නේ නෑ මගේ කකුල හයිය තිබුණා නම්. මම හොඳට හත් අට දෙනෙක් එක්ක හැප්පෙන්න පුළුවන් මිනිහෙක්. උන් දම්මලා මගේ වාහනයට පොලු පාරවල් ගහන්න ලෑස්ති වුණේ උන්ගේ තියෙන නිවටකමට. මේවාට සභාවක් හැටියට කොන්ද කෙලින් තියාගෙන තීන්දු දෙන්න ඕන. අද වැටලීම් කරලා නැත්නම් හෙට ආයේ ගන්න ඕන පොලීසියට. අරන් අහන්න ස්ථානාධිපතිතුමා, මම ඇවිත් අල්ලන්නද, ඔබතුමා එන්න මාත් එක්ක. හවසට සභාපතිතුමා ධාතු වඩම්මලා වගේ කුරුන්ද කන්දට. පෝලිමේ යනවා. පෝද්දල චමින්ද මන්ත්‍රීතුමා මට කතා කරා සිද්ධිය වෙලා විනාඩි දහයක් යන කොට. කසිප්පුකාරයා පෝද්දල විනාඩි 10 ක් යන්න වුණේ නෑ. එහෙම වෙන්න බෑ. සභාවක් විදියට මිනිස්සුන්ගේ ලොකු බලාපොරොත්තු තියෙනවා. පාරවල් හදන්න, ලයිට් දාන්න නෙමෙයි බලාපොරොත්තු වෙන්නේ. ගම්වල මිනිස්සුන්ගේ දරුවන්ට පන්ති ඇරිලා නිදහසේ යන්න විදියක් නෑ. පහ හමාර හය වෙන කොට තොටගොඩ මදනායක මාවත, කුරුන්ද කන්ද එහෙන් පිටින්ම කසිප්පු පාරාදීසයක් වෙලා. ඒකට කතා කරා කියලා මට තර්ජනය කළා. තව කට්ටියක් ඒකට සම්බන්ධ වුණා. කුරුන්ද කන්දේ සොහොන් පිටිය මැදින් පාරක් තිබුණා ෆිනෑන්ස් ඉඩමේ. ඒක සම්බන්ධ කරා කුරුන්ද කන්දට. තාවකාලිකව බඩු ටිකක් ඇදගන්න කැපුවට කමක් නෑ. අපේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ දේපලක්නේ. පාර කපලා ඒක කසිප්පුකාරයන්ගේ ගමන් බිමන් යන පාරක් වුණා. ඒක වහන්න කියලා සභාවට මම කීප වතාවක් කිවුවා. කරුණාකරලා ඒ පාර වහන්න සභාපතිතුමා. තාම මේ පාර වහන්න බැරි වුණා. තව වෙනතුරු වහන්න බැරිවුණා. මොකටද අපි. ඒ හින්දා මේවා මෙහෙම වෙනවානම් අපි මේ සභාවේ සිටිය යුතු නැහැයි කියලා තමයි මට කියන්න තියෙන්නේ. මොකද ඒක ගිංතොට වේවා, මහ හපුගල වේවා, කපුහෙම්පල වේවා, පෝද්දල වේවා වසම මොකක්ද කියන එක අදාළ නෑ. සභාවක් හැටියට මහජන නියෝජිතවරයෙකුට සිදුවුණ අසාධාරණයක් ගැන කියන්නේ. ගමේ කසිප්පුකාරයෙක්ට විරුද්ධව කතා කරාම මහජන නියෝජිතයා යන වාහනය වට කරනවා. අපි මොකටද, පොලීසිය ගැන කතා කරන්න වැඩක් නෑ. පොලීසිය ගැන අපි, උදුල මන්ත්‍රීතුමා සම්බන්ධීකරණ කමිටුවේදී එකට

කතා කරා. පොලීසිය ගැන තියෙන්නේ අපිට බොහොම කණගාටුදායක සිද්ධියක්. මාධ්‍යවේදී මහත්වරු මේවා හොඳට ලියන්න පත්තරේට. ඇත්තටම අක්මීමණ පොලීසිය බලු වටින්නේ නෑ. මෙතෙක් කාලයක් අපි එතුමාලාගේ ගෞරවය ආරක්ෂා කරන්න කටයුතු කළා. හැබැයි පොලීසිය ගැන තියෙන්නේ බලු මට්ටමක අදහසක් මිනිස්සුන්ගේ. ගම්වල මිනිස්සු කියන්නේ පොලීසියනම් වැඩක් නෑ මහත්තයෝ කියලා. ඒ මට්ටම තියෙන්නේ. ඒ නිසා බොහොම කණගාටුදායකයි. හැබැයි මේ සිද්ධිය වෙලාවේ මට දුරකථනයෙන් ඇමතුම් ලබා දීපු, පැමිණි මන්ත්‍රීවරු සියලු දෙනාටම මගේ ගෞරවණීය ස්තුතිය පුදකරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕකට හෘද සාක්ෂිය අනුව කියන්න මන්ත්‍රීවරු මොකක්ද සභාපතිට තියෙන බලය කසිප්පු නවත්වන්න. මෙතෙක් අවුරුදු විස්සක් කරපු කසිප්පු තිප්පොල මේ දිල්රුක් සභාපති ඇවිත් නවත්වන්න මොකක්ද තියෙන බලය. ඒක එකක්.

දෙවැනි කාරණාව කවුරුත් දැන ගන්න ඕන අත්අඩංගුවට ගැනීමක් කරන්න බෑ මෙතුමා පැමිණිලි කරනකම්. ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග ගන්න බෑ එතකන්. මම තරයේ සිද්ධිය හෙළා දකිනවා. ඕන වෙලාවක නම් වශයෙන් කියලා මේ සිද්ධිය හෙළා දකිනවා. ඒ ගැන කතා කරන්න දෙයක් නෑ. මහජන නියෝජිතවරයෙකුට කරපු දේ, තර්ජනය කළා නම් ඒක බරපතල වැරැද්දක්. ඒක ගැන ආයේ දෙකක් නෑ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම එදා ඔබතුමා මෙතුමාගේ ගෙදර ගියානම් මෙතුමාවත් එක්ක ගෙන පොලීසියට යන්න තිබුණා කකුලත් බැරි නිසා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බෑ කිවුවානේ. අහන්න මෙතුමාගෙන්.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** සමහර විට එතුමා තනියම නිසා, ආරක්ෂාවක් නැති නිසා එහෙම කියන්න ඇති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතුමා තරයේ කිවුවා බෑ කියලා. "මම මෙතනින් එහාට මේ සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගන්නේ නෑ, මට අවශ්‍ය නෑ කසිප්පු බැරිනම් ඕන දෙයක් කරගනීවි" කියලා කිවුවා. තරහට වෙන්න පුළුවන්. ඔබතුමාලා අපි ඔක්කොටම කණ්ඩායමක් විදියට යන්න කියන්න තිබුණානේ. මම ගිය වෙලාවේ මෙතුමා බෑ කිවුවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපිට කතා කරානම් අපි එනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපෝ ඔබතුමා එන්න. ඔබතුමා බොර දියේ මාලු බාන එක හැමදාම කරේ. යට ඉඳන් ඔක්කොම ගේම් ගගහා තියෙන ප්‍රශ්නත් අවුල් කර කර මේ නැති ප්‍රශ්නයක් ඇති කරන්නේ. අද මොකක්ද මේ කරන්නේ. අද සභාවත් කඩා කප්පල් කරන්නද ඕන. ඒකට සතුටුද ඔයගොල්ලෝ. උප සභාපතිතුමා වෙනුවෙන් මම ගියා. මට කියන්න තියෙන්නේ මෙච්චරයි. මම සභාපති විදියට මේ සිද්ධිය තරයේ හෙළා දකිනවා. පොලීසියේ මට කරන්න පුළුවන් දේ කරා මම සභාපති විදියට. මම කරන්න පුළුවන් ඉල්ලීම් කරනවා. හැබැයි පරීක්ෂණයක් කරන්න පොලිස් ස්ථානාධිපතිතුමා කිවුවේ, සභාපතිතුමා කසිප්පු වටලන එක අපි කරන්නම් නමුත් මෙතුමාට වෙච්ච සිද්ධියට කිසිම තොරතුරක් නැතුව මට ක්‍රියාමාර්ගයක් ගන්න බෑ, අත්අඩංගුවට ගන්න බෑ කියලා කිවුවේ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතුමා බැහැයි කියද්දි මම කොහොමද එක්ක ගෙන යන්නේ. ඔබතුමා ඒ කතාව දැන්නේ කියන්නේ. මෙතුමා බැහැයි කිවුවානේ. පැමිණිල්ලක් දාලා ප්‍රශ්නයක් වුණොත් ඔබතුමාලා නෙමෙයි වග කියන්නේ. එක්කන් ගිහින් පැමිණිල්ලක් දම්මලා බැහැයි කියන කෙනාව, ඊට පස්සේ ප්‍රශ්නයක් වුනොත් වගකියන්නේ ඔබතුමාලා නෙමෙයි මම. එතකොට කවුරුවත් කියන එකක් නෑ. බැහැයි කියන කෙනා බලහත්කාරයෙන් එක්ක ගෙන ගිහින් පැමිණිල්ලක් දාලා ඊට වැඩිය ප්‍රශ්නයක් ඇති වුණොත් කවුද වග කියන්නේ.

න්‍යාය පත්‍රයට යන්න. ප්‍රියන්ත මන්ත්‍රීතුමාගේ යෝජනා ඉදිරිපත් කරන්න.

<u>ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඇතුළු සියළු මන්ත්‍රීවරුන් ඇතුළු, මාධ්‍යවේදීන්ගෙන්, නිලධාරීන්ගෙන් අවසරයි. සුභ උදෑසනක්. පළමුවෙන්ම මගේ යෝජනාවට

වඩා පිටස්තර ඒවා අළලා තමයි මේ සභාව කල් තිබ්බේ. මේ යෝජනාව ඉදිරිපත් කරපු වෙලාවේ බාහිර ප්‍රශ්න වලට තමයි සභාව කල් තිබ්බේ. දැන් මේ මන්ත්‍රීවරයාට සිද්ධ වෙච්ච දේ පිළිබඳව පෞද්ගලිකව අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විදියට කණගාටුවෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** න්‍යාය පත්‍රයට යන්න මන්ත්‍රීතුමා. දැන් ඒ සම්බන්ධව ඉවරයි ඔබතුමාට කතා කරන්න පුළුවන් ඔබතුමාගේ යෝජනා සම්බන්ධව.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මම යෝජනාවක් ගේනවා මේ සභාව මීට වඩා වර්ණවත් විදියට, මන්ත්‍රීවරුන්ට ගරුසරු ඇතුව කරගෙන යන්න පුළුවන්, මේ සභාවේ බිහිවෙච්ච කරුණුත් එක්ක සභාපති ධූරය වෙනස් වුණොත්, මම හිතන්නේ මේ මන්ත්‍රීවරු විසි දෙදෙනාගෙන් බහුතරයේ ඡන්දය අරගෙන සභාපති වුනානම් මීට වඩා මේ ප්‍රශ්න නැතුව මේ සභාව කරගෙන යන්න පුළුවන්.

(ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා මේක මොකක් කියලද හිතන් ඉන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මට තේරෙන දේ මම කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ යෝජනා ඉදිරිපත් කරන්න. මගේ අදහසක් මම කිවුවේ. මම යෝජනා කරනවා. ඔබතුමා මුල ඉඳන්ම බලන්න මේ හෘද සාක්ෂියක් තියෙන මන්ත්‍රීවරු දකිනවා ඇති යෝජනාවක් කරන්න ඉස්සෙල්ලා ඔබතුමා උත්තර දෙනවා. අහන් ඉඳලා උත්තර දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ යෝජනා ඉදිරිපත් කරන්න කරුණාකරලා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මගේ යෝජනාව අරක. සභාපත ිධූරයේ වෙනසක් වුනොත් මම කියනවා මේ සභාව මීට වැඩිය හොඳට යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඔබතුමාට කියන්න අයිතියක් නෑ. ඔබතුමා කවුද සභාපති ධූරය වෙනස් කරන්න කියන්න. ඔබතුමාට අයිතියක් නෑ ඒක කියන්න. එහෙමනම් පරීක්ෂණයක් කරලා මාව අයින් කරන්න. එහෙම නැතුව සභාපති ධූරයෙන් මාව අයින් කරන්න හැකියාවක් නෑ. ඔබතුමාට කොහොද එහෙම හැකියාවක් තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එහෙමනම් සභාපතිතුමා මන්ත්‍රීවරු ඕන නෑ. ඔබතුමා තනියම සභාව කරගෙන යන්න. මන්ත්‍රීවරු ඕන නැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඔබතුමාගේ යෝජනා ඉදිරිපත් වෙන්නේ නැද්ද?.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** යෝජනාව ඉදිරිපත් කරන්න තමයි ලෑස්ති වුනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කියන්න යෝජනාව. ඔබතුමා ඒක නෙමෙයිනේ කියන්නේ. කල් තබපු සභාව තමයි ක්‍රියාත්මක වෙන්නේ. ඒක තේරෙනවාද?. කරුණාකරලා ඔබතුමාගේ යෝජනා ඉදිරිපත් කරන්න. යෝජනා ඉදිරිපත් කරලා ඒ සම්බන්ධව අදහස් ප්‍රකාශ කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්නේ. ඉවසීමෙන් වැඩ කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමාගේ යෝජනා ඉදිරිපත් කරන්න අරින්න. මේක කරන්න බැනේ. ඔබතුමා මට උගන්වන්න එන්න එපා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාපතිවරයා විදියට නිහතමානීව වැඩ කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** යෝජනා ඉදිරිපත් කරන්න මන්ත්‍රීතුමා. අදත් ඕන නැද්ද සභාව. ඒකද වුවමනාව. කරුණාකරලා ප්‍රියන්ත මන්ත්‍රීතුමා යෝජනා ඉදිරිපත් කරන්න. හරි මම සමාව ඉල්ලනවා මගෙන් වරදක් වුණානම්. ප්‍රියන්ත මන්ත්‍රීතුමා යෝජනා ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බොහොම හොඳයි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ- 09.** ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු ජල බවුසරය ලබා ගැනීම සඳහා ඉල්ලීමක් හෝ දුරකථන ඇමතුමක් ලබා දුන් විට දින 07 ක් ඇතුළත මුදල් ගෙවීමේ සහන කාලයකට යටත්ව ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

එසේ එම දින 07 ඇතුළත ගෙවීම් පැහැර හැරීමක් සිදු කළ විට බවුසරය රඳවා ගත් දින ගණන හා ජලයේ වටිනාකම හා සියලු අයකිරීම් සමග දඩයක් වශයෙන් රු. 1000/- ක් සමඟ එම මන්ත්‍රීවරයාගේ මාසික දීමනාවෙන් හෝ ඔහු වෙනුවෙන් එම කාලය තුළ ගෙවනු ලබන ඕනෑම මුදලකින් සභාවට මුදල් අයකර ගැනීම අනිවාර්යයෙන් සිදු කළ යුතු බව යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක පළාත් පාලන කොමසාරිස්ගෙන් උපදෙස් අරගන්නවා කරන්න පුළුවන්ද කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අර වතුර දීම පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ඉන්නකෝ. එතුමාට කියන්න අරින්න. ඔබතුමාගේ අවස්ථාවේදී ඔබතුමා ප්‍රකාශ කරන්නකෝ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ- 10.** සභාවට ලීටර් 1000 ජංගම ජල ටැංකි තුනක් සකස් කර ජනතා අවශ්‍යතාවයන් සඳහා ලබා දී සාධාරණ මුදලක් අයකර ගැනීම සුදුසු බව යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ- 11.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇති වැදගත් ස්ථාන හා ප්‍රසිද්ධ ස්ථානවල හා අප බල ප්‍රදේශයට ඇතුල්වන සියළුම ස්ථානවල “ ඔබ මේ පිවිසෙන්නේ පොලිතීන් වලින් තොර කලාපයකටයි ” යන වැකිය ප්‍රදර්ශනය වන දැන්වීම් පුවරු සවිකරන ලෙසත්, පොලිතීන් වලින් පරිසරයට වන හානිය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා කාලීන තාක්ෂණික ක්‍රම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ක්‍රමවේදයක් සකස් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ- 12.** මොල්ලිගොඩවත්ත හරහා ගමන් කරන ප්‍රධාන මාර්ග දෙකේ පාර මැද සිට දෙපසට සීමා ලකුණු කර මායිම් කණු සිටුවීම සුදුසු අතර, ජනතාව විශාල වශයෙන් පාර සීමාව ඉක්මවා ඉදිකිරීම් කටයුතු, වැට ඉදිකිරීම සහ ගෙපල් කැපීම සිදුකර ඇති හෙයින් එම තත්ත්වය කඩිනමින් මඟහරවා ගැනීම සඳහා කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඊළඟ යෝජනාව මම න්‍යාය පත්‍රයෙන් ඉල්ලා අස්කර ගන්නවා. ඒ සම්බන්ධව මාව ලේකම්තුමා දැනුවත් කරා. මේ කාර්යයේ නිලධාරි මහත්මයාට ඒ සඳහා අතිකාල දීමනා ගෙවන බව දැනුවත් කළ නිසා න්‍යාය පත්‍රයෙන් එම යෝජනාව ඉල්ලා අස්කර ගන්නවා.

<u>**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමාගේ යෝජනා**</u>

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ- 14.** හපුගල ඉසුරු මාවත අබලන්වී ඇති ස්ථාන කිහිපයක් පවතින බැවින් එම ස්ථාන ප්‍රීමික්ස් යොදා පිළිසකර කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** හපුගල මේ මාර්ගයට රුපියල් ලක්ෂ දහයක මුදලක් අනුමත කරලා එවලා තියෙනවා ගරු වජිර අබේවර්ධන මැතිතුමා. මම මේ මාර්ගය පරීක්ෂා කිරීමේදී ඒ මාර්ගය අළුතෙන් යෙදීම අවශ්‍ය නෑ කියලා තේරුණා. මොකද ඒ පාරේ තැනින් තැන කඩතොලු වෙච්ච කීපයක් තියෙන්නේ. ඒ ටික ප්‍රීමික්ස් යොදලා ප්‍රතිසංස්කරණය කරාට පස්සේ ඒ මුදල් වෙනත් තැනකට යොදවන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලක්ෂ දහයක් එවලා තියෙන්නේ පැති බැම්මකටත් එක්ක.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** කමක් නෑ. මේ පාර අබලන් වෙච්ච එක අළුත්වැඩියා කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ- 15.** සභාවේ ලිපි ශීර්ෂය සහිත ලිපි ලියන පොත් මුද්‍රණය කර සියලුම මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලා වෙත ලබා දීමට කටයුතු කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** අක්මීමණ ප්‍රාදේශිය සභාවේ ඒක කරලා තියෙනවා. ඒ මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් ලිපි ලියන්නේ, ලිපි ඉදිරිපත් කරන්නේ ඒවායේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනට කරලා තියෙන්නේ ගන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** බොහොම ස්තුතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණියගේ යෝජනා**</u>

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ- 16.** ලබුදූව කොට්ඨාශයේ දිරාපත් වූ වීදි ලාම්පු වෙනුවට අලුතෙන් සවි කිරීම සඳහා වීදි ලාම්පු කට්ටල 30 ක් මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ යෝජනා**</u>

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 17.** පියදිගම කිංග්ස්කෝට් නිවාස සඳහා භාවිතා කරන උදේක මහතාගේ නිවස අසල ඇති මාර්ගයේ කාණු පද්ධතිය ඇහිරී ඇති බැවින්, එම කාණු පද්ධතිය සුද්ධ කර පාර ආරම්භ වන ස්ථානයේ උදේක මහතාගේ නිවස අසල සපත්තු කාණුවක් යොදා ජලය බැස යන තත්ත්වයට සකස් කරන මෙන් ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම මත යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේ පාර අඩි දහසයක් වගේ පළලට තියෙනවා. නමුත් එක පැත්තක කාණු පද්ධතිය සම්පූර්ණයෙන් වැහිලා තියෙනවා. ඒ කාණු පද්ධතිය සුද්ධ කරන්න කියලා ඒ ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීමක් තියෙනවා. කිංග්ස්කෝට් වත්තට යන මාර්ගය කර ගෙන තියෙනවා ඒක. පොඩි පාරක් තිබුණේ. දැන් ඒක ලොකු කරගෙන. දැන් ඒක කිංග්ස්කෝට් වත්තට යන පාර විදියට හදාගෙන තියෙනවා. කොහොමත් සියදෙනෙකු වගේ මේ පාර භාවිතා කරනවා. මේ පාවිච්චි කරන හින්දා අර පාරේ තියෙන කාණුව වැහිලා තියෙන්නේ. ඒ වැහිච්ච කාණුව ගොඩ

දාන්න ඕන. ඒක සුද්ධ කරන්න තමයි ඉල්ලීම් තියෙන්නේ. ඊළඟට ඒ ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීමක් තියෙනවා ඒකේ එන වැසි ජලය අනිත් පැත්තට බැහැලා යන්න ඒක අර කාණුව පැත්තට හරවලා සපත්තු කාණුවක් සකස් කරලා දෙන්න කියලා. මම යෝජනා කරනවා ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ නිලධාරිතුමා සමග ගිහිල්ලා මේ කාරණය බලලා අවශ්‍ය කටයුතු කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒ වගේම තමයි මේකත් කාලීන යෝජනාවක්. මේ දිනවල වැලිපිටිමෝදර, ලේකම් වත්ත, අම්පිටිය ප්‍රදේශයේ ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එපා සුගත් මන්ත්‍රීතුමා. ලබන සභාව තියෙනවානේ ඒකට දාන්න. අද තියෙන විශේෂිත කාරණා මුකුත් ගන්නේ නෑ. කාරණා බහුතරයක් තියෙනවා. ගන්නේ නෑ. කිසි දෙයක් ගන්නේ නැත්තේ මේක න්‍යායපත්‍රානුකූලව යන්න ඕන හින්දා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මෙහෙමයි සභාපතිතුමා මම නම් දන්නේ නෑ මේ විදියට අද කරන්න ඕන දේ ලබන මාසයට කරන්න තිබ්බහම මේ වැඩේ කරන්න බෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කියන එක අහන්නකෝ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මම ඒක යෝජනාවක් කරලා ගේන්න හැදුවේ. එහෙම නම් සභාපතිවරයා විදියට මේ කරන ඉල්ලීම සභාවට ඇතුළත් නොකර ඒ අවශ්‍ය තැන් වලට ලිපි භාර දීලා ඒ අවශ්‍ය කටයුතු කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට ඒක දුන්නා නම් ඒකට අවශ්‍ය ක්‍රියාමාර්ගයක් ගන්න තිබුණා. අද මේ කරන්නේ ගිය මාසේ විසිවෙනිදා තිබුණ රැස්වීම. ඊළඟ මහ සභාව එනවා ඊළඟ සතියේ නෙමෙයි ඊට පස්සේ සතියේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේක අවශ්‍ය ස්ථාන වලට යොමු කරලා අවස්ථාව ලබා දෙන්න කියලා ඉල්ලනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කෝ දෙන්න සුගත් මන්ත්‍රීතුමා.

<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 18.** ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජනාධිපති අපේක්ෂකයා ලෙස ගෝඨාභය රාජපක්ෂ මහතා අප සභාවේ යෝජනා සම්මතයෙන් යවන ලද ඉල්ලීම සැලකිල්ලට ගනිමින් නම් කිරීම පිළිබඳව මහින්ද රාජපක්ෂ විපක්ෂ නායකතුමාටත්, බැසිල් රාජපක්ෂ මැතිතුමාටත් ස්තුතිය පුද කර ලිපියක් යැවීමට යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** පවුලේ සැමට යවන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** පවුලේ සැමට යවන්න දෙයක් නෑ. ඔබතුමා තමයි මේ යෝජනාව ස්ථිර කරේ. තව සභාවක් කල් ගියානම් ජනාධිපති කරලා තමයි අපි ලිපිය යවන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 19.** කරාපිටිය ගොඩකන්ද මාර්ගය "මීපාවල හේමාලෝක නාහිමි මාවත" ලෙස නම් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අදාළ ක්‍රමවේදය තුළ කිරීමට කටයුතු කරන්නේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 20.** ගොඩකන්ද හෝළුවාගොඩ මාර්ගය රිය අනතුරු වැඩිපුර සිදුවන ස්ථානයක් බැවින් හෝළුවාගොඩ ඇළතොට වත්ත මාර්ගය අසළ රිය අනතුරු සිදුවීම අවම කිරීම සඳහා ගත හැකි සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා යවන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 21.** කරාපිටිය ගොඩකන්ද මාර්ගය කඩිනමින් සංවර්ධනය කරන මෙන් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා යවන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ පාර කාපට් කරන එක ඔබතුමා ගලවා ගෙන ගිහින් ඔබතුමාගේ පාරට ගත්තා මුදල් ටික.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එහෙමත් දෙයක් වුණාද?.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** පිස්සු

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** පිස්සු නෙමෙයි ඔබතුමාගේ ගෙදරට යන මාර්ගය කාපට් කරන්නේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ලියනගේ මන්ත්‍රීතුමා ඒක නිසාද මෙතුමාගේ ෆොටෝ එක අර බැනර් එකෙන් කැපුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ පිළිබඳව අදහස් දක්වන්න ඕන. ඇත්තටම අපි කණගාටු වෙනවා. අපි බාධා එල්ල කරන්නේ නෑ ප්‍රාදේශීය සභාව විදියට ඕන සංවර්ධන කටයුත්තක් කිරීමේදී. නමුත් අඩි දොළහේ පාරවල් අඩි අටට කාපට් කිරීමේදී ගැටළු ගණනාවක් තියෙනවා නරිදූව පාරේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඔබතුමාලා අපි බලන්න ගිහිල්ලනේ කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නමුත් අපි කතා කරේ අඩි දොළහට දාන්න. නමුත් දාලා තියෙන්නේ අඩි දහයට.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** පාරේ හරි ප්‍රමාණයක් නැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි කියලනේ ආවේ හැම මනුස්සයෙකුටම.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඒක කෙරුණේ නැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කියාගෙන ගියා. නමුත් ආරවුලකට යන්න නෙමෙයි මම කියන්නේ. වැඩේ යද්දි පටන් ගන්න දවසක්වත් අපිට කිව්වේ නෑ. වැඩේ යද්දි එහෙමනම් මම තාක්ෂණ නිලධාරි එවලා අඩි 12 ලකුණු කරවලා දෙනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාව මැදහත් වුනේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැත්තේ මොකද?. මම ගියා. ගෙයින් ගෙට ගියානේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ගෙයින් ගෙට ගිහින් අපි කිව්වට ලකුණු කරේ නැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇස්තමේන්තුව හැදුවේ පළල අඩි දොළහට ද?.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** අඩි දහයට. අඩි දහයක් දාන්න බැරි තැන් තියෙනවා. පෙරේදා කාපට් ලොරියක් එහෙමම අනිත් පැත්තට ගියා. අපිත් කැමතියි තව දාන්න පුළුවන්නම්. කරන්න බෑ ඊට වැඩිය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දෙපැත්තෙන් පස් හරි වැටෙනවාද දන්නේ නෑ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** දෙපැත්තට පස් දාලා හරි ගස්සවන්නම්. ඒ ටිකට කරලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තව ඉල්ලීමක් තියෙනවා මම ඒක කිව්වා කෙරුනේ නෑ. ඉස්කෝලේ දෙපැත්තෙන් බම්පර් දෙකක් දාන්න ඕන.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** බම්පර් දාන්නේ නෑ. ඉරි ගහනවා. එතන ගහන්නම ඕන අනිවාර්යයෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගහන්න කියන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒකට සභා අනුමැතිය ලබා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභා අනුමැතියක් ඕන නෑ ඒකට. හරි මම ලියුමක් දෙන්නම් අවශ්‍යනම්. පාරට ලිඛිත අනුමැතිය ගත්තෙත් නැනේ. එහෙම එකක් නෑ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** කරාපිටිය ගොඩකන්ද මාර්ගය ගැන හැඳින්වීමක් කරන කොට ඇල්පිටිය, බද්දේගම, ගෝනපීනුවල, නාගොඩ වගේ ප්‍රදේශ වලින් විශාල රෝගීන් ප්‍රමාණයක් එන මාර්ගය මේක. දැන් මේක කාපට් කරනවා කියලා උත්සවයකුත් තියලා, සියල්ල සිදු වන්නේ දෙවියන්ගේ කැමැත්තට කියලා කිව්ව නායකතුමා හින්දා මම ඒක ගැන ආයේ මේවා කරන්නේ නෑ. ඒ නායකතුමා මේකට ඇවිත්, උත්සවයකුත් තියලා මේක කාපට් කරනවා කියලා දැන් මුදලත් එක්කම ඒ බෝඩ් එකත් ඇදගෙන ගිහිල්ලා තියෙනවා. ඒ පිළිබඳව මම ඉල්ලීමක් කරනවා ගිහිල්ලා නායකතුමාව දැනුවත් කරලා ඒ පාර කඩිනමින් සංවර්ධනය කරන්න කියලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** හේතුවක් නැතුව කවදාවත් අපේ නායකතුමා එහෙම කියන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මාධ්‍ය ඉදිරිපිට කිව්වේ සියල්ල.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඒ පාර පළල මදි නිසා තමයි ඒක කරේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අවශ්‍ය ප්‍රමාණය මොකද නැත්තේ. අඩි පහළොවක මාර්ගයක් ඒක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද ඒ පාරේ තියෙන ප්‍රශ්නය.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** පාරේ පළල මදි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පාරේ පළල මදියි? ගොඩකන්ද කරාපිටිය මාර්ගය පළල මදියි?

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** පළල මදියි රෝහලත් එක්ක. ග්‍රාම නිලධාරීන් පස් දෙනෙක් නම් කරලා පාර පළල් කරන එකට මුදල් ගෙවන්නේ නැතුව ගෙවල් වලට ගිහින් අහලා ඒ වැඩේ කරන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගිංතොට වක්වැල්ල පාර කාපට් කරන්න දැම්මම කාපට් කරේ නෑ. හේතුව මොකක්ද ඒ පාර මංතීරු දෙකකට දාලා දෙපැත්තෙන් අරගෙන පළල් කරන්න ඉන්නේ. ඒක අනිවාර්යයෙන් කරනවා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ප්‍රධාන මාර්ගයක් මේක. අතුරු මාර්ගයක් නෙමෙයි. දැනට යන්න පුළුවන් තත්ත්වයෙන් තියෙන්න එපැයි. දැනට දවසකට රෝගීන් හතරක් පහක් ඇතුළත් කරනවා මේ පාරේ ගමන් කරාට පස්සේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 22.** ජස්ටින් කන්ද ප්‍රධාන මාර්ගයේ දුරකථන කුළුණ වෙත අධිබර වාහන ගමන් කරන නිසා දෙපස නිවාස වලට හානි සිදු වී ඇත. එම මාර්ගයේ වාහන ගමනාගමනය පිළිබඳව තිරණයක් ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේ ජස්ටින් කන්දේ ඩයලොග් කුළුණ. දැන් සන්ටෙල් ආයතනයෙන් ඩයලොග් එකට දීලා තියෙන්නේ. ඒකට අධිබර වාහන යනවා. දෙපස නිවාස වලට විශාල හානියක් වෙලා තියෙනවා. මම යෝජනා කරනවා එක්කෝ වේග සීමාවක් දාන්න. නැත්නම් මාර්ගය නඩත්තු කිරීම ඒ අයට දෙන්න. දෙපස හෝදගෙන ගිහින් නිසා නිවාස වලට වාහනයක් පෙරලෙන මට්ටමේ තියෙන්නේ. ඒ නිසා මේකට සාකච්ඡා කරලා තිරණයක් ගන්න කියලා යෝජනා කරන්නේ. හැබැයි තීරණයක් ගන්නවා වගේම ඒක ක්‍රියාත්මක විය යුතුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බර වාහන වලට සීමාවක් දාමු එහෙමනම්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** බර වාහන තියා ත්‍රී රෝද රථයක්වත් යන්න බැරි මට්ටමට පත්වෙලා තියෙන්නේ එතන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන බෝඩ් එකක් ගහන්න බර වාහන ගමන් කිරීම තහනම් කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ කරලා අපි මේකට දෙන විසඳුම මොකක්ද?. මේ ඩයලොග් සමාගම එක්ක අපි සාකච්ඡාවක් තියලා හරි ඒ අයට නඩත්තුව භාර දෙමු. මීට අවුරුදු දොළහකට, පහළොවකට විතර කලින් සන්ටෙල් සමාගමෙන් තමයි ඒ පාර මුලින් වතාවෙත් හැදුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තාක්ෂණ නිලධාරීට බලලා වාර්තාවක් දෙන්න කියන්නම්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(සභාව තේ පානය සඳහා කල් තබන ලදි.)**

<u>(ඊ) කාරක සභාවල වාර්තා</u>

<u>01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව.</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- I.** 2019.07.30 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ කමිටු වාර්තාවේ තිබෙන ගෙවීම්වල සමහරක් සම්බන්ධයෙන් අපි කමිටුවට සහභාගි වෙච්ච සාමාජිකයෝ විදියට ප්‍රශ්න තියෙනවා. අපි මුදල් කමිටුවේ සමහර ගෙවීම් ඒ ක්‍රමවේදය, මුදල් රෙගුලාසිවලට අදාල ලේඛන උපයෝගි කරගෙන නිවැරදිභාවය හා ක්‍රමවේදයන් සම්බන්ධයෙන් අපි තක්සේරුවකට ඇවිල්ලා තමයි අත්සන් යොදන්නේ. නමුත් අපිට එදින කරපු ගෙවීම්වල සමහර ගෙවීම් සම්බන්ධව ප්‍රශ්නකාරී තත්ත්වයක් මතුවෙලා තියෙනවා. ඒ නිසා මේ සභාවේ ඒ කාරණය සම්බන්ධව නිරවුල්භාවයකට යන්න ඕන. එහෙම නැත්නම් අපිට මේකට එකඟ වෙන්න බැරි තත්ත්වයක් තියෙනවා. ඒ නිසා මේ පැහැදිලිකර ගැනීමට යටත්ව තමයි යන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** මොකක් සම්බන්ධවද කියන්නේ ඔබතුමා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** අපි මේක කතා කරා මීට කලින්. මේ කරපු දීමනා, ගෙවීම් හෝ වැටුප් ගෙවීම් සම්බන්ධව ප්‍රශ්නයක් නෑ. අපේ බැකෝ යන්ත්‍රය සම්බන්ධ ගෙවීම, මේක ඉතාමත් කාලයක් තිස්සේ දිගින් දිගට අපි කතා කරපු කාරණයක්. මේක නැවත මතු කරලා නිරවුල් කරලා යන්න ඕන. එහෙම නැතිවුනොත් මේ සභාව ඉස්සරහට යන එක ප්‍රශ්නකාරී තත්ත්වයක් මතු වේවි. හැබැයි එකඟ වෙන්න පුළුවන් වෙන්නේ ඒවායේ නිරවුල්භාවය මත. අපි එක එක්කෙනාට විවිධ මත තියෙන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** අහන්නකෝ බලන්න එකින් එකට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** අපි බැකෝ එක කලින් සම්පූර්ණයෙන්ම අළුත්වැඩියාව සඳහා යොදවලා ලක්ෂ දාහතරක, පහළොවක පමණ ප්‍රමාණයක් වියදම් කරලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ලක්ෂ දාහතයි ගාණක ඇස්තමේන්තුවක් තිබුණේ. ලක්ෂ දාහතරයි ගාණට තමයි සිදු කරේ. ඒකත් මෙහෙමයි. එන්ජින් රෙපෙයාර් එක පමණයි. අනෙක් කාරණා ඒ අයට බැහැයි කිව්වා. ඒවා වැඩ කරද්දි මතුවෙන කාරණා කිව්වා. එවෙලෙට තිබුණ සම්පූර්ණ රෙපෙයාර් එකට තිබුණේ එන්ජිමේ රෙපෙයාර් එක. ඒ සඳහා පමණයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** ලක්ෂ දාහතරයි ගාණක් ගියේ ඒ රෙපෙයාර් එක කරන්නද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඔව්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** එතකොට බැකෝ යන්ත්‍රයේ අළුත්වැඩියාව අපි සම්පූර්ණයෙන් කරලා අපිට එහේ ඉඳලා ගාල්ලට අරගෙන එන්න, එන්ජිමේ රෙපෙයාර් එකක් නිසාම මේ තරම් දුරක් ගේන්න බැහැයි කියලා මේක බැරියර් එකක දාගෙන තමයි අරගෙන ආවේ. එතකොට ඇවිල්ලා අපිට ලක්ෂ දාහතරයි ගාණක අළුත්වැඩියාවක් කරපු බැකෝ එක ආපහු අඩියක්වත් දුර දුවාගන්න බැරි තත්ත්වයකට පත් වුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** අඩියක් නෙමෙයි දවස් දෙකක් විතර දිව්වා. දවස් දෙකක් විතර වැඩ කරා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** ගෙනල්ලා අනිත් පැත්තට බැකෝ එක වැඩ කරන්නේ නෑ. එතකොට ඒ නැවත මතු වුණේ එන්ජිමේ රෙපෙයාර් එකක් නොවෙන්න ඕන නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** එන්ජිමේ රෙපෙයාර් එකක් ආවේ පිස්ටන් එකක් හරස්වීම නිසා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** එතකොට මේක හදාගෙන ඇවිල්ලා ලක්ෂ දාහතරක්, පහළොවක් වියදම් කරපු එන්ජිමේ රෙපෙයාර් එකක් ඇතුළේ ආපහු එනකොටම පිස්ටන් එකක් හිරවෙලා කැඩෙන්න ඒ රෙපෙයාර් එකේදී අහුනොවුන කාර්යයක් වෙන්න එපැයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඒ පාර කරේ ඒ ගොල්ලෝ මෙතන තියාගෙනම මේක ගලවලා, කලින් පාර මාතර කරේ. එන්ජිම ගලවලා කොළඹ ප්‍රධාන කාර්යාලයට අරගෙන ගියා. ශත පහක වියදමක් නෑ ඒවාට. ඒ අය ගෙනියලා සම්පූර්ණ රෙපෙයාර් එක කරලා ගෙනල්ලා හැදුවා. ඊට පස්සෙත් බැකෝ එක වැඩ කරා.

ඊට පස්සේ අපි ඒක වැඩට දාන්න කලින්, මගෙත් අදහසක් තිබුණා, දිර්ඝ කාලයක ඉල්ලීමක් තිබුණා ගනේගොඩට හැරෙන තැන බුදුපිළිමයක් ඉදිකරන්න. එතනට දාලා කැපුවා. එතන කපද්දි දිගින් දිගට මැෂින් එක නවතිනවා. මොකද හේතුව අවුරුදු දෙකක් තුනක් තිස්සේ එක තැන තිබුණ මැෂින් එකක්. ඒකේ එන්ජිමේ රෙපෙයාර් එක විතරයි කරේ. ඒකේ වැඩ කරද්දි ටැංකිය මලකඩ කාලා

මලකඩ හිරවෙනවා. නවතිනවා. මලකඩ හිරවෙනවා නවතිනවා. වෙනම කාර්මිකයෙක් ගෙන්නලා තියාගෙන තමයි වාහනය වැඩ කෙරෙව්වේ. ස්පැනර් එකක් දාලා යටින් බුරුල් කරලා මලකඩ යවනවා. වැඩ කරනවා. ඒ පාර මන්ත්‍රීතුමා මමත් ගිහින් බැලුවා. මම එවෙලේම ලේකම්තුමාටත් කතා කරලා කිව්වා. හයිඩ්‍රොලික් නූලෙන් බේරෙනවා. කුල්ල උස්සනකොට හයිඩ්‍රොලික් නූලෙන් බේරෙනවා හෝස් වලින්. අපි දන්නේ නෑ මොකක්ද කියන එක. ඒ පාර මම ලේකම්තුමාට කතා කරලා කිව්වා. ඔපරේටර් කිව්වා ජේ.සී.බී එක ගේන්න බැහැ කියලා. වාහනය ගෙනල්ලා කැඩුණොත් තව ප්‍රශ්නයක්. ඊට පස්සේ අසල තිබුණ ගරාජයකට දැම්මා. නමුත් හැදුවේ එතන නෙමෙයි මන්ත්‍රීතුමා. මේ කවුරුත් වරද්ද ගත්ත තැනක්. බැකෝ එක හදන්න තරම් එකක් එතන නෑ. හැදුවේ තුෂාර කියලා සෙනොක් එකේ වැඩ කරපු කෙනෙක්. ගනේගොඩ කෙනෙක් වෙන්න ඇති. මම ගම දන්නේ නෑ. තුෂාර හැදුවේ. ගාල්ලටම ඉන්නේ දෙන්නයි. එක්කෙනෙක් මේ එක්කෙනා. අනිත් කෙනා බටදූවේ ඉන්නේ. තුෂාර තමයි වාහනය හැදුවේ. ඔය රෙපෙයාර් එකට එයා හෙට වුනත් සෙනොක් එකෙන් මිල ගණන් ගෙනත් දෙන්නම් කිව්වා. ලක්ෂ දෙකහමාරකට වැඩිය යනවා කිව්වා ඔය අනූ එක්දාහට කරපු රෙපෙයාර් එක. හැබැයි මෙහෙමයි ඒ සියලු කටයුතු කරේ ඉංජිනේරුවරයාගේ නිර්දේශ මත. හිතුමතේ කරේ නෑ කිසි දෙයක්. ගෙනල්ලා පෙන්නලා තමයි වැඩ පටන් ගත්තේ. මිල ගණන සාධාරණීකරණය කරලා එයා දීලා තියෙනවා. ඊට පස්සේ තමයි වැඩ පටන් ගත්තේ. ගැහුවේ ඔයිල් සීල්. ඔයිල් සිල් හයක් නැත්නම් අටක් ගැහුවා මට මතක විදියට. මෙහෙම දෙයක් තියෙන්නේ ඉංජිනේරුතුමා දුන්නේ, එතුමාගේ දැනුම පිළිබඳ මට ප්‍රශ්නයක් තියෙනවා. එතුමා දුන්නේ එක පැත්තක ඔයිල් සීල් තුනක්. එතකොට තුෂාර කිව්වා එහෙම බෑ ඒ පැත්තට දාලා අනෙක් පැත්තේ පරණ ඒවා තිබුණොත් පෙෂර් එකට ඒ පැත්තේ ටිකත් යනවා කියලා. ඒක කිව්වාට පස්සේ නැවත එතුමා අනුමැතිය දුන්නා හයම දාන්න. එවැනි තත්ත්වයක් තමයි තියෙන්නේ. අඳුරනවානම් තුෂාරගෙන් අහන්න. ඔය අපි කරපු ලක්ෂ 14 රෙපෙයාර් එක තුෂාර කරානම් අවුරුදු දෙකක වගකීමකුත් දීලා ලක්ෂ පහට කරනවා කිව්වා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ප්‍රශ්නේ තියෙන්නේ මෙහෙමයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට තව එකක් කියන්නම්. අදත් හෝස් එකක් ගිහින් තියෙනවා වාහනයේ. වැඩ කරද්දි හෝස් යනවා. කරන්න දෙයක් නෑ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාපතිතුමා සාමාන්‍යයෙන් අවුරුදු ගාණක් එක තැන තිබුණ වාහනයක රෙපෙයාර් එකක් කරන කොට අනිවාර්යයෙන් ඔයිල් සීල් වගේ කාලයක් තියෙන කොට දිරන්න පුළුවන් ඒවා අළුත්වැඩියා කරනවා. ඒවා මඟ අරිනවානම් සෙනොක් වගේ ආයතනයක බරපතල ප්‍රශ්නයක් තියෙනවා එයාලගේ තාක්ෂණය සම්බන්ධව. බරපතල ප්‍රශ්නයක් තියෙනවා. අපි සාමාන්‍ය ගරාජයකට වාහනය හදන්න දැම්මොත්, කාලයක් එක තැන තිබුණ වාහනයක් නම් එයාලා ඔක්කොම කේබල්, ක්ලච් ප්ලේට්, බ්රේක් ප්ලේට් එවා දානවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන කතාව ඇත්ත. සභාවත් බලන්නේ කොයිවෙලෙත් අදාළ නියෝජිත ආයතනයට දාලා ඇඟ බේරගන්න. කීය වුණත් ගෙව්වා. ඔය ප්‍රශ්නේ තියෙන්නේ. ඒක තමයි මේකේ තියෙන කරුමේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක සාමාන්‍ය ක්‍රියාවලියක්. එවැනි ආයතනයකින් අළුත්වැඩියාවක් කරන කොට ඒ අය වගකීමක් දරනවා. ආයි එන්ජිමේ ට්‍රබල් එකක් එන්න බෑ. ආවොත් එයාලා වගකියන්න ඕන. එයාලාගේ වගකීම් කාලයක් තියෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ සහතිකය අපිට දීලා තියෙන්නේ. එන්ජින් රෙපෙයාර් එකේ වගකීම ගන්නවා කියලා දීලා තියෙන්නේ. මාස හයක වගකීමක් දීලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගෙනල්ලා දවස් දෙකක් වැඩ කරන කොට කැඩුණ එකේ ආයිම රෙපෙයාර් එකකට රුපියල් අනූ එක් දාහක් වියදම් කරන්න වූණේ ඇයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ එන්ජින් එකේ නෙමෙයි. ඔබතුමාට කියන එක තේරෙන්නේ නෑ නේ. මම දැන් දිගින් දිගට පැහැදිලි කරලා කිව්වා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පැහැදිලියි ඔබතුමා කියපු කාරණය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම වෙනවාට කියනවා නෙමෙයි, හෙට අනිද්දාට පියර් බොක්ස් එකේ ලෙඩක් එන්න පුළුවන්. ඒවා වෙන්න පුළුවන් කාරණා මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔයිල් සීල් ටික එන්ජිමේ ක්‍රියාකාරීත්වය නිසානේ පෙෂර් වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ හයිඩ්‍රොලික් ජැක් වලින් ඉස්සරහ කුල්ලයි පිටිපස්සේ කුල්ලයි නිසා වෙන්නේ. ඒකට එන්ජිමේ සම්බන්ධයක් නෑ. හයිඩ්‍රොලික් පවර් එකෙන් වෙන්නේ ඒක.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ කාරණය පැහැදිලි කර ගන්න ඕන. මුදල් කමිටුවෙන් මේක අත්සන් කරලා අනුමත කරලා තියෙනවා. ඊට පස්සේ වියදම් දැරීම සඳහා සභා අනුමැතිය අරගෙන නෑ තාම. අපි කමිටුවේදී අනුමත කරපු පමණින් මුදල් ගෙවන්න බෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පුළුවන්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභා අනුමැතියකින් තොරව මුදල් ගෙවන්න පුළුවන්කම තියෙනවාද?. මේක සම්බන්ධව අපිට ප්‍රශ්නකාරී තත්ත්වයක් මතු වෙලා තියෙන්නේ. ආපහු ඒකට අපි වගකීමෙන් බැඳෙනවා. අපි මේ විදියට අනුමත කරොත්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඔබතුමා මුදල් කමිටුවෙත් ඉඳලා, ඔබතුමාම අනුමත කරලා, ප්‍රශ්න තියෙනවානම් අහන්න. කිසි ප්‍රශ්නයක් නෑ. අපි බොහොම විනිවිදභාවයෙන් වැඩ කරලා තියෙන්නේ. ඕන තරම් ප්‍රශ්න අහන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අදාළ මිල ගණන් කැඳවලා, අදාළ ඉංජිනේරුවරයාගේ සහතික කරලා අරගෙන ක්‍රමවේදයට, මූල්‍ය ක්‍රමවේදයට තමයි අපි අනුමත කරලා තියෙන්නේ. මේ රෙපෙයාර් එකේ තාක්ෂණික පැත්ත අපිට කරන්න බෑ. මේ ගෙවීම කරන කොට ගෙවීමට අදාළ ක්‍රමවේදයට සභාවේ අනුමැතිය දීලා, ඒ අදාළ නීත්‍යානුකූල ක්‍රමවේදයට නැත්නම් සභාවෙන් අනුමැතිය දීමේ හැකියාවක් නෑ. ඒ පැහැදිලි කර ගැනීම අත්‍යාවශයයි. අපිට තියෙන ප්‍රශ්නය මේ ගෙවීම මේ වෙන කොට කරලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මුදල් කමිටුව අනුමත කරාම ගෙවන්න පුළුවන්. පුනරාවර්තන වියදම් යටතේ ලක්ෂ දෙකක් යනකන් සභාපතිට ගෙවන්න පුළුවන්.

දැන් මන්ත්‍රීතුමා මෙහෙමනේ. මේ ආයතනය පිළිබඳව විශ්වාසයක් තියෙන්න ඕන අදාළ ආයතන වලට. ඒ ආයතන කවදාවත් මෙහෙට එන්නේ නෑ. උදාහරණයක් අපි ලයිට් ඕඩර් කරලා ඒකට ගෙවීම් කරන්න ඕන වුණාම මුදල් කමිටුව කැඳවනවා. මුදල් කමිටුව අනුමත කරනවා කියන්නේ විශ්වාසය. මුදල් කමිටුවේදී විශ්වාසයෙන් අත්සන් කරාම ඒකට ගෙවනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මුදල් කමිටුව අනුමත කරේ ඒ ලිපි ලේඛන වල තියෙන විශ්වාසය අනුවනේ. කරපු ක්‍රමවේදය, ගිහින් දාලා තියෙන්නේ කොහේද, හැදුවේ කවුද දන්නේ නෑ නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන එක හරි. අදාළ පිළිවෙලට අදාළ කාරණා කරලා තියෙනවා. ඔබතුමාට ලේඛන ඔක්කොම අරගෙන බලන්න පුළුවන්. ඔබතුමාට බලන්න දේකුත් නෑ. ඔඩිට් එකෙන් බලනවා ඔක්කොම. මම බොහොම සතුටු වෙනවා. මම පරීක්ෂණයකටත් කැමතියි කියලා ඉල්ලුවේ ඒකයි. මෙහේ යාවත්කාලීනව, හැම ප්‍රාදේශීය සභාවකටම වැඩිය, මෙහේ අද එකක් වුණොත් ලබන සතියේ ඔඩිට් වෙනවා. ඒ පිළිබඳව සතුටු වෙනවා අපි. මෙහේ එහෙම වෙන්නේ. අවුරුදු එකහමාරටම ඔඩිට් නොවුන ප්‍රාදේශීය සභා තියෙනවා. මෙහේ ගිය සතියේ කරපු එකත් ඔඩිට් වෙලා ඉවරයි. බොහොම කාර්යක්ෂමයි ඒ පැත්තෙන්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක හොඳයි නේ. විගණනය වෙනවානම් ඒක හොඳයි. නිරවුල් නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිවාර්යයෙන්ම. දැනුත් ඉන්නවා ඕනනම් බලන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක ඇත්තටම හොඳයි. නිරවුල්භාවය සහිතව තියෙන එක හොඳයි. මූල්‍ය රෙගුලාසිවලට අන්තිමට සභිකයොන්ටත් වගකියන්න සිද්ධවෙනවා. ඒ නිසා මේකේ නීත්‍යානුකූලභාවය පිළිබඳ ප්‍රශ්න නැත්නම් අපිට මේක අනුමත කරන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕන නීත්‍යානුකූලභාවයකට අපි එකඟයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, බැකෝ යන්ත්‍රය පිළිබඳ ප්‍රශ්නය ගන්න කොට ඔබතුමාට මම යෝජනා කරනවා ඒ බැකෝ යන්ත්‍රය රෙපෙයාර් කරන්න ගෙනාපු යෝජනාව තියෙන සභා වාර්තාව අරගෙන නැවත අධ්‍යයනය කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට උත්තරයක් දෙන්නම්. එකින් එකට මම දෙන්නම්. සභාවකට දාන්න අවශ්‍ය නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ලෝකෙ කොහේවත් එහෙම නෑ. අහලා ලියා ගන්න. ඊට පස්සේ දෙන්න උත්තර ටික. පටලැවිල්ලක්නේ හදන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි ඔබතුමා කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, බොහොම පැහැදිලිව අපි කියලා තියෙනවා, මම කියලා තියෙනවා මේ බැකෝ එක කාලයක් මෙතන තිබුණා ඒ නිසා සියලුම දේවල් කරලා වැඩ කරන්න පුළුවන් තත්ත්වයෙන් ගේනවා මිසක්, වැඩ කරන්න පුළුවන් මට්ටමෙන් ගේනවා මිසක් නැත්නම් ගේන්න එපා කියලා. එහෙම නැත්නම් මේක ගෙනල්ලා මෙහේ වැඩ කරන්න බැරිනම් තේරුමක් නෑ කියලා. දැන් බැලුවම ගියපු ප්‍රමාණය ගැන කතා කරන්න ඕන නැවත නැවතත්. ඉතිං මේකෙදි බොහොම පැහැදිලිවම අපි කියනවා මේ කාලය තුළදී වෙච්ච ඕනම දෙයක් ගත්තම රෙපෙයාර් කරලා දෙන කාලයක් තියෙනවා. ඔබතුමන්ලා හිතන්නේ ඒ අවුරුද්ද දෙක ඇතුළත මෙහේ පෞද්ගලිකව අරගෙන වැඩ කරලා තියෙනවා. ඒක අපිට අලාභයක්. ගරු සභාපතිතුමනි, ඒක අපිට අලාභයක්. ඒ නියමිත වෙලාවට ඒක නොලැබුණ නිසා.

ඊළඟට සියලු දේවල් බලලා නෑ. ඉංජිනේරුවෙක්, ඕන කෙනෙක් බලන කොට විශේෂයෙන්ම මේ ඉංජිනේරු මහත්මයා මෙතනට ඇවිත් බලලා එයා නිර්දේශ කරා කිවුවා. බලන්න ඕන බොහොම පැහැදිලිවම මේ බැකෝ යන්ත්‍රය හදලා ගෙනල්ලා තියෙන කාලය, කොච්චර වියදම් වුණාද මේ බැකෝ යන්ත්‍රය හදන්න. එතකොට එහෙමනම් බොහොම පැහැදිලිවම ඒ කොම්පැනියට දන්වලා හැදීමේ යුතුකමක්, ඒ ගොල්ලන්ට ඒක භාර දීමේ යුතුකමක් තියෙනවා. මේ සියල්ලම පැත්තකට දාන්න. බොහොම පැහැදිලිවම ඒ වාර්තාව අධ්‍යයනය කරන්න. කියලා තියෙන්නේ මේක වැඩ කරන්න පුළුවන් මට්ටමෙන් ගේන්න. හැමදාම අර හෝස් එක ගියා, මේ හෝස් එක ගියා කියලා දඟලන්න එපා කියලා. මේ ඔක්කොම පැත්තකට දාන්න.

ගරු සභාපතිතුමනි, ඉතාම පැහැදිලිව මේ මුදල් කමිටුව නැත්නම් කර්මාන්ත කමිටුව, මේවායෙන් කරන්නේ නිර්දේශයක්. ගෙවීමක් කරන්න කියන්නේ නෑ. බොහොම පැහැදිලිවම නිර්දේශයක්. සභාව තමයි ගෙවන්න අනුමත කරන්නේ. ඒ නිසා සභාවට නොදා විශේෂයෙන්ම මේ වගේ අර්බුදකාරි දේවල් මෙහෙම ගෙවීම සම්පූර්ණ වැරැද්දක්. ඒක පැහැදිලි විගණනයකට යටත් වෙන්න ඕන. මොකද එහෙම ගෙවීම් කිරීමේ කිසිම හැකියාවක් නෑ. මුදල් කමිටුවට, කර්මාන්ත කමිටුවට කරන්න පුළුවන් නිර්දේශයක්. එහෙමනම් ඉතිං පාර්ලිමේන්තුවේ කැබිනට් එක ගත්තම පාර්ලිමේන්තුවෙන්ම වැඩක් නෑ. මේ සභාවල් වැඩක් නෑ. මුදල් කමිටුව, කර්මාන්ත කමිටුව තිබුණම ඇති යන්න. ඉතිං

මේක පමණක් නෙමෙයි මම යෝජනා කරනවා බොහොම පැහැදිලිවම මේ පහුගිය කාලය තුළ මේ සභාව කියාගන්න බැරි ප්‍රශ්නයක් වුණා. ඒක ඒ නියම විදියට අඩාලව කල් නොතියපු නිසා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද හරිද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එදා අඩාලව කල් තිබ්බා ඔබතුමා. විශේෂයෙන් කියන්න තමයි අඩාලව කියන්නේ. කියලා ඉවර වෙලා හරියන්නේ නෑ. ඉතිං ඒක නිසා දැන් ඒක කිවුවනේ. බොහොම පැහැදිලිව මේ කාලය තුළ කිසියම් වූ ගෙවීමක් කරලා තියෙනවා නම් ඒ ගෙවීම නීත්‍යානුකූල නෑ කියලා මම බොහොම පැහැදිලිව කියනවා. ඉතාම පැහැදිලිව. ඒ කියන්නේ වැටුප් ඒවා මේවා නෙමෙයි. වෙන කිසිම ගෙවීමක් කරන්න බෑ. ඒවා නීත්‍යානුකූල නෑ. ඒක ඔබතුමා පෙන්වන්න. අපි හිනා වෙන්න, මේවා කර ගන්න, රණ්ඩු කරගන්න ඕන නෑ. මම කියන්නේ නීත්‍යානුකූල නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා මෙහෙමයි. හැබැයි ඉතිං ඉවරයක් කරන්න මන්ත්‍රීතුමා. දිගටම යන්න බෑ. ඔබතුමා විරුද්ධනම් බෙදීමක් ඉල්ලන්න. ඔබතුමා යන්නේ ඒකටනේ. හරි දැන් කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම බෙදීමක් ඉල්ලන කතාවක් නෙමෙයි. අනේ ඩිංගක් සභාපතිවරයෙක් විදියට හැසිරෙන්නකෝ. මටත් අයිතියක් තියෙනවා කතා කරන්න. බාධා කරන කොට කතා කරන්න බැනේ. සතෙක් වගේනේ හැසිරෙන්නේ. මේකට ඉතාම පැහැදිලිව අපි විරුද්ධයි. අපි බෙදීමක් පවා ඉල්ලනවා. මේ කිසිම ගෙවීමකට අපි අත උස්සන්නේ නෑ. අපි මේකට එකඟතාවයක් නෑ. මොකද ඒක වැරදියි. මොකද කමිටුවකින් කරන්න පුළුවන් නිර්දේශ කිරීම විතරයි. සභාවට නොදා කිසි දෙයක් ගෙවන්න බෑ. ඒක බොහොම පැහැදිලියි නේ. ඒක හින්දා අපි බෙදීමක් ඉල්ලනවා. බොහොම පැහැදිලිව මම නම් විරුද්ධයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි එච්චරයිනේ. බෙදීමක්නේ. හරි ඉවරයි. ඔබතුමා දැන් බෙදීමක් ඉල්ලුවානේ. හරි ඉවරයි. බෙදීමකට යමු. දැන් බෙදීමකට යනවා. ඊට ඉස්සෙල්ලා මම කියන්න ඕන. මේ කතා කරපු කාරණා වලට මම කියන්න ඕන.

බැකෝ යන්ත්‍රයේ රෙපෙයාර් එක අපි දැම්ම අතරේ මේ රෙපෙයාර් එක තිබුණේ නෑ. දාලා මෙහේ ගෙනල්ලා දවස් දෙකක් වැඩ කරද්දි තමයි, මම කියන්නේ එන්ජිමේ රෙපෙයාර් එක නෙමෙයි අනිත් රුපියල් අනු එක්දාහට අදාළ රෙපෙයාර් එක ආවේ ගෙනල්ලා වැඩ කරද්දි කියලා මම බොහොම පැහැදිලිව කිවුවා. ඒක සභාවට දාන්න අවශ්‍ය නෑ. මේ වාහන වල වෙන රෙපෙයාර් එකින් එක සභාවට දාන්න ගියොත් මේ වාහන එකක්වත් වැඩ කරන්න බෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ දාන්න තියෙන විධි ක්‍රමයට දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ඉන්නකෝ. මට මේක කියන්න අරින්නකෝ පැනලා යන්නේ නැතුව. මම කතා කරාට පස්සේ කතා කරන්න. මේකේ ඇයි බැකෝ එක විතරක් සභාවට දාන්නේ. ඒක එක කාරණයක්. අනෙක් කාරණය තමයි අපි ඒ රෙපෙයාර් එක සිද්ධ වෙච්ච වෙලාවේදීම ඉංජිනේරුවරයාට දාලා එතුමාගේ නිර්දේශ අනුව තමයි මිල ගණන් කැඳවලා ඒ අදාළ මිල ගණන ඉංජිනේරුවා පිළිඅරගෙන ඒ අළුත්වැඩියාව කරේ. ඒකේදී අපිට ඉංජිනේරුවරයාගේ දැනුම නෑ. අපිට ඉංජිනේරු දැනුමක් තියේ නම් අපි ඉංජිනේරුවොනේ. ඒක බැරි හින්දා තමයි අපි මෙතන ඉන්නේ. අපිට ඉංජිනේරු දැනුම නෑ. හෙටත් මේ කරපු රෙපෙයාර්වලට අමතරව රෙපෙයාර් එන්න පුළුවන්. සෙනොක් එකට අපි දැම්මේ මේකේ තියෙන ඒවා බලලා කරලා දෙන්න. ඉතිං එයාලා දැකපු දේ තමයි එන්ජිමේ රෙපෙයාර් එක. ඒක කරලා ගෙනල්ලා වාහනය වැඩ කළා. රනින් රෙපෙයාර් තමයි මේ එන්නේ. ඒක තේරුම් ගන්න බැරිනම්, වාහනයේ වැඩ නොකර නිකම්ම තියන්න නම් වුවමනාව, බොරුවට පෙන්නලා අපි මෙච්චර ගාණක් ගෙව්වා, පිට බැකෝ වලට මෙච්චර ගාණක් ගෙව්වා කියලා වෙනම මෙතනට ගෙන්වලා මේ වැඩ කිරීම බකල් කරන්න නම් වුවමනාව එතනින් එහාට මට මේ යන විදියනම් බොහොම පැහැදිලියි. හැමදාම කරේ මෙන්න මේ දේ. මේක මෙතන ලැගලා තියවන්න වුවමනාව. කොයි වෙලාවකවත් එහෙම නෑ. මුදල් කමිටුව

ගන්න තීරණයක් ක්‍රියාත්මක කරන්න පුළුවන්. සභාවකට දාලා අනුමත කර ගන්න ඕන. ඒ නැතත් රුපියල් ලක්ෂ දෙකට අඩු පුනරාවර්තන වියදම් ගෙවීමේ හැකියාව සභාපතිවරයාට තියෙනවා. ඒක මේ සභාව අනුමත කරලා තියෙන්නේ. වෙන සභාවල මීට වැඩියි. රුපියල් ලක්ෂ පහක් දහයක් පුළුවන්. මේ සභාවේ රුපියල් ලක්ෂ දෙකට අඩු ගෙවීම් වලට සභාපතිවරයාට බලය දීලා තියෙනවා. නමුත් අනිත් අයට දැන ගන්න ඕන නිසා තමයි මේකට දාලා ගෙවන්නේ. මම ඕන අභියෝගයක් කරන්න කැමතියි ඔය බැකෝ යන්ත්‍රය පිළිබඳ ඕන පරීක්ෂණයකට අපි එකඟයි. පරීක්ෂණය කරලා ඉවරයි. ඔඩිට් එකෙන් ඇවිත් පරීක්ෂණය කරලා ඉවරයි. ඒක එකක්. අනිත් එක මේක කොයි වෙලාවකවත් අර්බුදකාරි ගෙවීමක් නෙමෙයි. එහෙමනම් මේකේ අනිත් සියලුම ගෙවීමුත් අර්බුදකාරි වෙන්න ඕන. ඔබතුමාට මේකේ හැම ගෙවීමක්ම අර්බුදකාරියි. සභිකවරුන්ගේ තෙල් දීමනා අර්බුදකාරියි. රුපියල් භාරදාහක තෙල් එක පාරට ටැංකියට ගහලා තියෙනවා. රුපියල් තුන්දාහක තෙල් ගහලා තියෙනවා. ඒවා අර්බුදකාරි ගෙවීම් මේකේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒවාට පරීක්ෂණයක් ඉල්ලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඔය තුට්ටු දෙකට වැටෙන්නේ නෑ හැබැයි. ඔබතුමා වැටෙන තුට්ටු දෙකට අපි වැටෙන්නේ නෑ. අනිත් එක මම ගෙවන්න ඕන එක ගෙවනවා. ඒ ගෙවන නිලධාරීන් ගැන මට විශ්වාසයක් තියෙනවා. ඉංජිනේරුවරයා ගැන මට විශ්වාසයක් තියෙනවා. අපේ සභාවේ අනිත් නිලධාරීන් ගැන මට විශ්වාසයක් තියෙනවා. තේරුණාද?. මම හරියට විනිවිදභාවයෙන් දකින දේ මම ගෙවනවා. මොකද මේ ආයතනයට ලගින්න දෙන්න බෑ. ලගින්න ඕන අයට මින් ඉදිරියට මම ලගින්න දෙන්නෙත් නෑ. ඒක බලාපොරොත්තු වෙන මන්ත්‍රීවරුන්ගෙන් මම බොහොම බැගෑපත්ව ඉල්ලනවා මේ කුමන්ත්‍රණයට අහුවෙන්න එපා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමාට අනිත් ඔක්කොම විශ්වාසයි. සභාවේ ඉන්න සභිකයෝ විශ්වාස නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභිකයෝ විශ්වාසයි. නමුත් එක්කෙනෙක් දෙන්නෙක් ඉන්නවා මේක සම්පූර්ණයෙන්ම අවුල් කරනවා. ඒක ගැන මම කියන්න ඕන. ඒක නම් කර ගන්න. එක්කෙනෙක් දෙන්නෙක් ඉන්නවා සභාව සම්පූර්ණයෙන් අවුල් කරන. ඒක කට්ටියට තේරෙයි. මේකේ උපක්‍රමශීලිව එකක් පෙන්වලා එකක් කරනවා. ආණ්ඩුකාරයාට දීපු ලියුමේ පවා දින වෙනස් කරලා, අත්සන් නොකර තියෙන්නේ. මේ කියාස් මන්ත්‍රීතුමා මට ප්‍රකාශයක් දුන්නා. කියාස් මන්ත්‍රීතුමා බොහොම පැහැදිලිව මට ප්‍රකාශයක් කරා. මම අත්සන් කරේ මාස ගාණකට කලින්. අද ඊයේ අත්සන් කරපු එකක් නෙමෙයි සභාපතිතුමා කියලා කිවුවා. මාස ගාණකට කලින් අත්සන් කරපු එකක් තමයි දාලා තියෙන්නේ. මම ඕන තැනක ඕන පරීක්ෂණයකට ලෑස්තියි කියලා මට එතුමා කිවුවා. විපක්ෂ නායකතුමා, නැත්නම් නැහැයි කියන්න එතුමා. අල්ලස් හා දූෂණ ඕනම පරීක්ෂණයකට මෙතුමා එකඟයි කියලා කිවුවා. එහෙම කඩාකප්පල් කරන සභාවක් මේක. මන්ත්‍රීවරුන්ව බොරුවට බොරු දේවල් පෙන්වලා, මම ඉතා වගකීමෙන් කියනවා එක රුපියලක වංචාවක් වෙලා තියෙනවානම් මම සභාපතිධුරයෙන් අයින් වෙනවා. මම වගකීමෙන් කියන්නේ.

මේකේ මන්ත්‍රීවරු සමහරුන්ට මෙතන එක්කෙනෙක් දෙන්නෙක් කිවුවොත්, දෙන්නෙක් කිවුවොත් වැරදියි ඇත්ත කතාව. මෙතන එක මන්ත්‍රීවරයෙකුගෙන් දේවල් ඉෂ්ට කර ගන්න බැරි වුණාම අපිට කතා කරලා කියනවා. මෙන්න මේක කරන්න දෙන්නේ නෑ මෙන්න මෙයා මෙච්චර ඉල්ලනවා කියලා. ඒකයි තත්ත්වය. එහෙම කරන කොට මම කියලා තියෙන්නේ කාටවත් එක රුපියලක් දෙන්න බෑ කියලා. නමුත් හිටපු සභාපතිවරුන් හෙල්මට් අස්සේ සල්ලි දමාගෙන ගියපු කාලයක් තිබුණා. මේ දිල්රුක් අබේකෝන් ඉන්නකම් මේකේ වංචා කරන්න, මාව ගොනාට අන්දලා ගිනැන්ස්කාරයොන්ගෙන් හම්බ කරන්න, අනෙත් අයගෙන් හම්බකරන්න මම දෙන්නේ නෑ. ඔන්න ඕක තමයි දිල්රුක් අබේකෝන්ට තියෙන ප්‍රශ්නය. තියෙන අභියෝගය ඒකයි. ඒ ඕන එකකට මම මුහුණ දෙන්න ලෑස්තියි. මම මේක දාලා යන්න වුනත් ලෑස්තියි හෘද සාක්ෂියට එකඟව.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, මුදල් කමිටුව පිළිබඳව දැන් සාකච්ඡා කරා. මේක නීත්‍යානුකූලයි කියලා ඔබතුමාලගේ පාර්ශවයෙන් කියනවා. මම දන්න නීතිය

එක්ක කමිටුවලට තියෙන බලය වන්නේ නිර්දේශ කිරීමේ හැකියාව. ඒ හින්දා මේකේ ඡන්දය පාවිච්චි කිරීමේදී අපි හැසිරෙන්නෙත් ඒ විදියට. හැබැයි ඒ සියලු වගකීම් මුදල් කමිටුව, ලේකම්වරයා භාරගන්න මොනවා හරි ප්‍රශ්නයක් වුනොත්. ඒ අධිභාරයෙන් ශත පහක්වත් මම ගෙවන්නේ නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මට ප්‍රකාශයක් කරන්න ඕන. සභාව තිබුණේ ගිය මාසේ විසිවෙනිදා. විසිවෙනිදාට පස්සේ විසි එක්වෙනිදා නැත්නම් විසි දෙක වගේ දවසක මට ඔබතුමාව හමු වුණා. ඒ වෙලාවේ ඔබතුමා මගෙන් ඇහුවා මේ ලියුමට අත්සන් කරාද කියලා. මම කිවුවා නෑ කියලා. ඔව් ඇත්ත කඩාකප්පල් වුණ සභාවට පස්සේ මම ලියුමකට අත්සන් කරේ නෑ. නමුත් ඒ අත්සන මගේ. හේතුව ඒ අත්සන මගේ වුණාට ඒක මීට කලින් චෝදනා පත්‍රයකට ගහපු එකක් වෙන්න ඇති. නමුත් ඔබතුමා මගෙන් ඇහුවේ මේ සභාවෙන් පස්සේ ලියුමකට අත්සන් කරාද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එකක් අහන්නද, ඔබතුමා මේක අත්සන් කරේ ආණ්ඩුකාරයාට මට විරුද්ධව ලියපු ලියුමකටද?, ඔබතුමා අත්සන් කරත් නොකරත් මට ප්‍රශ්නයක් නෑ. ඔබතුමාගෙන් මම ඇහුවේ ඔබතුමා මට විරුද්ධව ආණ්ඩුකාරවරයාට හදපු ලියුමට අත්සන් කරාද නැද්ද කියලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමා ආණ්ඩුකාරතුමා ළඟට ගියාද, ආණ්ඩුකාරතුමා යවපු ලියුමට අත්සන් කරාද කියලා ඇහුවා. මම ආණ්ඩුකාරතුමා ගාවට ගියේ නෑ. ආණ්ඩුකාරතුමාට යවපු ලියුමට අත්සන් ගැහුවෙත් නෑ. හැබැයි ආණ්ඩුකාරතුමාට මේ ලියුම විතරක් නෙමෙයි ලියුම් කීපයක් ලියලා තිබුණා මේ සභාවෙන්. මේ මීට කලින් ගහපු ලියුමක් වෙන්න ඇති. මගේ අත්සන තමයි ඒක. නමුත් සභාවේ අරක වෙච්ච දවසට පස්සේ නෙමෙයි අත්සන් කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හරි මේ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** දිනය බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දිනය මම දන්නේ නෑ. දිනය කුරුටුගාලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක වෙන්න ඇති ඒ සභාවට පස්සේ අත්සන් කරේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මන්ත්‍රීවරු කවුරුත් දැන ගන්න ඕන. ඔබතුමා ළඟ මේකේ දහයක් විතර ගහලා ඇති නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දහයක් විතර ගහලා තියෙනවා. පොඩ්ඩක් ඉන්න.

ගරු සභාපතිතුමනි, චෝදනා ගණනාවක් තියෙනවා. ඒ නිසා මට ඒවාට උත්තර දෙන්න කාලයක් ඕන. බොහොම පැහැදිලිව මේ ලියුම ගැන ඉස්සෙල්ලා කතා කරන්නම්. මම අහනවා බොහොම පැහැදිලිව මේ ලියුම කාටවත් නෙමෙයි හිටපු ආණ්ඩුකාරතුමාට ලිව්වේ. දවස් දෙකක් පහු වුණා මේ ලියුම දෙන්න. මොකද අනිත් අයගේ අත්සන් ගන්නකම්. හැබැයි ඒ අතරේ ආණ්ඩුකාරතුමා මාරු වුණා. මාරුවුණාම කරන්න තියෙන එකම දේ, මේ තියෙන චෝදනා ඔක්කොම එකයි. ඒකේ කිසි දෙයක් නෑ. මේක ඉතාම පැහැදිලිව මම දැන් අහනවා නමින් නම බොහොම පැහැදිලිව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ අවශ්‍ය නෑ. මම කිවුවේ කියාස් මන්ත්‍රීතුමා ගැන විතරයි. අනිත් අය ගැන කිවුවේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මට චෝදනාවක් කරා.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මටත් මේ ගැන කතා කරන්න ඕන. මටත් කෝල් කරා. මම මේකට අත්සන් කරාද කියලා කාංචනා මන්ත්‍රීතුමිය කතා කරලා ඇහුවා. මම කිවුවා

මගේ ටීම් එකේ ලියුමට මම අත්සන් කරා කියලා. සභාපතිතුමත් කිවුවා කියලා කිවුවා මම මේකට අත්සන් කරලා නෑ කියලා. අනිල් බන්දුතිලක මන්ත්‍රීතුමයි, මමයි අත්සන් කරලා නෑ කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** කියාස් මන්ත්‍රීතුමාගෙන් විතරයි මම ඇහුවේ. මම ඔබතුමියගෙන් ඇහුවේ නෑ නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ః-** කරුණාකරලා මම ඉල්ලීමක් කරනවා අපේ මන්ත්‍රීවරුන්ගෙන් මේ ලියුම දැකලා, කියවලා අත්සන් කරපු මන්ත්‍රීවරු ඉන්නවානම් කරුණාකරලා අත උස්සලා කියන්න අපි මේකට අත්සන් කරා කියලා. විජේසිංහ මන්ත්‍රීතුමා කියාගෙන යන්න. ඔබතුමාලා අත්සන් කරලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** අපේ මන්ත්‍රීවරු දෙන්නා කියවලා බලලද අත්සන් කරේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ః-** කියවලා බලන්නේ නැතුව අත්සන් කරනවාද. අපහාස කරන්න එපා මන්ත්‍රීවරුන්ට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** නෑ. අපේ මන්ත්‍රීවරු දෙන්නා අපිට කිවුවේ කියවලා බලලා නෙමෙයි කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ః-** ලියුමකට අත්සන් කරනවානම් ඒක කියවලා කිරීම මගේ වගකීමක්. ඒ වගකීම මම ගන්නවා අත්සන් කරා කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ః-** ගන්න ඕන නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** එතකොට කියාස් මන්ත්‍රීතුමත් එහෙමයිනේ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** එතුමාට උත්තර දෙන්න අරින්නකෝ. ඇයි පනින්නේ. බලපෑම් කරන්න එපා. මේ තමන්ගේ කණ්ඩායමේ අයටත් තර්ජනය කරලා උත්තර ගන්න තත්ත්වයක් මේ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ః-** තර්ජනය කරේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** නැත්නම් තර්ජනය කරලානේ යන්නේ. මම ඔබතුමන්ලාගෙන් අහන්නේ මෙච්චරයි. ඔබතුමා ආණ්ඩුකාරවරයාට ලියපු ලියුමකට අත්සන් කරාද? නැද්ද?.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ః-** ආණ්ඩුකාරතුමාට ලියපු ලියුමකට අත්සන් කරා. නමුත් මම ඔබතුමාගේ එකට නෙමෙයි අත්සන් කීපයක් ගහලා ඇති.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ః-** ආණ්ඩුකාරයාට ගහලා තියෙන්නේ එකයි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ః-** ඔබතුමා මගෙන් ඇහුවේ, මේක ආණ්ඩුකාරතුමා ගාවට ගිහින් තියෙනවා ප්‍රාදේශීය සභාවෙන් පස්සේ ආණ්ඩුකාරතුමා හමුවෙන්න කට්ටියක් ගිහින් තියෙනවා. ගිහිල්ලා ලියුමක් භාර දීලා තියෙනවා. ඒ ලියුමට අත්සන් කරාද කියලා ඇහුවේ. මම කිවුවා මම ඒ ලියුමට අත්සන් කරේ නෑ. ඊට කලින් ලියුමකට අත්සන් කරලා තියෙන්නේ කියලා. එදා සිද්ධිය වුණාට පස්සේ මම අත්සන් කරේ නෑ. ඒක නිසා එතකොට මේ ලියුමේ දිනය පොඩ්ඩක් වෙනස් කරලා දාලා තියෙනවා. එච්චරයි වෙලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ః-** ආණ්ඩුකාරතුමාට ලියලා තියෙන්නේ එක ලියුමයි. හරයේ කිසි වෙනසක් නෑ. මේ එකක්වත් මකලා නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** මෙච්චර යන්න ඕන නෑ. මාධ්‍ය ඉන්නවා. මම මෙතුමාගෙන් ඇහුවා, අපේ ගෙදරට මෙතුමා ආවා. ඇවිල්ලා ප්‍රකාශය දුන්නේ. මාධ්‍ය ඉන්නවා. මම ඇහුවා. වොයිස් රෙකෝඩ් එක දෙන්නම්. එතුමා කිවුවා මම ඔබතුමාට විරුද්ධව කිසි එකකට අත්සන් කරේ නෑ, විශේෂයෙන් ආණ්ඩුකාරතුමාට ලියපු ලියුමකට මම අත්සන් කරේ නෑ කියලා. මම ඕන පරීක්ෂණයකට ලෑස්තියි කිවුවා. ව්‍යාජ අත්සන් යොදලා තියෙනවානම් සී.අයි.ඩී පරීක්ෂණයකට

වුණත් ලැස්තියි කිවුවා. මෙන්න තියෙනවා වොයිස් රෙකෝඩින් එක. ඔබතුමාට දෙන්නම්. හරි ඒක එතනින් ඉවරයි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** සභාපතිතුමා, ඒක එහෙම ප්‍රසිද්ධ කරන්න එපා. ඒක සාදාචාරාත්මක නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එදා නවත්තපු සභාවෙන් පස්සේ මම කිසිම එකකට අත්සන් කරේ නෑ කියන එක පැහැදිලිව ඇති. ඒක මතක තියා ගන්න. රෙකෝඩින් එකේ ඇති. මාධ්‍යයට මම කියනවා එදා පවත්වපු සභාවෙන් පස්සේ මම ලියුමට අත්සන් කරේ නෑ කියන එක. ඒක ඒ රෙකෝඩින් එකේ ඇති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම එකක් නෑ. අපි මෙතනින් එහාට යන්න ඕන නෑ. මේක දෙන්නම්. දෙන්න ඕන ඒක. ඔබතුමා කිවුවේ ආණ්ඩුකාරතුමාට අත්සන් කරේ නෑ කියලා මට විරුද්ධව. මෙන්න මේක මම කියන්න ඕන. මේක වැරදි විදියට හිතාවි. වෙච්ච දේ මම කියන්නම්කෝ. වෙච්ච දේ කියන්න ඕන නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාවේ ක්‍රියාකාරකම් සම්බන්ධව තමයි පරීක්ෂණයක් ඉල්ලලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක අහන්නකෝ. මට එහෙම අහන්න අවශ්‍යතාවයක් නෑ කවුරු අත්සන් කළාද කියලා. හැබැයි මෙහෙම ප්‍රශ්නයක් තිබුණා. මම කොළඹ හිටියේ. මෙතුමාගේ යෝජනා සංශෝධනයකට මගේ අත්සන් ගන්න තිබුණා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මොන යෝජනාවක් ද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක් හරි යවන යෝජනාවකට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මොකක්ද යෝජනාව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට දැන් මතක නෑ මන්ත්‍රීතුමා. ඔබතුමා වෙනම අහන්න මම ඒකට උත්තර දෙන්නම්. ඒ පාර මම කිවුවා කොළඹ ඉන්නේ කියලා. ඒ පාර ඊට පස්සේ දවසේ මෙතුමා උදෙන්ම අපේ ගෙදර ආවා. මම එදා රෑ දන්නවා මෙහෙම ආණ්ඩුකාරතුමාට ලියුමකට අත්සන් කරා කියලා. මෙතුමා ගෙදරට උදේ ආපු වෙලාවේ මම ඇහුවා. නෑ නෑ මුකුත් අත්සන් කරේ නෑ කිවුවා. කිසිම එකකට මම අත්සන් කරලා නෑ කිවුවා ඔබතුමාට විරුද්ධව.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මේක ආණ්ඩුකාරතුමාට යොමු කරපු කාරණයක් පිළිබඳ පරීක්ෂණයක් යන සිද්ධියක්. තාම පරීක්ෂණයවත් ඉවර නෑ මේකේ. ඒක නිසා මේක මේ සභාවේදී කතා කිරීම, සභාවේදී ඒකට අයුතු බලපෑමක් කිරීමක් විදියටයි අපි දකින්නේ. ඒ නිසා මේකට ඔබතුමාලා චෝදනා යොමු කරලා තියෙනවා ආණ්ඩුකාරතුමාට. තාම පරීක්ෂණය යනවානේ මන්ත්‍රීතුමා. හෙටත් ආණ්ඩුකාරතුමා කැඳවලා තියෙනවානේ. ආයෙත් මේක සභාවේ කතා කරන්න බෑ. අරයා අත්සන් කරාද, මෙයා අත්සන් කරාද කියලා අහන්න බැහැ. ඒක වැරදියි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** දැන් මෙතන මාත් මේකට අත්සන් කරලා තියෙනවා. හැබැයි මේක අත්සන් කරන්න ඉස්සෙල්ලා අපි මේක සාකච්ඡාවට බඳුන් කරලා තියෙනවා. හොඳට හිතලා බලලා තමයි අත්සන් කරේ. එක පාරට මම අත්සන් කරන්න බෑ කිවුවා. කිවුවා නේද මන්ත්‍රීතුමා. හැබැයි ඊට පස්සේ දිගින් දිගටම සාකච්ඡාවන් යනකොට මේකට මම අත්සන් කරා. හැබැයි අත්සන් කරන්න හේතුව දන්නවාද. මම එක සභාවක ඉඳලා අධිහාර ගෙවපු කෙනෙක්. තව අත්සන් කරන්න මන්ත්‍රීවරු හිටියා. ඒක ඔබතුමාලා දන්නවානේ. වීදුරු ටිකක් සභාවෙන් අරගෙන ඉවර වෙලා, ඒක සභාවෙන් ගෙනල්ලා තියෙන්නේ. ඒකට රුපියල් හතළිස් හත්දාහක්, හතළිස් පන්දාහක් විතර ගෙවන්න වුණා. එහෙම වෙච්ච කෙනෙක් මම.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** හිටපු සභාපතිතුමෙක් තෑගිත් දුන්නා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමා විතරක් නෙමෙයි මෙතන සභාවේ ඉන්න මන්ත්‍රීවරුත් ඉන්නවා ඒ වීදුරු රුපියල් පහ ගාණේ අරගෙන තෑගි බෙදුවා. තෑගි නෙමෙයි සමහරු බෝගහ යට දාලා ගාල්ලේදී වික්කා. සභාවෙන් ගෙනාපු වීදුරු. දැන් ඒකනේ මතු කරේ.

(සභාව ඝෝෂාකාරී විය)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** මම 2002 ඉඳන් සභාවේ ඉඳලා තියෙනවා. මේකේ ඕන තරම් සභාපතිවරු ඉඳලා තියෙනවා. ඔබතුමා මේ හැසිරෙන විදිය මම ජීවිතේටම දැකලා නෑ. ඔබතුමා මන්ත්‍රීවරුන්ව තුට්ටුවට දාලා කතා කරන්නේ. පහුගිය කාලේ සිද්ධ වෙච්ච දේවල් ගත්තොත් මට ගේන්න පුළුවන් ඔබතුමාටත් පට්ට යන්න. මතක තියා ගන්න සභාපතිතුමනි, ඔබතුමා දැන් මෙතනදී කිව්වා මට, රෑ මම කොළඹ ගියා මට කෝල් කරලා කිව්වා උදේ ආවා මට කිව්වා ආණ්ඩුකාරතුමා ගාවට කට්ටිය ගියා ඔබතුමාගේ කටින්ම දැන් කිව්වා. ඔබතුමාට කොළඹදී ආරංචි වුණා කට්ටිය ආණ්ඩුකාරතුමා ගාවට ගිහින් ලියුමක් දුන්නා කියලා. එතකොට මම කිව්වේ ඒකට මම ගියේ නෑ අත්සන් කරේ නෑ කියලා. ඒක මතක තියා ගන්න. අරගෙන බලන්න. රෙකෝඩින් එකේ ඇති ඒක. එතකොට මම ආණ්ඩුකාරතුමාට යවපු ලියුම් එකකට නෙමෙයි ගාණකට අත්සන් කරලා තියෙනවා. ඔබතුමා බොරු කියන්න එපා. පහුගිය කාලේ මාර්ෂල් ආණ්ඩුකාරතුමා ඉන්න කාලේ ආණ්ඩුකාරතුමා ගාවට ගිහින් අපි පරීක්ෂණයක් කළා. ඒ ආණ්ඩුකාරතුමාට යවපු ලියුමටත්, අත්සන් කරලා තියෙනවා. ඒ කියන්නේ ගරු සභාපතිතුමනි මේ ලියුම සභාවේ තිබුණ යෝජනා වගයක් සංශෝධනය කරලා පළාත් පාලනයට ඉක්මනට ගේන්න කිව්වා. ඔබතුමා සභාවේ හිටියා. මම සභාපතිතුමාට කිව්වා ලියුම සංශෝධනය කරලා ගෙනියන්න ඕන කියලා. එතකොට වෙලාව එකොළහයි තිහට, දොළහට විතර ඇති. ඔබතුමා කිව්වා මම එකට කොළඹ යන්න ඕන කිව්වා කියලා. ඔබතුමා කිව්වා මම කොළඹ යනවා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා කැඳවලා, ඒකට කොළඹ යනවා කියලා කිව්වා. මම කිව්වා ඒ ලියුමට කොහොම හරි අත්සන්කරලා යන්න කියලා. කමක් නෑ රෑ වෙලා එන්න කිව්වා කෝල් එකක් දීලා. ඊට පස්සේ එදා රෑ මම ඔබතුමාට කෝල් එකක් දුන්නා. ඔබතුමා කිව්වා මම තාම ඉන්නේ කොළඹ තාම ආවේ නෑ කියලා. එතකොට රෑ නවයට විතර ඇති. මම කිව්වා එතකොට උදේ පාන්දර එන්නම් කියලා. මගේ පෞද්ගලික දේකට ඔබතුමා ගාවට ආවෙත් නෑ, මම ආවේ සභාවේ තිබුණ යෝජනාවකට ලියුමක් අරගෙන පළාත් පාලනයෙන් එදාම එන්න කියපු නිසා. එතකොට මම ලියුම අරගෙන තෙමි තෙමී ගියේ. එදා වැස්ස. මම මෙතුමාලාගේ ගෙදර ගියා. වාඩිවෙච්ච ගමන් මෙතුමා කිව්වා මට මේ ලියුමට අත්සන් කරන්න බෑ කියලා. මම ඇහුවා මොකද කියලා. දැන් ඔයා ආණ්ඩුකාරතුමා ගාවට ගිහින් තියෙනවා කිව්වා. ලියුමකුත් අත්සන් කරලා දීලා තියෙනවා කිව්වා. එතකොට මම කිව්වා මම මේ සභාවෙන් පස්සේ ආණ්ඩුකාරතුමා ගාවට ගියෙත් නෑ. ඒ ලියුමට අත්සන් කරෙත් නෑ කියලා. ඔබතුමා කිව්වේ ඒ රෑ කියපු ආණ්ඩුකාරතුමාගේ සිද්ධිය. මම එතනදි කිව්වේ සභාවෙන් පස්සේ මම ලියුමකට අත්සන් කරෙත් නෑ මම ආණ්ඩුකාරතුමා හමුවෙන්න ගියෙත් නෑ කියලා. එහෙම තමයි රෙකෝඩින් එකේ ඇත්තේ. මම එහෙම තමයි කියලා ඇත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මේක නවත්වමු සභාවෙන් පස්සේ කතා කරමු.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** ඒක නිසා ගරු සභාපතිතුමනි, ඊට පස්සේ ඔබතුමා තව තව දේවල් කතා කරන්න ගත්තා. වීදුරු ගැන කතා කරන්න ගත්තා. මම මේ සභාවේ වීදුරු අරගෙනත් නෑ. මම මේවා කරගෙනත් නෑ. මම ෆිනෑන්ස් ආයතනවලින් ශත පහක් අරගෙනත් නෑ මේ වන තෙක්. මම කුණු ගාගෙනම නෑ මේ සභාවේ. මම කිසි කෙනෙක්ගෙන් ශත පහක්වත් ගන්න කෙනෙක් නෙමෙයි. ගත්තා කියලා ඔප්පු කරොත් අද ලියලා දීලා සභාවෙන් අස්වෙනවා මම. කවුරුහරි මම ගැන චෝදනා පත්‍රයක් හරි, චෝදනාවක් කියලා තියෙනවානම් මෙන්න මෙයා මෙච්චරක් අරන් තියෙනවා කියලා කිව්වොත් ඒත් ඇති මට. ඒවගේ ගන්න කෙනෙකුත් නෙමෙයි මම. මම කියලා තියෙනවා සභාවේ හොඳ දේවල් වලට මම උදව් කරනවා. වැරදි දේවල් වලට මම උදව් කරන්නේ නෑ. ඒ මතයේ මම හිටපු එක්කෙනෙක්. මම පළාත් පාලන නීතිය දන්නවා. මම ඔක්කොමත් දන්නවා. සමහර වෙලාවට පක්ෂයත් එක්ක එකඟ වෙලා තීන්දු ගන්න වෙනවා. එහෙම දේවල් වෙනවා. ගරු සභාපතිතුමා ඔබතුමා මේ සභාවේදී කියපු කතා දැක්කම දැන් මේ කතා කරපු එක, එතුමා විතරක් නෙමෙයි මාත් එක්ක හිටපු තව සහෝදර මන්ත්‍රීවරු ඉන්නවා. ඒ මන්ත්‍රීවරුන්ව හැල්ලුවට ලක් කරනවා ඔබතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** නෑ. නෑ. එතුමාව මතු කර ගත්තේ මම නෙමෙයි. මෙතනින් මතු වුණේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** මේක අහගන්නකෝ. සභාපතිතුමා ඒක කිව්වේ. ඒකත් මම කියන්නම්. සභාවේ අර වීදුරු ප්‍රශ්නය කිව්වේ සුගත් මන්ත්‍රීතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** නෑ. නෑ. ඔබතුමා වැරදියට තේරුම් ගන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** පොඩ්ඩක් ඉන්න. ඒ ප්‍රශ්නය ගියපු වෙලාවේ අන්තිම මොහොතේදී වීදුරු ටික වෙන්දේසි කරන්න කියලා අනුමැතිය දුන්නා ඔඩිට් එකෙන්. ඒ වීදුරු විකුණන්න කිව්වා. ඒ දවස්වල අපේ සභාවේ මන්ත්‍රී කෙනෙක්, එයා නෙමෙයි එයාගේ හිතවත්

කෙනෙක් වීදුරු ටික අරගත්තේ. අපි ගත්තේ නැත්නම් ඒක වෙන කවුරුහරි එක්කෙනෙක් හරි ගන්නවා. කවුද මම දන්නේ නෑ එක්කෙනෙක් ගත්තා. ගත්ත මනුස්සයා ඒ මහජන නියෝජිතයාට වීදුරු කීයක් හරි දීලා ඇති හිතවත් අයට දෙන්න කියලා. ඒක නීතිවිරෝධී වැඩක් නෙමෙයිනේ. ඒක ගත්තේ මන්ත්‍රීවරයෙක්වත් නෙමෙයි. මන්ත්‍රීවරු ගත්තේ නෑ. ගත්තේ වෙන කෙනෙක්. අරගෙන මන්ත්‍රීතුමන්ලාට දීලා ඇති සමහර විට. එතුමාගේ නම කිව්වා. එතුමා එහෙම කරපු එක්කෙනෙක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කවුද කිව්වේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමානේ කිව්වේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම නෙමෙයි ලියනගේ මන්ත්‍රීතුමා කිව්වේ එතුමාගේ නම. ඕක දැන් නවත්වන්න. මම නෙමෙයි කිව්වේ. මම ඒ නම මතුවෙච්ච හින්දා තමයි කිව්වේ එතුමා විතරක් නෙමෙයි, එතුමා ඒක එක එක්කෙනාට තෑගි බෙදුවා කිව්වා. මම කිව්වා එතුමා විතරක් නෙමෙයි මෙතන ඉන්න තවත් මන්ත්‍රීවරු එහෙම බෙදුවා කියලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, කවුරුහරි වීදුරු ටික වෙන්දේසියේදී ගත්තා. ගත්ත මනුස්සයා හිතවත් කමට වීදුරු ටිකක් දීලා ඇති.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** තප්පරයක් දෙන්න. මන්ත්‍රීවරුන්ගේ ප්‍රකාශත් එක්ක හිටපු සභාපති එතුමාගේ කීර්තිනාමයට හානියක් වෙනවා. මේවා සභාගත වෙනවා. එතුමා විශ්‍රාම සුවයෙන් ඉන්නේ සභාපති ධූරය අතඇරලා. ඉතාමත්ම ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. අපි ගරු කරනවා. අදහස් ප්‍රකාශ කිරීමේදී එතුමාගේ නම පිටවුණා. ඒක ඉතාමත්ම එතුමාගේ ජීවිතයට අවමානයක් වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතන නැති නිසා එතුමාට උත්තර දෙන්නත් බෑ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒ නිසා ඒක සභා වාර්තාවෙන් ඉවත් කර ගන්න. ඒක කිසිසේත්ම වාර්තාවට ඇතුළත් කරන්න එපා.

(සභාව ඝෝෂාකාරී විය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම චෝදනා කෙරුවේ නෑ. මම පද්මසේන මහත්තයාගේ නම කිව්වේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** තමුන්නාන්සේ තමයි කිව්වේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කිව්වේ නෑ එතුමාගේ නම. ඔබතුමා හැමවෙලේම කොනේ කඩේ හම්බයා වගේ මගේ පිටින් දාන්න යන්න එපා.

(සභාව ඝෝෂාකාරී විය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වෙච්ච දේ ආයේ පැහැදිලි කරලා දෙන්නම්. මේ සුගත් මන්ත්‍රීතුමා කිව්වේ ඒ වීදුරු කතාව. ඊට පස්සේ ලියනගේ මන්ත්‍රීතුමා තමයි, එතුමා හිතලා නෙමෙයි විහිළුවට කිව්වා එතුමා නම් ගෙදරට එන අයටත් අවුරුද්දට බෙදුවා කියලා. ලියනගේ මන්ත්‍රීතුමා කිව්වේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එතුමා කිව්වේ පහුගිය දවස්වල වීදුරු සම්බන්ධ පරීක්ෂණයක් ගියා. ඒ පරීක්ෂණයට මැදිහත් වෙන්න වුණා කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එහෙම අධිභාරයක් ගෙවන්න ප්‍රශ්නයක් වුණා කියලා කිව්වේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව් ඒක කිව්වා.

(සභාව ඝෝෂාකාරී විය.)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** දැන් මෙතන ඉදිරිපත්වුණා ඔබතුමාට විරුද්ධව ලේඛනයක් ආණ්ඩුකාරතුමාට ඉදිරිපත් කරා කියලා. පැහැදිලිව මම කියන්න ඕන ඒ ලේඛනයට අපි අත්සන් කරලා නෑ. හැබැයි අපි ඒකෙදි කිවුවා පැහැදිලිව යම් අක්‍රමිකතාවයක් වෙලා තියෙනවානම් සභිකයෝ හැටියට අපිටත් වග කියන්න වෙනවා. ඒ නිසා ඒ වෙනුවෙන් අපි ඕනම වෙලාවක පෙනී හිටිනවා. ඒ පෙනීහිටීම තුළ තමයි අපි ආණ්ඩුකාරතුමා ළඟට ගියේ. ඒ ගියේ ඒ වෙනුවෙන්. එතකොට අපි මේකේ යම් කටයුත්තක් සිද්ධ කරන කොට නීතිමය ප්‍රශ්නයක් හෝ සභිකයින්ට වෙන ප්‍රශ්නයක් හෝ ජනතාවට වෙන ප්‍රශ්නයක් හෝ ඒ ඕනම දේකට නීත්‍යානුකූල පදනම ඇතුලේ අපි මැදහත් වෙනවා. ඒ නිසා තමයි මේ ප්‍රශ්නය මතු වෙලා තියෙන්නේ. විශේෂයෙන්ම මේ ප්‍රශ්නය සභාව තුළ පහුගිය කාලේ සිද්ධ වෙච්ච කටයුතු සම්බන්ධයෙන් අපිට එකඟතාවයක් වෙන්න බැරි කටයුතු ගොඩක් තියෙනවා. ඒ හින්දා අනුමත නොකරපුවා තියෙනවා. අයවැයේදී මේ ප්‍රශ්නය මතු වුණා. මේ ලියුමට මුල් වුණ සිද්ධියේදීත් ඔබතුමාට පාර්ශවයන් ගොඩක් විරුද්ධ වෙන්න හේතුවත් ඒක තමයි. ඔබතුමා මෙතන ඉන්න හැමෝටම සභිකයෙක් විදියට එක සමානව සලකන්න පුරුදු වෙන්න ඕන. දේශපාලන පක්ෂ වලින් බලය නැති අය විපක්ෂය වෙන්න පුළුවන්. නමුත් ඒ පක්ෂ විපක්ෂ භේදයකින් හෝ මතවාදීව ගැටුණත් මේ සභාව ඇතුලේ ඔබතුමා මූලාසනය, සභාපතිවරයා. ඊට අමතරව උප සභාපතිවරයෙක් ඉන්නවා. ඊට අමතරව අධ්‍යක්ෂ මණ්ඩලයක් වගේ සභිකයෝ කණ්ඩායමක් ඉන්නවා. මත ගැටුම් තියෙන්න පුළුවන්. බහුතරය එකඟ වෙන්න පුළුවන්. තව කොටසක් විරුද්ධ වෙන්න පුළුවන්. හැබැයි අපිට තියෙන්න ඕන සංයමයක්. තාර්කිකභාවයක්. මොනවා හරි එකඟතාවයක් හෝ විරුද්ධ වෙන්න හේතුවක්. අපි එක එක්කෙනාට ඒක වෙනස් විදියට තියෙන්න පුළුවන්. ඒක දරාගන්න, ඉවසගන්න පුළුවන්කම තියෙන්න ඕන. සභාවක් හැටියට කටයුතු කරද්දී අපි එක එක්කෙනා මතවාදීව ගැටෙනවා. ඒක ප්‍රශ්නයක් නෑ. එහෙම ගැටෙන්න ඉඩකඩ දෙන්න. ඒ නිසා මම කියන්නේ ගෙදර ගිහිල්ලා රණ්ඩුවෙලා විසඳගන්න බැරි ප්‍රශ්න වෙන්න බෑ. අපි අවුරුදු හතරකට මෙතනට එන්නේ. ඒ නිසා කරුණාකරලා ඒ කාරණා මතු වුණේ, දිගින් දිගට මතු වුණ හේතු ගණනාවක් තියෙනවා. ඒ නිසා අපි ආණ්ඩුකාරයාට ගියපු ලියුම සම්බන්ධව අපි එතනට මැදිහත් වුණා. වගකීමෙන් මැදිහත් වුණා. ඒ වගකීමත් භාර ගන්නවා. හේතුව වුනේ අපි කිවුවා මේ සභාවේ සිදුවුණ යම් අක්‍රමිකතාවයක් සම්බන්ධව හෝ දූෂණයක්, වංචාවක් තිබුණානම් ඒකට පරීක්ෂණයක් තියන්න අපි එකඟයි.

(සභාව සෝෂාකාරි විය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා මගෙන් අහන්නේ මොකක්ද?. මොකක්ද මගෙන් අවශ්‍ය උත්තරය.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අවශ්‍ය උත්තරය මොකක්ද නෙමෙයි. උත්තරය ඔබතුමාගේ. තාම ප්‍රශ්න කරනවා. මේ සභාව අක්‍රමවත් වුණේ, මේ සභාව ගෙනියන්න බැරි වෙලා තියෙන්නේ ඔබතුමා සභාපති විදියට සභාවේ හැමෝටම සලකන්නේ නැති නිසා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක නෙමෙයි මන්ත්‍රීතුමා, ඇඟිල්ල දික් කරලා ඒක කියන්න එපා මන්ත්‍රීතුමා. ඔබතුමාගේ හෘද සාක්ෂිය දන්නවා ඇති. මේකේ අයවැය පිළිබඳ ප්‍රශ්නය ආවා. කමිටු රැස්වීමේ ප්‍රශ්න ආවා. ඔක්කොටම ඇල්ලුවේ කොන්.

(සභාව සෝෂාකාරි විය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නමුත් මම ඔබතුමාට කිවුවානේ. ලේකම්තුමාට මම කිවුවා. සම්පූර්ණයෙන්ම අයවැය මෙතුමා කියන විදියට හදන්න කියලා. කිවුවේ නැද්ද?.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ ඔබතුමා කට වචනයට කිවුවේ. එහෙම හරියන්නේ නෑ. ඒක අපිට වගකීමක් විදියට දෙන්න ඕන. එහෙම බෑ. ඒක ඔබතුමා කටවචනයට ඉදිරිපත් කරපු කතාවක්. ඒක මෙතනට ඉදිරිපත් කරන්න එපා අසාධාරණයි. වගකීමෙන් කිවුවේ නෑ. මන්ත්‍රීතුමා මේකට මැදිහත්වෙලා වැඩේ කරන්න කියලා කිව්වේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි න්‍යාය පත්‍රයට යමු. ඔබතුමා කියන ඔක්කොම වැරදි මම පිළිගන්නම්. මේක කරන්න දෙන්නකෝ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මන්ත්‍රීවරයාගේ ගෞරවය ආරක්ෂා කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැමෝගේම ගෞරවය ඉහටත් උඩින් ආරක්ෂා කර ගන්නවා. තම තමන්ගේ ගෞරවය ආරක්ෂා කර ගැනීම තම තමන් සතුයි. ඒක මට අමුතුවෙන්

ආරක්ෂා කර ගන්න බෑ. තම තමන්ගේ ගෞරවය ආරක්ෂා කර ගැනීමේ වගකීම තමන් සතුයි. අනෙක් එක මන්ත්‍රීතුමා හැම එක්කෙනාම කියන දේවල් මට බැර කරන්න එපා.

දැන් වීදුරු පිළිබඳ ප්‍රශ්නය සුගත් මන්ත්‍රීතුමා මතුකරන්න ගියා. එවෙලේ තවත් මන්ත්‍රීවරයෙක් යම් අදහසක් ප්‍රකාශ කරා. ඒක මගේ පිට තියන්න එපා. ඒක ඉවරයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමා දන්නවා ඔබතුමා ලොකු චෝදනා ගණනාවක් කරා මේකේ. ඔබතුමා දන්නවා බොහොම පැහැදිලිව. දැන් ඔබතුමා කියන විදියට මේ ප්‍රේමලාල් අබේසේකර කියන මිනිහා විතරයි මේ ෆිනෑන්ස් කොම්පැණි එක්ක ඔක්කොම කරන්නේ. විරුද්ධ වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම මන්ත්‍රීවරු ඔක්කොගෙන්ම අහනවා, නම කිවුවද කාගේ හරි. ඇයි ඔබතුමා බය වුණේ. ඔබතුමාගේ නමක් කිවුවද කවුරු හරි. ඔබතුමාගේ නමක් සඳහන් කරාද?. කෙසෙල් කැන වැට පනින්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම කියන දේ අහන් ඉඳලා උත්තර දෙන්න. බොහොම පැහැදිලිව කියනවා මේ සභාපතිතුමා අපි එක්කහු වෙලා තමයි ඔය සියලුම වෙන්දේසිකාරයෝ කරපු විනාශ වලට විරුද්ධව සටන් කරේ. එතුමා අත්සන් කරලා තියෙනවා. මම ඔබතුමන්ලාට ලියුම් දුන්න නිසා දන්නවා. මම තාම ඒ ස්ථාවරයේ ඉන්නවා. හැමදාම ඉඳගෙන කියනවා ඒවා නිවැරදි කරන්න හැන්ද අතේ තියෙන්නේ කියලා. හැබැයි ඒවා කරලා නෑ. අපි කියන්නේ සභාපතිතුමා ඒවා නිවැරදි කරන්න. එතකොට මේ ප්‍රශ්න එකක්වත් නෑ. ඔබතුමා බලන්න මේ සභාව ආපු දවසේ ඉඳන් කියලා තියෙනවා ඒවා. ඒක දිගින් දිගට කියලා තියෙනවා. අපි ඒවා වෙනස් කරලා නෑ. අපි ලෑස්තියි ඕන වෙලාවක ඔබතුමන්ලා කියන පරීක්ෂණයකට එන්න. අපිත් එන්නම්. ගිහිල්ලා ඉවර වෙලා ඒ ටික නිවැරදි කරන්න. ඔබතුමා දන්නවා ඔබතුමන්ලා අපි කරපු පරීක්ෂණයක ප්‍රතිඵල තමයි, බොහොම පැහැදිලිව ඇක්සස් එකේ ඉඩම සම්බන්ධව දුන්න නිර්ණායක ක්‍රියාත්මක කරන්න කියලා. ඔබතුමන්ලා අපි ඉදිරිපත් වෙලා කරපුවා මේ. දැන් හැන්ද අපේ අතේ තියෙන්නේ. අපි ඔක්කොම සහයෝගය දෙනවා ඒවා ක්‍රියාත්මක කරන්න. දැන් ඒක කී ගමනක් කියලා තියෙනවාද?. දැන් මේ ඔක්කොම අමතක කරමු. ඒක කරන්න අපි ලෑස්තියි. හැබැයි ගරු සභාපතිතුමනි, වීදුරු කතාවත් කියන්න ඕන. ගුණසේකර හිටපු මන්ත්‍රීතුමා තමයි ගත්තේ. ගත්තට පස්සේ හිටපු සභාපතිතුමයි, මමයි, වීදුරු ටිකක් ගත්තා. අරගෙන අපි බෙදනවා. ඒවා තාමත් මං ළඟ තියෙනවා. හෙට දවසෙත් බෙදනවා දන්න කියන කෙනෙක් ආවම. ඒකේ වැරැද්දක් නෑ. මම අපේ මන්ත්‍රීවරුන්ගේ ගෙවල් වලටත් ගිහින් දීලා තියෙනවා වීදුරු සීය හමාර. ඒ ගිහින් දීලා තියෙන්නේ පගාවක් නෙමෙයි. ආවහම කාට හරි දෙන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම පුද්ගලිකව නම් සඳහන් කරලා ප්‍රකාශයක් කරා නෙමෙයි. මෙතන වෙන්දේසියේදී තමයි ගත්තේ. ඕන කෙනෙකුට ගන්න පුළුවන්. වෙන කෙනෙක් ගත්තා නම් මේ ගැන තරහ වෙන්නේ නෑ. ඒ වගේම තමයි එවකට හිටපු මේකට සම්බන්ධ නොවුණ මන්ත්‍රීවරු, ජනතා විමුක්ති පෙරමුණේ එවකට හිටපු මන්ත්‍රීවරුත් අධිභාරය ගෙව්වා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ නිසයි මෙතුමා මතු කරලා පෙන්නුවේ අධිභාර ගෙවන එක එන්න පුළුවන් කියලා. ඒකයි අපි මේකට විරුද්ධ. අපි දන්නවා බොහොම පැහැදිලිව සභාවක් අවශ්‍ය වෙන්නේ නෑ කොහෙත්ම කමිටුවලට වැඩ කරලා තීන්දු ගන්න පුළුවන්නම්. පාර්ලිමේන්තුවේ කැබිනට් මණ්ඩලයට කරන්න පුළුවන් නම් පාර්ලිමේන්තුවක් ඕන නෑ. ගරු සභාපතිතුමනි ඒකයි කිවුවේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ප්‍රකාශයක් කරන්න ඕන ජේ.සී.බී යන්ත්‍රයේ ගෙවීමට සම්බන්ධ වෙන්නේ නෑ. අනෙක් ඒවාට පක්ෂයි. අධිභාරයක් ආවොත් අපිට ගෙවන්න බෑ ඒක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සම්බන්ධ වෙන්නේ නෑ නෙමෙයි ඔයා ප්‍රකාශයක් කරන්න අධිභාර වලට මේවා වෙන්නේ නෑ කියලා. එන ඕන දේකට අපි එකඟයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අනිවාර්යයෙන් මගෙත් සඳහන් වෙලා තියෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එහෙම බෙදීම් කරන්න පුළුවන්ද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එහෙම බෙදීම් කරන්න බෑ. එහෙමනම් එකින් එක දාලා යන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් 2019-07-30 දින පැවති මුදල් ප්‍රතිපත්ති හා සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා බෙදීමකට යනවා.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 11

විපක්ෂව - 09

ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි - 01

**2019-07-30 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
07. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
08. ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය
09. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
10. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
11. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා

**2019-07-30 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
04. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
05. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
06. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
07. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
08. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා
09. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

**2019-07-30 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය ලබාදීමෙන් වැළකී සිටි පිරිස**

01. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019-07-30 දින පැවති මුදල් ප්‍රතිපත්ති හා සැකසුම් කමිටු වාර්තාව වැඩි ඡන්ද දෙකකින් සභා සම්මත විය.

II. 2019-08-16 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා බෙදීමකට යනවා.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 11

විපක්ෂව - 09

ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි - 01

**2019-08-16 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
07. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
08. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
09. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
10. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
11. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා

**2019-08-16 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
04. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
05. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
06. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
07. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
08. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා
09. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

**2019-08-16 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය ලබාදීමෙන් වැළකී සිටි පිරිස**

01. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019-08-16 දින පැවති මුදල් ප්‍රතිපත්ති හා සැකසුම් කමිටු වාර්තාව වැඩි ඡන්ද දෙකකින් සභා සම්මත විය.

<u>**02. තාක්ෂණික සේවා කමිටුව**</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2019-07-30 දින පැවති තාක්ෂණික සේවා කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා බෙදීමකට යනවා.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 11

විපක්ෂව - 06

ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි - 04

**2019-07-30 දින පැවති තාක්ෂණික සේවා කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
07. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
08. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
09. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
10. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
11. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා

**2019-07-30 දින පැවති තාක්ෂණික සේවා කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
04. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
05. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
06. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය

**2019-07-30 දින පැවති තාක්ෂණික සේවා කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය ලබාදීමෙන් වැළකී සිටි පිරිස**

01. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
02. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
03. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019-07-30 දින පැවති තාක්ෂණික සේවා කමිටු වාර්තාව වැඩි ඡන්ද පහකින් සභා සම්මත විය.

**<u>03. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- I.** 2019-07-30 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා බෙදීමකට යනවා.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 13

විපක්ෂව - 06

ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි - 02

**2019-07-30 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා

04. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
07. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
08. ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය
09. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
10. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
11. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
12. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
13. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**2019-07-30 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
04. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
05. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
06. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය

**2019-07-30 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය ලබාදීමෙන් වැළකී සිටි පිරිස**

01. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019-07-30 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව වැඩි ඡන්ද හතකින් සභා සම්මත විය.

**II.** 2019-08-16 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා බෙදීමකට යනවා.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 13

විපක්ෂව - 06

ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි - 02

**2019-08-16 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
07. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
08. ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය

09. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
10. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
11. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
12. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
13. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**2019-08-16 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
04. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
05. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
06. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය

**2019-08-16 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය ලබාදීමෙන් වැළකී සිටි පිරිස**

01. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019-08-16 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව වැඩි ඡන්ද හතකින් සභා සම්මත විය.

**<u>04. පරිසරය සහ පහසුකම් කමිටුව</u> ඃ-** නැත

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ සම්බන්ධව ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ලේකම්තුමා තමයි මෙතන වැරදි උපදෙස් දෙන්නේ ඇත්තටම. එතුමා තමයි සභාපතිව නොමඟ යවන්නේ. දැන් බලන්න ගරු සභාපතිතුමනි, මේ සභාව පටන් ගත්ත දවසේ ඉඳලා විපක්ෂයට ශත පහක්වත් ප්‍රතිපාදන මුදල් දුන්නේ නෑ. එතකොට එහෙම ශත පහක්වත් දීලා නැති අවස්ථාවක හැම ප්‍රාදේශීය සභාවකටම ගරු වජිර අබේවර්ධන මැතිතුමා එතුමාගේ අමාත්‍යාංශයෙන් මුදල් එවලා තියෙනවා අදාළ මන්ත්‍රීවරුන්ට සංවර්ධන යෝජනා කීපයක් කරන්න කියලා. දැන් ඒවාට ඇස්තමේන්තු තුනක් අනුමත වෙලා ඇවිල්ලා තියෙනවා. අපේ බල ප්‍රදේශයට ආපු සල්ලි වලින් අපි බලමු වැඩ කරන්න. එතකොට අපිට පහුගිය දවස්වල සභාපතිතුමා කිවුවේ සභාවේදී, ඔයගොල්ලෝ අමාත්‍යාංශයෙන්, ආණ්ඩුවෙන් සල්ලි ගේන්න. අපි ඒකට අත ගහන්නේ නෑ. ඔය ගොල්ලෝ ඒක කරන්න. එහෙම තමයි සභාපතිතුමා කිවුවේ සභාවේදී. දැන් කියනවා ඒ සභාවට ගෙනාපු මුදල් වලින් ඔය ගොල්ලන්ට කරන්න දෙන්නේ නෑ කියලා. ඒකත් ඒ අය අධීක්ෂණය කරන්න ඕන කියලා කියනවා. මොන විලි ලැජ්ජ නැති වැඩක්ද මේක. ඔයගොල්ලෝ ඒ විදියට ආවොත් අපිට සිද්ධ වෙනවා මේක නවත්වන්න. නැවැත්තුවම මොකද වෙන්නේ බල ප්‍රදේශයට සල්ලි නැති වෙලා යනවා. ඒක නිසා ඔබතුමා කල්පනා කරලා කියන්න බල ප්‍රදේශයට එන සල්ලි නවත්වනවාද, වැඩ කරනවාද කියලා. ඒ නිසා ගරු සභාපතිතුමනි ඔබතුමාගේ වගකීමක් ඒක. බලප්‍රදේශය තුළට සල්ලි ගෙනාවනම් කොහෙන් හරි වැඩ කරන්න ඕන. ඔබතුමා කලින් සභාවේදී කිවුවේ මොකක්ද?. ඔය ගොල්ලන්ගේ ආණ්ඩුවෙන් ගෙනල්ලා වැඩ කරන්න කිවුවා කලින්. සභාවේ සල්ලි ආණ්ඩු පක්ෂයේ කට්ටිය බෙදා ගත්තා. අපි මේ සල්ලි ගෙනාවට පස්සේ ඒ සල්ලිත් ඔය ගොල්ලන්ගේ කට්ටිය බෙදාගන්න ඕන කියන තැනට ගියොත් අපිට සිදු වෙනවා අපේ පළාත් පාලන ඇමති වජිර ඇමතිතුමාට කියලා මේ සල්ලි නවත්වන්න. මොකද අනිවාර්යයෙන්ම නවත්වනවා. නැවතුණොත් අපේ බල ප්‍රදේශයේ සංවර්ධන වැඩ කටයුතු අඩාල වෙනවා. ඒක නිසා ගරු සභාපතිතුමනි, මේක දැන් අනිවාර්යයෙන් ඇවිල්ලා තියෙනවා. යෝජනා දෙකක් තුනක් දැනට ක්‍රියාත්මක වෙලත් තියෙනවා. ඒ යෝජනා ටික අපේ මන්ත්‍රීවරුන් ලව්වා ගිවිසුම් අත්සන් කරවලා කරන්න. ඉවර වෙලා තව සංවර්ධන කටයුතු ගේන්නම් අපි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉවරද කියලා. මෙහෙමයි. නිලධාරියෙක් විදියට මෙතුමා බලන්නේ නීත්‍යානුකූලව මේක කරන්න. මුදල් කමිටු වාර්තා සභාවෙන් අනුමත වෙන්නේ නැත්නම්, අනුමත නොවීමේ ප්‍රවණතාවයක් තියෙනවානම් මෙතුමාට නිලධාරියෙක් විදියට යම්කිසි ප්‍රශ්නයක් තියෙනවා ඒකේ. එතුමාගේ පැත්තෙන් ඒක සාධාරණයි. කාටත් ඒක නැහැයි කියන්න බෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඇස්තමේන්තුනේ අනුමත කරන්නේ. මුදල් සම්බන්ධවනේ ගැටළුව මතු වුණේ දැන්. ඇස්තමේන්තු අනුමත කරාට පස්සේ වැඩ කරන්න පුළුවන්. මුදල් ගෙවන්නේ අන්තිමට. ඒක සභාවට දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් කියනවා අබේසේකර මන්ත්‍රීතුමා ඔය අනුමත වෙලා තියෙන්නේ කියලා. ඒකත් අනුමත වෙන්නේ නැත්නම්, ඒකත් මෙතනට දාලා අනුමත වෙන්නේ නැත්නම් කියන්නේ දැන් ඔබතුමාලාගේ ඒවා විතරක් මෙතන අනුමත කරන්න කියලද?.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි කියන්නේ ඒක නෙමෙයි. මෙතන වැඩ විනිවිදභාවයකින් යුතුව නිවැරදිව කරන්න ඕන. ඒකට අපි එකඟයි. එතන ප්‍රශ්නයක් නෙමෙයි තියෙන්නේ. මෙතන ඉන්නේ සභිකයෝ විසි දෙදෙනෙක්. ඒ විදියට බැලුවහම ප්‍රාදේශීය සභාවේ බලය අත්පත් කරගෙන හරි, ආණ්ඩුවේ බලය අත්පත් කර ගෙන හරි ඉන්න අයට විතරයි මේකේ ජනතා නියෝජිතයෝ විදියට වැඩ කරන්නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අයටත්, ජනතා විමුක්ති පෙරමුණේ අයටත් වෙනම ආණ්ඩු කරන්න වෙනවා ගෙදර ඉඳගෙන. එහෙම වෙන්න බැනේ. මේකට තේරී පත්වෙලා ආවානම් හැමෝටම වගකීමක් තියෙනවා. හැමෝටම වටිනාකමක් තියෙනවා. ඒක දෙන්න පුළුවන් වෙන්නේ ඔබතුමාට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඒක දීලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක දෙන්නේ නැත්නම් අපිට සිද්ධ වෙන්නේ මේක ඇතුලේ හැමදේටම එරෙහිව හඬ නගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි කියන්නේ කමිටු ගන්න තීරණ අනුමත කරන්න. එහෙම නොකර ඔබතුමාලා මගෙන් සාධාරණයක් බලාපොරොත්තු වෙන්න එපා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමාට මම කියන්න ඕන නෑ. ඔබතුමා කල්පනා කරලා බලන්න. අවුරුදු දෙකක් වෙනවා. මේ මන්ත්‍රීවරයෙකුට එක ශත පහක්වත් දීලා තියේද?. අඩු ගාණේ ලයිට් එකක් දීලා තියේද කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට ලයිට් එකක් දෙන්න ඔබතුමා මොකටද සහයෝගය දැක්වුවේ. ඔබතුමාලා එක අයවැයකට සහයෝගය දැක්වුවාද?.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක නෙමෙයි කොන්දේසිය. එහෙම කොන්දේසි, ඩීල් අපි ගාව නෑ. ඔබතුමා කියන ඒවාට එකඟ වෙලා කීයක්හරි ඉල්ල ගන්න නෙමෙයි අපි ආවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි මෙහෙමයි. පුද්ගලිකව දෙන්න බෑ. ඔබතුමා ලයිට් අවශ්‍ය තැන් ටිකක් කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** තැන් දීලා තියෙන්නේ. දැන් අවුරුද්දක් විතර වෙනවා. අර පොතේ ලියලා ඇති. එක පොතක ලිව්වහම ඒකේ නෙමෙයි අනිත් එකේ කිව්වා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම දන්නේ නෑ. මට දීලා නෑ. මම කට්ටියට කිව්වා ගිය සභාවේ. ගිය සභාවේ කිව්වේ නැද්ද ලයිට් පහ ගානේ දෙනවා කියලා. ගිය සභාවේ මන්ත්‍රීවරුන්ගෙන් මම ලයිට් පහක් ගානේ දාන්න ඉල්ලුවේ නැද්ද?. කවුද දුන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එහෙම කොහෙද ඉල්ලුවේ. අපිට කිව්වේ නෑ. ගිය සභාවේදී කිව්වා බඩු ගෙනාවේ නෑ කියලා. ඔබතුමා එතනදී සාධාරණ වෙන්න. එහෙම ඉල්ලලා දුන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඉල්ලුවේ නැද්ද ලයිට් දාන්න යෝජනා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපිට දීපුවත් තියෙනවා. මම ආපු දවස්වල දෙකක් දාලා තියෙනවා. මගේ නෙමෙයි. ඒ මිනිස්සු ඇවිල්ලා මේ පොත්වල ලියපුවා. අපි මතක්කරා, අපිට මතක් කරාම තාම දාලා නෑ කියලා කිව්වම, එතකොට බඩු ගෙනල්ලා නෑ කියලා කිව්වා. අලුත් බඩු

ගෙනල්ලා නෑ කියලා කිවුවා. කලින් ඒවාට විතරයි ගේන්නේ කිවුවා. රෙපෙයාර් වලට විතරයි ගේන්නේ කිවුවා. ඔබතුමා මේ අවුරුදු දෙකට විපක්ෂයේ ඉන්න කිසිම මන්ත්‍රීවරයෙකුට සහයෝගය දක්වලත් නෑ ප්‍රතිපාදන දීලත් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ මන්ත්‍රීතුමා. මම ගිය සභාවේ ලයිට් පහක් දෙන්නම් කිවුවා. ඔබතුමා ඒවට යෝජනා දීලා තියෙනවලු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා හෘද සාක්ෂියට අනුව කල්පනා කරලා බලන්න සභාව මෙහෙම මෙහෙයවන එක සාධාරණද කියලා. අපි කවුරුත් සභිකයෝ. ඒ ගෞරවය රකින එක ඔබතුමාගේ වගකීමක්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම කියන්නේ දැන් මෙතනදී ලේකම්තුමා කියනවා මේ කමිටුවලට විරුද්ධ වෙච්ච නිසා මට සිද්ධ වෙනවා මේක නවත්වන්න කියලා. අපි මහජන නියෝජිතවරු. අපි පක්ෂ වෙන්න පුළුවන්, විපක්ෂ වෙන්න පුළුවන්. පක්ෂය තින්දුවක් ගත්තහම ඒකට වැඩ කරන්න වෙන අවස්ථා තියෙනවා. ඔබතුමා මේකේ ප්‍රධාන නිලධාරියා. ප්‍රධාන නිලධාරියා විදියට ඔබතුමා දන්නවා මේකේ නීති රීති. ඔබතුමා නීති රීති දන්නවා නම් ඒ නීති රීති වලට අනුව වැඩ කරන්න. ඔබතුමා දන්නවා මේක පුළුවන්ද බැරිද කියන්න. මහජන නියෝජිතයෝ පක්ෂ ද විපක්ෂ ද කියලා බෙදීම් ඉල්ලන්න පුළුවන්. විරුද්ධ වෙන්න පුළුවන්. ඒක වෙනම කතාවක්. ඔබතුමා දන්නවා මේකේ ප්‍රධාන නිලධාරියා වශයෙන් පළාත් පාලන දැනුම අනුව මේක කරන්න පුළුවන්ද බැරිද කියන්න. ඔබතුමා දැන් කියනවා මුදල් කමිටුවට විරුද්ධ වෙන නිසා මම ඒකට දාන්නේ නෑ කියලා. එහෙම නීතියක් නෑ. සාමාන්‍යයෙන් යම් කිසි මුදලක් ආවානම් ඒක කමිටුවට දාලා ඇස්තමේන්තු අනුමත කරලා ඒක පටන් ගන්න තියෙන්නේ. ගෙවීම් කරන්න සභාවට දාලා. ඒක කරන්න තියෙන්නේ. ඔබතුමා ඒක දැනගන්න ඕන. ඒ විදියට කරන්න. ඔබතුමා මේකට විරුද්ධයි කියලා මේකේ දාන්නේ නෑ කියලා ඉන්න බෑ. මම ඉල්ලා සිටිනවා අර ඇවිල්ලා තියෙන මුදල් ටික අද හෙටම අපිට දෙන්න. ගිවිසුම් අත්සන් කරලා වැඩ පටන් ගන්න දෙන්න. ඊට පස්සේ ගෙවීම් කරන්න. මුදල් කමිටුවට හරි සභාවට හරි දාලා ඒක කරන්න තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතුමා කියන්නේ මහා සභාවෙන් අනුමත කරලා දෙනකන් මෙතුමට ඒ පිළිබඳ ක්‍රියාමාර්ගයක් ගන්න, වැඩ කරන්න බෑ කියලා. මන්ත්‍රීතුමා මෙහෙමයි. මට වුණත් මෙතුමාට බලපෑම් කරන්න බෑ. මෙතුමා තමයි ප්‍රධාන රාජ්‍ය නිලධාරියා. මෙතුමා තමයි තීන්දු ක්‍රියාත්මක කරන්නේ. මෙතුමට විශ්වාසයක් නැත්නම් සභාව පිළිබඳව ඒක ගැටළුවක්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ලේකම්තුමා අපිට ලිඛිතව දෙන්න මේක කරන්න බෑ සභාවට දාලා මේක කරන්න බෑ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමා ලිඛිතව දෙන්න ඕන නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** හරි පුදුම කතාවක්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිත් එක තමයි, අනිත් හැම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින්ම ගිහින් හොයලා බලන්න සභාපතිවරයා නිර්දේශ කළොත් විතරයි ගම්පෙරළිය ක්‍රියාත්මක වෙන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එහෙම එකක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැත්නම් මම පෙන්වන්නම්. මම ඒ මට්ටමට ගියේ නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාවේ කැමැත්ත ගන්න ඕන. සමහර පාරවල් තියෙනවා ඒ පාරවල් සභාවෙන් කරනවා කියලා හිතාගෙන, ප්‍රාදේශීය ලේකම් ඉල්ලීමක් කරනවා මේ පාරවල් ගම්පෙරළියෙන් කරන්නද, නැත්නම් සභාවෙන් කරන්න ඉන්නවද කියලා. එහෙම නැතුව ඒක නිකං කරන්න යන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවේ අනුමැතිය ගන්න ඕන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේක සභාවෙන් කරනවාද, නැද්ද කියලා අහන්නේ. කරනවානම් ගම්පෙරළියෙන් කරන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං අපිට කියන්න පුළුවන් අපි කරනවා කියලා. කරනවා කිව්වානම් මොකද වෙන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමා කියන්න. අපි නොකර ඉන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවට විරුද්ධ වෙන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක අපිට ගැටළුවක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක නෙමෙයි කියන්න ගියේ. අපිට ඒක අවශ්‍ය නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එහෙම කරන්න බැරිනම් ලියුමක් දෙන්න. අපි කියන්නම් ගමට එතකොට සභාවෙන් කරන්න දෙන්නේ නෑ කියලා. ඒක නිකං නොමඟ යවන විදියට ගෙනියන්න එපා සභාපතිතුමා. අපිත් හොඳ දේවල් වලට සහයෝගය දෙන්නම්. වැරදි දේවල් වලට අපි විරුද්ධව ඉන්නවා. ඒ නිසා ඔබතුමා එක්කෙනෙක්ගේ දෙන්නෙක්ගේ ප්‍රශ්නයක් අල්ලගෙන හිතේ තියාගෙන වැඩ කරන්න එපා. සභාවේ සභිකයෝ හැමෝම එක විදියට හිතන්න. සල්ලි දෙන්න එපා සභාවෙන්. ඔබතුමා සභාවෙන් මුදල් නොදුන්නට කමක් නෑ. අපි කොහෙන්හරි සල්ලි ගෙනාවනම් ඒක කරන්න දෙන්න. නැත්නම් මොන ප්‍රශ්නයක්ද?. ඔබතුමා සභාවේ මුලින් කිවුවනේ කරන්න දෙනවා කියලා. මන්ත්‍රීවරුන්ට ඔයගොල්ලෝ පිටින් ගේන්න කිවුවනේ. එහෙම එකේ කරන්න දෙන්නේ නැත්නම් පුදුම කතාවක්නේ ඒක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවේ අනුමත වුණොත් දෙන්නම්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** වෙන සභාවල එහෙම නෑ. අපි පාරවල් හදනවා. කාණු කොන්ක්‍රීට් කරනවා. පාරවල් කොන්ක්‍රීට් කරනවා. අහලා බලන්න වෙන සභාවල් වලින්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවට එවලා තියෙන්නේ සභාව ශක්තිමත් කරන්න. එක යෝජනාවක්වත් මන්ත්‍රීවරුන්ව නම් කරලා එවලා නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** නම් කරලා එවලා ඇත්තේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** නම දාලා එවලා ඇත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට එවලා නෑ මන්ත්‍රීවරු නම් කරලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේ තියෙන්නේ. නම දාලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට අනුමත කරන්න එවපු එකේ එහෙම දාලා නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමා හිතට එකඟව දන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැම එකටම ඔබතුමාලා හිතට එකඟවද වැඩ කරන්නේ. මේ සභාව සම්පූර්ණයෙන් කඩාකප්පල් කරන්න හදනවා. දෙන්න ඕන එක දෙන්න ඕන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමා හරියට මෙහෙයවනවානම් කඩාකප්පල් වෙන්නේ නෑ. ඔබතුමාගේ කටින් මොනවා හරි පිට වුණාම තමයි සභාව ඇවිලෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපොයි ඔව්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමා එහෙම පිට නොකර ඉන්නවා නම් එහෙම වෙන්නේ නෑ. අපේ යෝජනා කරන්න බැරිනම් අපිට කෙළින්ම කියන්න. පැහැදිලිව දෙන්න. ඉතුරු ටික අපි කරගන්නම්.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මෙහෙමයි. මේ යෝජනා පළාත් පාලන අමාත්‍යාංශය අපෙන් ගත්තේ. මේ හැම කෙනෙක්ගෙන්ම ලක්ෂ 06 යෝජනා ඉල්ල ගත්තා. ලක්ෂ 10 යෝජනාත් ඉල්ල ගත්තා. ඒ ගනිපු ඒවා එවලා තියෙන්නේ. ගෙදර තියෙනවා ලිස්ට්

එක. මේ වගේ පොතක් තියෙන්නේ. මෙහේ විතරක් නෙමෙයි අක්මීමණ, බද්දේගම හැම ප්‍රාදේශීය සභාවකම තියෙනවා. මේ අපේ යෝජනා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඔබතුමන්ලාගේ සංවිධායකතුමා එක්ක සාකච්ඡා කරලා තියෙන්නේ. එතුමා කියලා තියෙන්නේ. නම් කරලා තියෙන්නේ කැමති අයව. මම ඒ අනුව කටයුතු කරන්නේ. මම ඒක බලාගන්නම්. මම එතුමාට කිව්වා සභාපති විදියට මම තමයි මේකේ සමිති ටික තීරණය කරන්නේ කියලා. සමිති තීරණය කරන්නේ මම. මම ඒක ඔබතුමන්ලාගේ සංවිධායකතුමාට කියලා තියෙන්නේ. මේකේ සමිති තීරණය කරන්නේ මට ඕන විදියට.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** පනතේ තියෙනවා අදාළ කොට්ඨාශය තුළ වැඩ කරන විදිය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මගෙන් යෝජනා ගත්තේ නෑ. මේ ආපු යෝජනා වගයක් තියෙන්නේ. මම නම් කරපුවා නෙමෙයි. ආපු යෝජනා වගයක් තියෙන්නේ. අපි සභාව විදියට සමිතිය තීරණය කරනවා. අදාළ සමිතිය අපි යෝජනා කරන්නම්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මෙච්චරකල් කරපු යෝජනාවල ඔක්කොම ඔබතුමා යෝජනා කරපුවද?. මන්ත්‍රීවරු නෙමෙයිද යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොට්ඨාශයට එක යෝජනාවක් ගානේ කරේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාවේ අනුමත වෙලා කරන යෝජනා ඔබතුමාගේ යෝජනාද?. මන්ත්‍රීවරුන්ගේ යෝජනා නෙමෙයිද ඒවා. ඔබතුමාගේ යෝජනා නෙමෙයි නම් ගිවිසුම් අත්සන් නොකර හිටියද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ මෙහේ මුදල් නෙමෙයිනේ. අපේ ඒවා සංතෝෂයෙන් අපි කරා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සංවිධායකතුමා මොකද කිව්වේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මම එතුමත් එක්ක බේර ගන්නම්.

**(උ෴) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ ජූලි මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ ජූලි මස ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ ජූලි මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

## 04. වෙනත් ලේඛන

### I. ප්‍රගතිය

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ අගෝස්තු මස මහා සභා රැස්වීමට ඉදිරිපත් කරන ලද ප්‍රගතිය

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අබ්දුල් අසීස් මාවතේ අර ලයිට් කණුවේ ස්ථානය වෙනස් වුණාද දන්නේ නෑ. පාර මැද තියෙන කණුව පාර අයිනට ගන්න ඕන.

ගොඩකන්ද සමගි මාවතේ අනවසර ඉදිකිරීම් සම්බන්ධව මොකද දැන් තත්ත්වය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් ගන්නම්. දෙපැත්තෙන් තාප්ප ගහලා අවහිර කරගෙන ඉන්නේ. ඒක පරක්කු කරන්න එපා. හැමදාම කතාවෙන කාරණාවක් මේ.

(ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** වැලිපිටිමෝදර සරත් සිල්වා මහතා පාර කඩලා බටයක් දාලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඒක ඉවත්කර ගන්න කියලා ලියුම යවලා තියෙන්නේ. ලිපි තුනක් යවලා තියෙන්නේ. අවසන් ලිපියත් යවලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මෙහෙමයි. මේ කාරණාවට අදාළව ස්ථානීය පරීක්ෂණයක් සිදු කරලා තියෙනවා තාක්ෂණ නිලධාරිතුමා.

"නිවසේ එකතු වෙන අපජලය බැහැර කිරීම සඳහා සකස් කර ඇති ටැංකියේ වැඩි අපජලය ප්‍රාදේශීය සභා මාර්ගය හරහා බටයක් යොදා අසළ කාණුවට යොදා ඇති බව මා වෙත වාර්තා වී ඇත. ඒ අනුව ඔබ නීතිවිරෝධි ආකාරයෙන් යොදා ඇති එම අපජල බැහැර කිරීම සඳහා වන බටය මෙම ලිපිය ලද වහාම ඉවත් කිරීමට කටයුතු කරන ලෙස දන්වමි. ඔබ විසින් ඉහත නියෝගය පරිදි කටයුතු නොකළහොත් ප්‍රාදේශීය සභා පනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නීතිමය පියවර ගන්නා බවට වැඩිදුරටත් දන්වා සිටිමි." කියලා දන්වලා තියෙනවා.

අපි යවලා තියෙන දිනය තමයි 03 - 12. මේ අවුරුද්දේ මාර්තු මාසේ දොළොස් වෙනිදා. මම මේ සභාවට කියන්නේ වෙන මොකක්වත් හින්දා නෙමෙයි. අපිට මේක කරන්න බැරිනම් මේ වගේ ලියමනක් ඉදිරිපත් කිරීමම වැරදියි. ඒකට පාරක්, දෙපාරක්, තුන්පාරක් දැන් ලිපි යවලා තියෙනවා. තාම ක්‍රියාත්මක වෙලා නෑ. නමුත් මෙතන මේ කියලා තියෙන විදියට මේක ඉවත් කරන්න පුළුවන්. මම කියන්නේ සභාපතිතුමා අපි හැල්ලුවට පත් වෙන්න ඕන නෑ. මේක වහාම කරන්න පුළුවන්නම් මෙහෙම කියන්න. නැත්නම් මේක නොලියා ඉන්න. නෑ ඉතිං ඒක වෙන්නේ නෑ නේ. ඒකනේ කියන්නේ. වෙන්නේ නැති එකනේ ප්‍රශ්නය තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** පාරේ මැදින් බටයක් දාලා තියෙනවා කියලා පැමිණිල්ලක් ඇවිත් තියෙනවා. ඒකට දැනුවත් කරලා තියෙනවා සභාවෙන් නීතිවිරෝධීව කටයුතු කරලා තියෙනවා කියලා. ඒකට ක්‍රියාමාර්ගයක් ගත්තානම් ඉවරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි. ඕකට තාක්ෂණ නිලධාරිගේ නිර්දේශ මත ඒ ලිපිය යැව්වා. ඊට පස්සේ ගිහින් නැවත බලලා අවසන් ලිපිය යවලා තියෙන්නේ. ගිය සෙනසුරාදා අවසන් ලිපිය යවලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මම කියන්නේ මේක ක්‍රියාත්මක කරන්න කියලා. මේ ලියවිල්ල ඉදිරිපත් කරපු අය ඉන්නවානේ. ඒ අය අපෙන් දිගින් දිගටම මේ ගැන අහනවා. අන්න ඒකයි. හැමදාම අපි මේකට උත්තර දිදී ඉන්න ඕන. හෙට කරන්නම්, අනිද්දා කරන්නම් කිය කිය ඉන්න වෙලා තියෙන්නේ. ඒක තමයි ගැටළුව. මගේ එකක් විතරක් නෙමෙයි මේ. මේකට ගහ මරා ගන්න ඕන නෑ. තමන්ගේ ඉඩමේ වලක් කපලා වතුර බස්සවන්න පුළුවන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේකෙදී ඇත්තටම එක්කෙනෙක්ට නඩු දාන්න බෑ. බලප්‍රදේශය තුළ 80% ක් විතර පාරවල් වල බට දාලා තියෙනවා. හුඟක් ඒවායේ වතුර බහින්න දාලා තියෙනවා. ඒක වැරදියි. වැරදියි කියලා ඒ මිනිස්සුන්ට වතුර බස්සවන්න බැරිනම් යටවෙනවා නම් පාර හරහා බටයක් දාලා හරි වතුර ටික බස්සවනවා. ඒක හැම තැනම වගේ තියෙනවා. මම දැකලා තියෙනවා. ඒකට නඩු දාන්න ගියොත් හැම එකටම නඩු දාන්න වෙනවා. මේකෙන් යම් කිසි අවහිරතාවයක් වෙලා තියෙනවානම්, අනිත් මිනිස්සුන්ට කරදරයක් වෙලා තියෙනවානම් බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද මේ වැඩේ. කියාස් මන්ත්‍රීතුමා මතු කරපු ප්‍රශ්නය කතා කරන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක තමයි සභාපතිතුමා කතා කරේ. කතාකරන කොට ඒක තේරුම් ගන්නේ නැතුව මගේ ඇඟට කඩා පනිනවා. ඔබතුමා තේරුම් ගන්න. කතා කරේ මේ විෂය. ඔබතුමා බේර ගන්න කතා කරේ. ඔබතුමා කොහේවත් නැති කෝල් එකක ඉඳලා කතා කරලා මෙන්න මට ගහනවෝ, ගහනවෝ කියලා කතා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා බේරන්න කතා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ආණ්ඩුකාරතුමා කතා කරේ එන්නම් කිව්වා හෙට. ඊළඟට සියලුදෙනාම දැනුවත් කරන්න ඕන. දැන් දුරකථන ඇමතුම ආවේ ඒක. හෙට උදේ 09.30ට ආණ්ඩුකාරතුමා පැමිණෙනවා. මේ වෙනකම් ස්ථිරව තිබුණේ නෑ දැන් තමයි ස්ථිර කරේ. හෙට උදේ 09.30ට ආණ්ඩුකාරතුමා ප්‍රාදේශීය සභාවට පැමිණෙනවා. ඒකට සහභාගි වෙන්න කියලා සියලුදෙනාට ආරාධනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මේ ප්‍රගතිය අවස්ථාවේ දැන් මේකේ දීලා තියෙනවා මේ මාසේ ප්‍රගතිය. ඔයගොල්ලන්ටත් ලැබිලා ඇති. මේකේ තියෙන විදියටනම්, මේ සභාව කරපු දෙයක් නෑ මෙතන.

" විරු බිමට සරු ගසක් " කියලා වෙන කෙනෙක් කරපු වැඩකට ජේ.සී.බී එක යවලා තියෙනවා.

" අභ්‍යාසලාභී සංවර්ධන නිලධාරීන් තිදෙනෙක් සේවයට ආවා" කියන්නේ පිටින් පත්වීම් දීලා මෙහාට එවපු එකක්.

" ජංගම ආයුර්වේද සායන පැවැත්වීම " කොහොමත් කෙරිච්ච දේවල්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. කෙරිලා තිබුණේ නෑ මන්ත්‍රීතුමා. මේ ආවට පස්සේ කරපු පළවෙනි ජංගම සේවාව.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මේ ඊයේ පෙරේදා?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව්.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** "කම්කරුවන් සඳහා ආරක්ෂිත උපාංග ගැනීම" මේකේ නම් ප්‍රගතිය කියලා කරපු දෙයක් නෙමෙයි අපිට පේන්නේ. මේ සභාවට අපි අවස්ථා කීපයක කතා කළා. හැබැයි ඒ යෝජනා ස්ථිර වෙලා තියෙනවා වියදම් නොකර සභාව තුළ කළ යුතු දේවල්. පොඩි දේවල්. ඒවා මේ වෙනකම් කරාද කියලවත් සභාවට දැන්වීමක්, මේ වගේ දැනුවත් කිරීමක්, ලිඛිත දැනුම් දීමක්වත් නෑ. ප්‍රකාශයක්වත් නෑ.

මීට පෙර අවස්ථාවකදී සභාවට ගෙනාවා වැඩ පරිපාලකවරයෙකු බඳවාගන්න. කම්කරුවන්ගේ වැඩ අධීක්ෂණය කරන්න. මුදලක් ගෙවලා බඳවාගන්න සම්මත වුණා නම් ඊට පස්සේ දවසෙම බඳවා ගන්නවා. ඒ වෙනකොට අපි ලලිත් මහතා නම් කරා. ඔබ පිළිගත්තා. නමුත් අද වෙනතුරු ඒ පත්වීම කරාද කියලවත් දැනුවත් කරලා නෑ. අනිත් එක අර ලිපිකාරිනිය සම්බන්ධව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට උත්තර දෙන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** පොඩ්ඩක් ඉන්න සභාපතිතුමා. මට කරුණු ටික අමතක වෙනවා. ඔබතුමා කොළයක් තියාගෙන වැදගත් විදියට සටහන් කර ගෙන මම වාඩි වුණාට පස්සේ උත්තර දෙන්න. ඕක නැති හින්දයි මේ ඔක්කොම ප්‍රශ්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රගතියට බෑ. එකින් එකට මම උත්තර දෙන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** කරලා නෑ නේ. කරලා නම් මේ වගේ දෙන්නකෝ. පිටින් රස්සාවක් දීලා එවන එක දාන්න මතකනම් ඇයි ඒවා අමතක. ඊට පස්සේ අපි අර චෙක් අත්සන් කිරීම සම්බන්ධව මේකේ ගැටළුවක් මතු වුණ ලිපිකාරිනිය සම්බන්ධව අපි යෝජනා කරා ඔබ ආරක්ෂා වෙන විදියට ලේකම්තුමාට හැකියාව තියෙනවා ඒ පත්කිරීම කර ගන්න. හැබැයි ඒකේ වැඩ ආවරණය කරන ලිපිය අපිට තාම ලැබුණේ නෑ. ඒක ඉදිරිපත් කරේ නෑ. වචනයක්වත් ප්‍රකාශ කරේ නෑ. ඔබතුමාලා හිනාවෙන්න. සභාවට ආපු ප්‍රශ්නයක් මේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා අද උදේ සභාවට ඇවිල්ලද ආවේ. ඇතුළට ගියාද?.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඇතුළට ගියේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි එහෙමනම් හරි. එහෙනම් ඉතිං සමාවෙන්න ඕන. හිනාවෙච්ච එකට.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මෙතන මතුවෙච්ච ප්‍රශ්නය නිවැරදි කරානම් දැනුවත් වෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රධාන කළමනාකරණ සහකාර කෙනෙක් ඇවිල්ලා ඉන්නේ. ඔබතුමා දැනුවත් නැතිවුණාට ඇවිල්ලා සති දෙකකට වැඩියි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** දැන් එන්න ඇති. ඒක නිවැරදි වෙලා ඇති. මතුවෙච්ච ගැටළුවට උත්තරයක් ඇහුවේ. අනිත් එක උප සභාපතිතුමාට නිල කාමරයක් තියෙනවාද?. අනන්තවත් උඩ පැනලා හැමෝම කිවුවා දෙන්න ඕන කියලා. හැබැයි මේ වෙනකම් දුන්නද නැද්ද කියලා මම දන්නේ නෑ. මේ මුදලක් වියදම් නොකර සභාවේ ක්ෂණිකව ගන්න පුළුවන් තීන්දු කීපයක් මම සිහිපත් කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලලිත් මහතා තමයි ප්‍රීමික්ස් ව්‍යාපෘතිය භාරව ක්‍රියාත්මක වෙන්නේ, කටයුතු කරන්නේ. ඒ ව්‍යාපෘතිය අතරමග නවත්වන්න ක්‍රමයක් නෑ. මොකද ලලිත් මහතා දාන්න විදියක් නෑ වැඩ පරිපාලක විදියට. ලලිත් මහතා තමයි සම්පූර්ණයෙන්ම ඒ ව්‍යාපෘතිය භාරව කටයුතු කරන්නේ.

ඊට පස්සේ කළමනාකරණ සහකාර II ශ්‍රේණියේ විජේසේන මහත්තයා දැනට ප්‍රධාන කළමනාකරණ සහකාර තනතුරට ඇවිල්ලා ඉන්නවා. එතුමා ඒකේ වැඩ කරනවා. ඒ හින්දා පහුගිය දේවල් කතා කරන්න අවශ්‍ය නෑ කියන එක තමයි මගේ හැගීම.

නිල කාමරය සකස් කරලා තියෙන්නේ. එතුමාට මම කිවුවා අවශ්‍ය අඩුපාඩු තියේ නම් කියන්න කියලා. උප සභාපතිතුමාට තමයි කාමරය හදලා තියෙන්නේ. උප සභාපතිතුමාගේ එකඟතාවය තමයි වැදගත් වෙන්නේ. මන්ත්‍රීවරුන්ට වෙනම දෙන්න හැකියාවක් නෑ. උප සභාපතිතුමා එකඟ වෙන තැනක එතුමාට අවශ්‍ය වෙන විදියට ඒක හදලා දෙන්න මම කටයුතු කරලා තියෙන්නේ. එතුමාට දැන් තියෙන්නේ අඩුපාඩුකම් තියේ නම් පෙන්වලා දෙන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒ.සී කරලා දෙන්න ඒක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මගේ කාමරය ඒ.සී කරලා ඒකත් ඒ.සී කරලා දෙන්න.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අර ඉස්සෙල්ලා ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ කරාපිටිය ගොඩකන්ද මාර්ගය සම්බන්ධව ඇතිවෙච්ච ප්‍රශ්නය පිළිබඳව මම ගරු මන්ත්‍රීතුමත් එක්ක කතා කළා. එතුමාගේ දැනුවත් කිරීම අනුව මෙහෙමයි වෙලා තියෙන්නේ. රන් මාවත් ව්‍යාපෘතිය යටතේ තමයි ඒ පාර දාලා තියෙන්නේ. නමුත් ඒ පාර තවත් පුළුල් කරලා විධිමත් විදියට හදන්න අවශ්‍යතාවය තියෙන නිසා, ඒ රන් මාවත්වල දාපු මුදල මදි වීම නිසා, ඒ මුදල තමයි දැන් වෙන්කරලා දාලා තියෙන්නේ මේ පාරටයි, ටෙක්ලා මන්ත්‍රීතුමියගේ පාරටයි. ඊට පස්සේ දැන් මේක ආසියානු සංවර්ධන ව්‍යාපෘතියක් යටතේ ඒ පාර හදන්න සේරම කටයුතු කරලා තියෙන බවත්, ඊළඟට කොහේවත් බෝඩ් ගහපු තැනක, පටන් ගනිපු තැනක එකම තැනකවත් නවත්වපු

තැනක් තියෙනවානම් කියන්න කිව්වා. එකම තැනකවත් එහෙම නවත්වලා නෑ කිව්වා. සියලුම සංවර්ධන කටයුතු කරලයි කිව්වා තියෙන්නේ. පැහැදිලිව ඒ කාරණය කියන්න කියලා කිව්වා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ප්‍රගතියේදී මට කතා කරන්න අවශ්‍යයි. කපුහෙම්පල සායන ගොඩනැගිල්ලේ ගේට්ටුව, ජල ටැංකිය, නාම පුවරුව ගැන. ඒක තාම නෑ නේද අපේ අනිල් බන්දුතිලක මන්ත්‍රීතුමා. එතුමාත් මට කීප වතාවක් මතක් කරා. ඒක හැමදාම ප්‍රගතියේදී මතු කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නාම පුවරුවට මිල ගණන් කැඳෙව්වා. සියලු දේ නීත්‍යානුකූලව කරන්න ඕන. එක මිල ගණනයි ආවේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒක ලොකු මුදලක් යන එකක්. නමුත් එහෙම නෙමෙයි හත් අට දාහක් යන ගැල්වනයිස් බට දෙකක් හිටවලා හදන්න. ගිය සැරේ මිල ගණනේ රුපියල් හැත්තෑදාහක් විතර ලොකු මිල ගණනක් තිබුණේ. එහෙම අවශ්‍ය නෑ. රුපියල් දහ පහළොස් දාහක් යයි වැඩේට වැඩිම වුනොත්. ඒ නාම පුවරුව සකස් කරලා දෙන්න. මොකද හේතුව ඒක ලොකු ගැටළුවක් සෞඛ්‍ය සායන ගොඩනැගිල්ලට.

ඊළඟ දේ තමයි නිතර සායන කටයුතු සිදු වෙනවා. හැමදාමත් කතා කරනවා. ජල ටැංකිය සවි කිරීම තාම සිදු වුණේ නෑ. ඒක සභාපතිතුමා ඉක්මනට කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කාරණා ටික කරන්න.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගේට්ටුව සකස් කරලා තියෙනවා. මම කලිනුත් කිව්වා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක දිනූෂ මහත්තයාට මතක් කරන්න, ඒ ටික කරන්න කියලා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අනිල් බන්දුතිලක මන්ත්‍රීතුමා ඒකට ගේට්ටුවක් සකස් කරලා තියෙනවා නේද?. ඒක ඉක්මනට සවි කරලා දෙන්න.

ඊළඟ කටයුත්ත තමයි, අපි ප්‍රාදේශීය සභාවේ යෝජනා කරා මුල්ම සභා වාරයක මම හිතන්නේ අර සමර්හට් ටික රෙදි ටික ගහලා සකස් කරන්න කියලා. ඒක කොහොමද දන්නේ නෑ.

ජාතික කොඩි, පළාත් කොඩි ගේන්න යෝජනා කරා ගෙනාවද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව් ගෙනාවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** හරි සභාපතිතුමා බොහොම ස්තූතියි. අර වැඩේ කරලා දෙන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** කරාපිටිය ගොඩකන්ද මාර්ගය ආසියානු සංවර්ධන බැංකුවේ ව්‍යාපෘතියට දැම්මේ 2018 වර්ෂයේදී දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන්. මේක විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමා ඒ කාලේ කරපු වැඩක් නෙමෙයි. චන්දිම රාසපුත්‍ර මැතිතුමා කරපු වැඩක්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක කියලා නවත්වන්නද?.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** හා පුළුවන්නම් නවත්වන්න. මම අභියෝග කරනවා නවත්වන්න බෑ කියලා. ඒක 2018 වර්ෂයේදී දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ චන්දිම රාසපුත්‍ර ඇමතිතුමා කරේ. හැබැයි ඒ හා සමානවම කරාපිටිය බෝගහවෙල්ල මාර්ගය තියෙනවා. උදුල මන්ත්‍රීතුමා දන්නවා ඇති. ඒ මාර්ගය විශාල පිරිසක් භාවිතා කරන මාර්ගයක්. හැබැයි ගොඩකන්ද ප්‍රදේශයට ඒ වෙන් කරපු මුදල ඒ මාර්ගයට දාලා සංවර්ධනය කරන්න තිබුණා.

(ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** කවුද යෝජනා කරේ ඒ මාර්ගය.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** දාන්න යෝජනා තියෙන්න එපැයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ වෙනකොට එක්සත් ජාතික පක්ෂයේ ගල්කැටිය ශාඛා සංවිධානය සම්පූර්ණයෙන්ම ඉල්ලීම් කරා. ඒ හින්දා පැහැදිලිවම ඒ මුදල අරගෙන ගිහිල්ලා අතුරු මාර්ග වලට දැම්මා විශාල පිරිසක් භාවිතා කරන මේ මාර්ගය තියෙද්දි.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** මම දාපු පාරේ කාටවත් යන්න බෑ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** හැබැයි ඉතින් විශාල ප්‍රමාණයක් භාවිතා කරන මේ මාර්ගයේ සම්පූර්ණ චෝදනාව මම භාර දෙනවා.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ඔයා ඕන තරම් චෝදනා කරන්න. ඒ පාරේ යන්න බෑ. දැන් ගිහින් බලන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ පාරේ යන්න බෑ වගේම ගොඩකන්ද පාරෙත් යන්න බෑ. ඒක හින්දා මගේ විරෝධතාවය කොට්ඨාශයේ මන්ත්‍රීවරයා හැටියට දක්වනවා. අදටත් විශාල වතුර වලවල් පිරිලා තියෙනවා. ඒ චෝදනාව, රන්මාවත් තියා මොන මාවත් කරත් තියෙනවා. ගොඩකන්ද මාවතේ යන්න බැහැ කියන එක මම පැහැදිලිව මේ සභාවේ කියනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒ පාර පළල් කරලා හදන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** දැන් ඕක 2018 වර්ෂයේ ඉඳන් මේ වෙනකම් හදනවා. විශාල වතුර වලවල් ප්‍රමාණයක් තියෙනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** දෙසැම්බර් ඡන්දයට කලින් වැඩ පටන් ගන්නවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** දෙසැම්බර් ඡන්දයට කලින් පටන් ගන්නේ අපේ ආණ්ඩුවෙන්. අපේ ආණ්ඩුවෙන් කියන්නේ ගෝඨාභය රාජපක්ෂ මහත්තයාගේ ආණ්ඩුවෙන්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒ 2035 දී එන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඔබතුමාලා ලැජ්ජ වෙන්න ඕන ඒ මාර්ගයේ මුදල් අරගෙන ගිහිල්ලා මෙහෙම කතා කරන එකට. ගොඩකන්දේ විශාල පිරිසක් භාවිතා කරන මාර්ගයේ මුදල් අරගෙන යනවානම් උත්සව තිබ්බේ ඇයි ඒ නායකයෝ ඇවිල්ලා.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** කවුද උත්සව තිබ්බේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** කරාපිටිය මංසන්ධියේ තිබ්බේ. මම කියන්නේ මගේ වසම ගැන. ඔබතුමිය ඒ මුදල ගත්තා නම් කට වහගෙන ඉන්න.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ඔයාට ඇහැකිද මගේ කට වහන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ගොඩකන්ද මාර්ගය නවත්වපු එක ගැන කතා කරේ. කොහේවත් දා ගනිපු එක මට අදාළ නෑ. ඒක නායකතුමාගෙන් අහන්න ඔබතුමා. ඒක නායකතුමා එක්ක කතා කර ගන්න. මම නායකයාට චෝදනා කරේ. ඔබ දෙපළ බෙදාගත්තාට ඒ පාර මට අදාළ නැත. ඔබ දෙපළ සියලු දේවල් බෙදා ගන්නවා වගේ පාරත් බෙදා ගත්තා. ඒක මට අදාළ නෑ.

(සභාව ඝෝෂාකාරි විය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ඇති නවත්වන්න. අද අලුත් හඳුන්වාදීමක්

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** සභාපතිතුමනි, මහවත්ත මාර්ගය ගැන මම පැහැදිලිකරොත් මහවත්ත මාර්ගය මුලින්ම කාපට් කරන්න කිවුවේ ප්‍රේමසිරි මහත්තයා. ප්‍රේමසිරි මහත්තයා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඉන්න වෙලාවේ මහා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්. එතකොට ජල සම්පාදන මණ්ඩලයේ සභාපති. සභාපතිවරයා විදියට රැස්වීමකදී මම ලියුම දුන්නේ. මගෙන් ඇහුවා කොහේද පාර තියෙන්නේ කියලා. මම කිවුවාම මහවත්ත පාර දන්නවා කිවුවා. වහාම කාපට් කරන්න කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරියට හරි ලියනගේ මන්ත්‍රීතුමා. මේ කියන එක හරි. ගිය ආණ්ඩුවේ කරපු දේවල් තමයි මේකේ ක්‍රියාත්මක වෙන්නේ. තේරුම් ගන්න.

**ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** මොන ආණ්ඩුවෙන් හරි ක්‍රියාත්මක කරනවානේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මගේ පාර හදපු නැති එකේ චෝදනාව මම කරේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මගේ ඉතිහාසයේ කවදාවත් මේ වගේ පාරවල් හදලා නෑ කිසිම ආණ්ඩුවකින්. කලබල වෙන්න එපා. ඉතුරු ටිකත් හදලා දානවා. ඉතිහාසයේ මොන ආණ්ඩුවද මේ වගේ පාරවල් හදලා තියෙන්නේ. 2035 වෙනකම් අපි හදනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා සභාව අවසන් වෙන්න කලින් අපිටත් අවස්ථාවක් දෙන්න කියලා කතා කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අවස්ථාව තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිත ුමනි, මේ ප්‍රගතියේදී මම හිතන්නේ මේ සභාව පටන් ගත්ත දවසේ ඉඳලම අනවසර ඉදිකිරීම් පිළිබඳව කතා කරලා තියෙනවා. අනතුරුදායක ගස් පිළිබඳව කතා කරලා තියෙනවා. අපිටත් කරුණාකරලා කාරක සභා අවස්ථාවක් කරලා දැනට එහි ප්‍රගතිය කියන්න. උළුවිටිකේ ශ්‍රියාලතා මහත්මියගේ ගහ පිළිබඳව ගනිපු තීන්දුව, එතනින් ගියාම අනවසර ඉදිකිරීම් පිළිබඳව ගනිපු ප්‍රගතිය කියන්න. තාම ගරු සභාපතිතුමනි, හිටලා තියෙන්නේ. මේ ඩිංගේ හරි මේක පටන් ගන්න. මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා අපේ නිලධාරි මහත්වරුන්ට අදහස් දක්වන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>කාරක සභා අවස්ථාව.</u>**

කාරක සභා අවස්ථාවේදී ලේකම් එල්. එච්. අනිල් රංජන් මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- ❖ අනවසර ඉදිකිරීම් සම්බන්ධව අධිකරණ ක්‍රියාවලියට ගත වන කාලය.
- ❖ ලීඩ්ස් ඉන්ටර්නැෂනල් ආයතනයට එරෙහිව නඩු දෙකක් පවරා ඇති බව.
- ❖ මවුන්ට් කැල්වරි පාසල රුපියල් ලක්ෂ පහක දඩයකට යටත් කළ බව.

මීට අමතරව මවුන්ට් කැල්වරි පාසල පිහිටා ඇති භූමියේ සිට වැසි ජලය සමඟ ගලා එන පස් නිසා බටුවන්තුඩාව පීල්ලට සිදු වී ඇති හානිය පිළිබඳව ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය විසින් සභාව දැනුවත් කරන ලදි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපි ඔබතුමන්ලාගෙන් බලාපොරොත්තු වුනේ ලේකම්ට කියලා මේ දෙන උත්තර ටික නෙමෙයි. ඒක ඔබතුමා දන්නවා. දැන් කරුණාකරලා ඊළඟ සභාව වෙනකොට අපිට කියන්න ඇක්සස් ඉඩමේ කන්ද කපලා බිල්ඩින් හදන අය එන්.බී.ආර්.ඕ වාර්තාව අරගෙන තියෙනවාද කියලා. ඒක මේ සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා මෙහෙම දෙයක් තියෙනවා. දැන් පොදුවේ අනවසර ඉදිකිරීම් ගැන නැතුව නම් කරන ඒවා ගන්න බෑ. මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>කාරක සභා අවස්ථාව.</u>**

කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරි ඒ.පී.පී.එස්. ගුණසේකර මහතා පහත අදහස් දක්වා සිටින ලදී

- ❖ ඇක්සස් වෙන්දේසි ඉඩමේ එන්.බී.ආර්.ඕ වාර්තාවේ දක්වා ඇති පරිදි ඉඩම් කැබැල්ලෙන් කැබැල්ලට ගොඩනැගිලි ඉදිකරන විට එන්.බී.ආර්.ඕ වාර්තාව ලබා ගත යුතු බව.

❖ බන්දුල මහතා විසින් එම ස්ථානීය පරීක්ෂණය සිදු කරන බව.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ලබන සභා වාරයට එන්.බී.ආර්.ඕ. වාර්තාව ලබා දී ඇති ආකාරය අරගෙන බලන්න සකස් කරන්න. ඒක කොහොමද දීලා තියෙන්නේ, මොන විදියටද සකස් කරලා තියෙන්නේ කියන එක දැන ගන්න ඕන. මොකද ඉතාම භයානකයි ඒක. මොකද ඔබතුමා දන්නවා, ඔබතුමා පැහැදිලිව දන්නවා ඒ තියපු මූලික සාකච්ඡාවේදී සියලු මන්ත්‍රීවරු ළඟදී තමයි කිවුවේ මේ ඉඩම් කැල්ල වෙන්දේසි නොකළ යුතු කොටසක් කියලා. ඒක දුන්නා. ඒ පිළිබඳව අපි දිගින් දිගට කතා කළා. අපි අදත් කියනවා මේ ටික හරි කපන එක නතර නොකරොත් ලොකු ප්‍රශ්නයක්. එන්.බී.ආර්.ඕ. එක කොහොමද එක පාරට ඒ තීන්දුවලට ගියේ. එතකොට ඒ නිසා විශාල වගකීමක් ඔබතුමාට තියෙනවා. ඔබතුමාගේ කොට්ඨාශයේ. ඒ නිසා මේ පිළිබඳව බලන්න. ඊළඟට ඒ අත්පත්කරගෙන තියෙන ඉඩම් අපිට ගන්න කියලා කිවුවා. ගල්කුළු තියෙන ඒවා අපිට දුන්නේ. ඒවා වැඩක් නෑ කියලා බොහොම පැහැදිලි නිර්දේශ දීලා තියෙනවා. මේවා විකුණලා ඉවර වුණාට පස්සේ ගන්න තැනක් හිටින්නේ නෑ සභාපතිතුමා. ඊළඟට අපි ඔබතුමාට යෝජනා කරා මේ වතුර පිළිබඳ ප්‍රශ්නය තියෙන නිසා බෝපෙ පෝද්දලට. මම කියන්නේ ලේසියෙන් ක්‍රියාත්මක කරන්න ඕන ඒවා මේ. අපි දවසක් ගිහිල්ලා ඒක වටලලා හරි කියන්න ඕන මේක දීපල්ලා කියලා බෝපෙ පෝද්දලට. ඒ මට්ටමට යන්න ඕන. ඉතිං ඇත්තටම ඔබතුමා ඒක කරන්නේ නැත්තේ ඇයි. ඒවා ලේසියෙන්ම කරන්න පුළුවන් ඒවා නේ. මේ එකක්වත් කෙරිලා නෑ අද වෙනකම්. ඔබතුමාලා අපි හැමදාම විරුද්ධවුණ එකක් තියෙනවා. වතුර ටැංකිය පාරේ වෙන්දේසි ඉඩම. මේක දැන් හරි නතර කරලා තීන්දු තීරණ ගන්නේ නැත්නම් විනාශයක් වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔඩිට් එකෙනුත් ඒක බලන්න ගිහින් තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි ඔඩිට් එකට කියලා තියෙනවා අපිව දැනුවත් කරලා යන්න කියලා. ඒකයි මේකෙ තියෙන වැරැද්ද.

ඊළඟට මේ තාක්ෂණ නිලධාරීන්ට සභාව අවසන් වෙනකම් ඉන්න කියන්න. මොකද හේතුව අවසානයේදී තමයි ප්‍රගතිය තියෙන්නේ. එතකොට ඒක ගැන අහගන්න කෙනෙක් නෑ.

දැන් අපි බොහොම පැහැදිලිව යෝජනා කරා. වතුර සාම්පලය දීලා තියෙන්නේ හොර සාම්පලයක්. ඒ නිසා අපි ළඟදී වතුර බෝතල් දෙකක් අරගෙන වහාම ගිහින් දීලා මේ සාම්පල් දෙක චෙක් කරන්න කියලා කපුහෙම්පල ඉඩමේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට බලයක් තියේද අබේසේකර මන්ත්‍රීතුමා එහෙම ගන්න. අදාළ ආයතනයේ ඒවා පරීක්ෂා කරලානේ දෙන්නේ. අපිට ඒවාට අභියෝග කරන්න බෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මේකයි කතාව. දැන් ඔබතුමා ඉන්න ඕන අපේ පැත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ප්‍රශ්නයක් නෑ. අපිට ඒ ආයතන හැල්ලුවට ලක් කරන්න පුළුවන්ද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බොහොම පැහැදිලි චෝදනාවක්නේ මම කරලා තියෙන්නේ. ඒකට පරීක්ෂණයක් කරන්න කියලා සභාපතිතුමා බොහොම පැහැදිලිව මම චෝදනාවක් කරලා තියෙන්නේ. වැරදි වාර්තා දීලා තියෙන්නේ. වැරදි තැනකින් වතුර අරන් ගිහින් දීලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන එක හරි හෝ වැරදි වෙන්න පුළුවන්. ඔබතුමා ඉන්න මතය ඒක. නමුත් අපි යම්කිසි ආයතනයකට, රජය පිළිගන්නා ආයතනයකට, එතනට ගිහින් දීලා සාම්පල් පරීක්ෂා කරන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම වගකීමෙන් ඒ කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන්නේ ඒ වතුර සාම්පලය ඒ අයට ඕන තැනින් අරන් ගියාම අනුමත කරලා දෙනවා කියලද?. එහෙමනම් ඒ ආයතන මොකටද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා පොඩි එකා වෙන්න හදන්න එපා. දන්නවානේ මේවා කෙරෙන විදිය.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** සභාපතිතුමා, වතුර සාම්පල් චෙක් කරන කාරණයේදී, වතුර සාම්පල් චෙක්කරගන්න අවශ්‍ය කෙනා තමන්ගේ අවශ්‍යතාවය මොකක්ද කියලා ලැබ් එකට ගිහින් කතා කරාට පස්සේ ලැබ් එකෙන් චිට් එකක් දෙනවා මේකට අය කරන මුදල මෙච්චරයි කියලා. එක එක සාම්පල් වලට එක එක මුදල් අය කරන්නේ. ඒ මුදල ගාල්ලට බැඳලා නැවත ඒක දුන්නට පස්සේ එයාලා බෝතලයක් දෙනවා වයින් ස්ප්‍රීතු දාලා පුච්චපු මේකට වතුර සාම්පලය ගේන්න කියලා. ඒ සාම්පල් එක තමයි අරන් එන්නේ. නැතුව ජල සම්පාදන මණ්ඩලයෙන් යන්නේ නෑ සාම්පල් ගන්න. ඒ ගේන සාම්පල් එක තමයි චෙක් කරන්නේ. ඒකේ සාම්පල් එකක් මුලින් ගෙනල්ලා තියෙනවා. ගෙනල්ලා චෙක් කරලා තියෙනවා. ඒක ෆේල්. ඒකෙ අයන් වැඩියි. ඊට පස්සේ දෙවැනියට අරගෙන ගිය එක පාස්. එතන ලැබ් එකට වැඩක් නෑ ගෙනාවේ කොහෙන්ද කියලා. මොකද මගේ අවශ්‍යතාවය ඉෂ්ට කරගන්න ගියාම සාම්පල් එකේ රිසාල්ට් එක ඕන මටයි. මමත් අරන් යන්නේ මට අවශ්‍ය දේ කරගන්න. මෙතන කරන්නේ හරිද වැරදිද කියලා බලන එක. එයා කරන්නේ වෙන කොහොන් හරි අරන් ඇවිත් ඒ සාම්පල් එක මෙහෙට දෙනවා. ඒක වැරදියි. මෙහේ අධීක්ෂණය යටතේ කෙරෙනවානම් හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට මෙහෙම කියන්න පුළුවන්. අපේ නිලධාරියෙක් ඉදිරිපිට සාම්පලය තිකුත් කරන්න කියලා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ඒක හරි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ප්‍රශ්නයක් නෑ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මෙතුමාගේ ප්‍රශ්නයම තියෙන මගේ මිතුරෙකුට වෙච්ච සත්‍ය සිද්ධියක් මේ. ජල සාම්පල් අරන් යන්න බෝතලය දුන්නා. ඇත්ත ළිඳෙන් වතුර එකක් අරන් ගියහම ඒක් ෆේල්. ඊට පස්සේ කඩෙන් වතුර එකක් අරගෙන ගිහින් පාස් කර ගෙන වැඩේ කර ගත්තා. ඒ වගේ යන්නේ. ඒ වගේ වැඩ තමයි කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරිද දැන් එහෙමනම්. ඔබතුමාට අදහස් දක්වන්න ඕනද?. චමින්ද මන්ත්‍රීතුමා අන්තිමට වෙලාවක් ඉල්ලුවනේ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** මම ඉල්ලුවේ වෙන මුකුත් නෙමෙයි සභාපතිතුමනි, අපිත් ආසයි සභාවට ඇවිල්ලා අපේ කොට්ඨාශය වෙනුවෙන් වචනයක් කතා කරන්න. අතීතයේ වෙච්ච සිදුවීම් වෙන්න පුළුවන්. ඒවා හරි හෝ වැරදි වෙන්න පුළුවන්. ඒවා සෙවීමේ වගකීම දැන් තියෙන සභාව සතු වෙන්න පුළුවන්. හැබැයි යට තියෙන ජරාව අවුස්ස අවුස්ස ගඳ ගස්සවන්නේ නැතුව. මම වචනය පාවිච්චි කරන්නේ නෑ. ඒ වචනය කිවුවම මන්ත්‍රීවරයෙකුට තරහ යනවා. අපි ලාබාල මන්ත්‍රීවරු වෙන්න ඇති. හැබැයි අපි හැම දෙනාම ඔබතුමාට සහයෝගය දීගෙන වැඩ කරන්න ඕන. ඔබතුමාගේ අඩුපාඩුවක්, වරදක් තියෙනවා නම්, වංචාවක් හෝ දූෂණයක් තියෙනවා නම් ඒ ඕන පරීක්ෂණයක් ඉල්ලලා ඒ පරීක්ෂණය කරන්න කියන්න. ඒ පරීක්ෂණයේ ප්‍රතිඵල එනකම් අපි බලාගෙන ඉඳිමු. ඊට පස්සේ පරීක්ෂණයේ ප්‍රතිඵල වැරදිනම් ඒක ඔබතුමා භාරගන්න ඕන. කරුණාකරලා හැම මන්ත්‍රීවරයෙකුගෙන්ම බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. පහළ ජනතාව අහන් ඉන්න පුළුවන්. වැඩ කරන සේවක මණ්ඩලය අහන් ඉන්න පුළුවන්. පිස්සු බල්ලෝ වගේ කෑ ගහන එක නෙමෙයි අපේ වැඩේ. කියන එක, වචන පාවිච්චි කරනවානම් බොහොම ගෞරවයෙන් කරන්න ඕන. කරුණාවෙන් ඉල්ලා සිටිනවා මන්ත්‍රීවරු හැම කෙනෙක්ගෙන්ම. බුද්ධිමත්ව කටයුතු කරන්න. වැරදි අඩුපාඩු නැති මිනිස්සු මේ ලෝකේ නෑ. මේ කතා කරන හැම කෙනෙක්ගෙම වැරදි අඩුපාඩු තියෙනවා. නම් වශයෙන් ප්‍රකාශ කරන්න ගියොත් තවත් මේක ඇදෙන නිසා මම නම් ප්‍රකාශ කරන්නේ නෑ. පෝද්දල කොට්ඨාශයේ බොහෝමයක් සිදුවීම් මා සතුව තියෙනවා. අවශ්‍ය වෙලාවට, අවශ්‍ය දවසට, අවශ්‍ය තැනදි මම ඒවා ප්‍රකාශ කරනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි ඉල්ලුවේ ඒකයි. කතා කරන්න නෙමෙයි. වැඩක් කරන්න අපි දේශපාලනයට ආවේ. ඒක කරන්න දෙන්නේ නැත්තම් අපි මේ දේශපාලනයේ ඉඳීම එලක් නැහැයි කියන මතයේ අදටත් ඉන්නවා, හෙටටත් ඉන්නවා. ඒ නිසා ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා හැම දෙනාටම ප්‍රශ්නයක්

තියෙනවානම් ඒක සභාපතිතුමත් එක්ක විසඳගන්න. මේක කඩා කප්පල් කරන එක නෙමෙයි වැඬේ. සභාව ගෙනියන්න නොදෙන එක නෙමෙයි වැඬේ. මුදල් කමිටුවලට එන්නේ නෑ. වෙනත් කමිටුවලට එන්නේ නෑ. හැබැයි ඇවිල්ලා මෙතන විරෝධය පානවා. මේක කඩාකප්පල් කරනවා. හැබැයි අනිත් හැමදේම බලාපොරොත්තු වෙනවා. බොහොම සහයෝගයෙන් වැඩ කරමු කියන ඉල්ලීම බොහොම ගෞරවයෙන් ඉල්ලනවා බුද්ධිමත් මන්ත්‍රීවරුන්ගෙන්. නමුත් මේකට උත්තර වැඩක් නෑ මන්ත්‍රීවරුනි. ඔබතුමාගේ කතාව මොන තරම් කිවුවත් මම බලාපොරොත්තු වෙන සභාවක් නෙමෙයි කියන මතය ප්‍රකාශ කරන්න ඕන හැමදෙනාටම.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, විරෝධාකල්පයක් නෙමෙයි කතා කරන්න හදන්නේ. සභාපතිතුමනි මෙච්චරකල් සභාවල් තිබුණා. මේ ඔබතුමන්ලා අපි හැප්පුන දේවල් වලට, අපි එකට තමයි සභාපතිවරුන්ට විරුද්ධව ලියුම් අත්සන් කර ගෙන වැඩ කරේ. හැබැයි ඒක ද්වේශයෙන් නෙමෙයි කෙරේ. ප්‍රශ්නයක් තියෙනවානම් ඔබතුමාගේ පැත්තෙන් ඔබතුමාලා මතු කරලා ගන්න ඕන එකක්.

අර අමරදිවාකර මහත්තයාලගේ නිවසට යන්න තියෙන පාර පුනීලයක් වගේ තියෙන්නේ. ඒක විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා මුදල් ගෙනල්ලා තියෙනවා නමුත් හදන්න විදියක් නෑ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඔබතුමන්ලා ඉඳපු සභාවලනේ ඔහොම වුණේ. අපි එතකොට හිටියේ නෑ. ඔබතුමන්ලා තමයි සභාවේ ඒ කාලේ හිටපු මන්ත්‍රීවරු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කියන දේ අහගෙන ඉන්නවානම් හරි.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඔබතුමා හොඳටම පිළිගන්නවාද හෝළුවාගොඩ වෙලකට ලක්ෂ දහයක කොරිපස් දාන එක වටින වැඩක් කියලා. ඒක යෝජනාකරේ කවුරුහරි මන්ත්‍රීවරයෙක් නම් හෙන ගහන අපරාධයක්. එච්චරයි කියන්නේ. හෙන ගහන අපරාධයක්. ලක්ෂ දහයක කොරිපස් දානවා හෝළුවාගොඩ වෙලට. කෘෂි වේල්ලක් කියලා කියන්නේ. කවුරුහරි වගා කරන එක කුඹුරක් කියන්න පුළුවන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** වගා කරන්නේ නැත්තේ යන්න බැරි හින්දා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** කුඹුරක් හදලා දෙන්න පාර හදන්න ඉස්සෙල්ලා. ඔබතුමා රුපියල් හතලිස්දාහක් ගත්තේ නැද්ද කපිල මහත්තයාගෙන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ගත්තේ නෑ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** මම ඔප්පු කරන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** තමුන්නාන්සේට පුළුවන්නම්, තමුන්නාන්සේගේ මස්සිනාගේ ඉඳලා ගත්ත ඒවා අරගෙන එන්න මෙතන බලා ගන්න. ඒවා අරන් එන්න බලා ගන්න. ඔබතුමාට හැමතිස්සෙම ඕන අබේසේකර අල්ලගන්න. අවංක වෙලා කතා කරන්න මනුස්සයෝ. ඔබතුමා ගෙවල් හදපු ඒවා මම ගෙන්නම් කොහෙන්ද ගත්තේ කියලා ඉවර වෙලා මාත් එන්නම්. වෙන්දේසි ඉඩම් වලින් ගත්ත ඉඩම් තමයි අන්තිමට ලියාගෙන ඉවර වෙලා හදලා දැන් එනවා.

ගරු මන්ත්‍රීතුමනි, මම සභාවේ හිටිය එක ඇත්ත. ඔබතුමන්ලා දන්නවා මේ සභාවට ඒ මුදල් ගෙච්චා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා මේක තේරෙන්නේ නැද්ද?. ඔයගොල්ලොම පැහැදිලි කරලා දෙන්නකෝ. හැම එකටම කොන් කතා කරන්න අබේසේකර මන්ත්‍රීතුමා තමයි මැදිහත් වෙන්නේ. මේක කරන්න බැනේ. සභාව කරන විදිය මට කියන්නකෝ. ඕනවට වඩා ප්‍රජාතන්ත්‍රවාදය දෙන්න ගියහම මම දන්නේ නෑ. ආණ්ඩුකාරතුමා ගාව කිවුවානේ සභාව කරන් යන්නේ නෑ කියලා. මම දන්නේ නෑ මේ යන විදිය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ඔබතුමාට ඕන වෙලාවට වාඩි වෙන්නේ නෑ. අපි ප්‍රජාතන්ත්‍රවාදය හොඳට භුක්ති විඳපු මිනිස්සු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් එතුමා අදහසක් ප්‍රකාශ කරා.

(සභාව ඝෝෂාකාරී විය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ අහගන්න. මෙතුමන්ලා දැක්කද, දැන් ඒ කොරිපස් දාන්නේ අද ඊයේ ගෙනාපු යෝජනාවකට නෙමෙයි. ඒක සංවර්ධන කමිටුවේදී මම ගෙනාවේ අවුරුදු ගාණකට උඩදී. ඊට පස්සේ තමයි දැම්මේ. ඒක මට පැහැදිලි කරන්න ඕන. ඒක සභා වාර්තාවට යන්න ඕන. ඒ දාන්නේ මොකක්වත් නෙමෙයි. ඒකේ වැරදි විදියට කරනවානම් ඔබතුමන්ලා ගිහින් බලන්න ඒක. ඒක හරි විදියට දම්මවන්න. ඒක යුතුකමක්.

එතකොට ඔබතුමන්ලා දැක්කේ නැද්ද පහුගිය කාලේ ඔබතුමන්ලාගේ ඥාති පරම්පරාව ඉන්න ඉඩම් කිට්ටුවට යන්න කොරිපස් දාලා ඉවර වෙලා ගොඩ කරනවා. ඒක දැක්කේ නැද්ද?.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** කවුද ඒක කරේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම දන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ඉතිං ඔබතුමාලාගේ නායකයා කරේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මගේ නායකයා කරාද නැද්ද කියන එක මට අදාළ නෑ. ඔබතුමා බලන්න මොකක්ද වෙලා තියෙන්නේ කියලා. නායකයා කරා නම් ඒකට ඔබතුමා බලන්නේ නෑ. අබේසේකර යෝජනා කරලා කොරිපස් වැරදියට දානවා නම් ඒක බලන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ඔබතුමා හැමදේම දන්නවා. මම කිව්වේ ඒක අනවශ්‍ය පාරක් කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ අහන්න ඔබතුමා දන්නවානම්, එතන ට්‍රැක්ටරයක්වත් යන්න බෑ. අත් ට්‍රැක්ටරයක් යන්න පුළුවන් මට්ටමට දාන්න. මොකද කුඹුරු කරන්නේ නැත්තේ මොකක්වත් හින්දා නෙමෙයි. යන්න විදියක් නෑ, පාර හැදුවොත්, වතුර ටික ගන්න පුළුවන් වුනොත් මිනිස්සු කුඹුරු කරයි.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** අපි බලමුකෝ. තව අවුරුදු දෙකක් ඉන්නවානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔයිට වැඩිය මිනිස්සු කරලා අසාර්ථක වෙච්ච ඒවා තියෙනවා. තමුන්නාන්සේලා ඒකට මැදිහත් වෙලා ඒක කරන්න. දැන් තමුන්නාන්සේලා බැලුවේ නෑ නේද ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමන්ලා බැලුවද ඔබතුමන්ලා අපි හිටපු සභාවල තමයි මේවා වුණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා ඇති. චනක මන්ත්‍රීතුමාට කතා කරන්න අවස්ථාව දෙනවා. ඇති අබේසේකර මන්ත්‍රීතුමා දැන් කතා කරානේ. චනක මන්ත්‍රීතුමා කතා කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** චනක මන්ත්‍රීතුමා කතා නොකර හිටියට මොකද කරන්නේ. දැන් කතා කරානේ. ඕන තරම් අහගෙන ඉන්නම්. මේක දැන් මාර වැඩක් වෙලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මගේ ඉල්ලීමක් තියෙනවා. දැන් අවුරුද්දකට ආසන්න වෙනවා. කාසල්වත්තේ අපි කපපු කාණුවක ගල් බැම්මක් බැඳීම සම්බන්ධව. ඒකට නඩු දානවා කිව්වා. තාම මුකුත් වෙලා නෑ. දැන් අවුරුද්දකට කිට්ටුයි. දිගින් දිගටම ඇහුවා මම.

ඒ එක්කම නරාවල බෝගහ හන්දියේ අර ඉදිකිරීමක් සම්බන්ධව කතා කරා. දූරකථන කුළුණ සම්බන්ධව මම සභාවෙන් පරීක්ෂණයක් ඉල්ලුවා. එකේ ප්‍රගතිය මම ඉල්ලා සිටිනවා. ඊළඟ සභාව වෙනකම් ඉන්න ඕන නෑ. මට අතරවාරයේ දෙන්න. මම සභාවට එන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සම්බන්ධීකරණ කමිටුවේදී ඊයේ කතා කරේ නැද්ද?

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මොන ප්‍රශ්නයද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කුළුණ ගැන.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** කුළුණ ගැන සම්බන්ධීකරණ කමිටුවේදී නෙමෙයි, මම සභාවට යෝජනාවක් දැම්මනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊයේ කතා කරේ නැද්ද?

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒ ගැන කතා කරේ නෑ. ඒකට කතා කරන්න පරීක්ෂණය කරලා තත්වය දැන ගන්න එපැයි. තොරතුරු ටිකක් අරන් එපැයි සම්බන්ධීකරණ කමිටුවට යන්න.

දැන් සභාපතිතුමා අනිත් එක තමයි, සභාවේ ප්‍රගතිය ගන්නේ අන්තිමට. දිනූෂ මහත්තයා කිසිම අවස්ථාවක නෑ ප්‍රගතිය ගන්නකොට. අපිට ප්‍රශ්නයක් වුණාම විස්තරයක් ගන්න විදියක් නෑ. මම ගිය සභාවෙත් කිව්වා. දිනූෂ මහත්තයා නෑ ප්‍රගතියේ කරුණු කතා කරන කොට. එක්කෝ දුරකථනයෙන් සම්බන්ධ කරන්න ඕන අපිට කතා කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රීමික්ස් ට්‍රැක්ටරය තාප්පයක වැදිලා කැඩිලා. දිනූෂ මහත්තයා එතනට ගිහින්.

ප්‍රගති වාර්තාව ස්ථිර කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**II. ගෙවීම් අනුමැතියට ඉදිරිපත් කිරීම**

**1. පොදු ගෙවීම් ඃ-** නැත

**2. කර්මාන්ත ගෙවීම් ඃ-** නැත

**3. සේවක ණය ගෙවීම් ඃ-** නැත

**III. ඇස්තමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීම ඃ-** නැත

**IV. මිල ගණන් කැඳවීම් ඃ-** නැත

**V. ලිපි ඉදිරිපත් කිරීම ඃ-** නැත

**(ථ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා ඃ-** නැත

මීළඟ මහා සභා රැස්වීම 2019.09.24 වන අඟහරුවාදා දින පෙ.ව 09.30ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.